# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018 ජූලි 17** වන අඟහරුවාදා
2018 ஆடி 17 செவ்வாய்க் கிழமை
Tuesday 17th July 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.35 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.35 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.35 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 ජූලි මස 12 වන දින පෙ.ව. 9.00 ට යෙදුණු සුභ මොහොතින් නව සභා ශාලාව ඇතුළු නව බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය විවෘත වූ වග, ගරු මන්ත්‍රීවරුන්ට ඉතාමත් ගෞරවයෙන් දැනුම් දෙනවා. එමෙන්ම නව සභා ශාලාවේදී තවදුරටත් ලබා දිය යුතු අවශ්‍ය පහසුකම් සම්පූර්ණ වූ විගස, අපේ අලුත් සභා ශාලාව තුළ රැස්වීම් පවත්වන්නට යථා කාලයේදී අපට හැකියාව ලැබෙනවා. ඒ සඳහා අදාළ අංශ මා වෙත දැනුම් දුන් පරිදි ඔබතුමන්ලා වෙත ඒ බව දැනුම් දෙනවා."*

*ii*

*"ගරු පළාත් සභා මන්ත්‍රී මහේෂ් අල්මේදා මැතිතුමාව අද දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කරන බව කාරුණිකව දැනුම් දෙනවා."*

*"ගරු පළාත් සභා මන්ත්‍රී ඩෝල්ටන් ජානක මන්ත්‍රීතුමා සහ ගරු පළාත් සභා මන්ත්‍රී රෝහණ අබේගුණවර්ධන මැතිතුමා අද දින සිට ක්‍රියාත්මක වන පරිදි සභා කටයුතු කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් මා විසින් නම් කරන බව ගරු සභාවට දැනුම් දෙනවා."*

*iii*

*"ගරු මන්ත්‍රීවරුන් සඳහා ආහාර හා තේ පැන් සපයා ගැනීමේ පහසුකම් බස්නාහිර පළාත් සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ පිහිටි ආපන ශාලාවේ සලසා ඇති බව කාරුණිකව දැනුම් දෙනවා."*

නැවතත් මම ඒක සිහිපත් කරන්නම්. අද ගරු මන්ත්‍රීතුමන්ලාගේ උදේ ආහාරපාන හා තේ සඳහාත්, දිවා ආහාරත් අපේ නව ගොඩනැගිල්ලේ දෙවන මහලේ සූදානම් කරලා තිබෙනවා. ඉතාමත් පහසුවෙන් ගමන් කරන්න පුළුවන්. අපේ පුස්තකාලය හරහා ඇති පාලමෙන් එතැනට යන්න පුළුවන්. Lift එකෙන් බහින්න ඕනෑ නැහැ. පුස්තකලාය හරහා ඒ පාලමෙන් කෙළින්ම ආපන ශාලාවට තමයි යන්න තිබෙන්නේ.

# නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් නිවාඩු අනුමත කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# ලිපි ලේඛන පිළිගැන්වීම
PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, *"2018 පරිපූරක ඇස්තමේන්තුව 02 හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය"* මෙම සභාවට පිළිගන්වනවා. එම ලේඛනවල පිටපත් අද දිනට නියමිත න්‍යාය පත්‍රය සමඟ තැපැල් මඟින් ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්න සලස්වා තිබෙනවා. ඊට අදාළ යෝජනාවන් අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළඹුණු විටදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළඹුණු විටදී ඒ සඳහා අවස්ථාව ලබා දෙනවා.

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2018.06.28 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව සහ,

ii. 2018.07.04 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කලගෙඩිහේන, කුරුඳුවත්ත, අංක 31/9 හි පදිංචි ආර්.ඒ. කරුණාතිලක යන අයගේ පෙත්සම සහ,

ii. කැලණිය, නුංගමුගොඩ, උමගිලිය පෙදෙස, නො 378/2 එච්.පී.ජී.එස්. ගොඩකුඹුර යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්න යටතේ ඔබතුමාට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. අද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අද උදේ වුණු ප්‍රශ්නයක් ද කථා කරන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔව්. අද උදේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ගර්භය තුළ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අද උදේ ඔබතුමාගේ කාමරයේ ඉන්න කොට මම හිතන්නේ, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරිනියක් හෝ වෛද්‍යවරියක් වෙන්න පුළුවන්. අපට ගෙනැල්ලා ආරාධනා පත්‍රයක් ලබා දුන්නා. ආරාධනා පත්‍රයේ *"බස්නාහිරින් පස්*

*පව් දුරලමු.*" බස්නාහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිරින් පස් පව් දුරලමු කියන වැඩ සටහන යටතේ අපට මේකට සහභාගී වෙන්නය කියලා ආරාධනා පත්‍රයක් දීලා තිබෙනවා. මේකේ ගහලා තිබෙනවා, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බස්නාහිර පළාත කියලා. ඒ කාමරයේම සෞඛ්‍ය අමාත්‍යතුමාත් හිටියා. සෞඛ්‍ය අමාත්‍යතුමාටත් මේ නිලධාරිතුමිය ගෙනැල්ලා ආරාධනා පත්‍රය දෙනවා. එතුමිය දන්නෙත් නැහැ සෞඛ්‍ය අමාත්‍යතුමා කියලා. මොකද, ඒකට හොඳම උදාහරණය. නියෝජ්‍ය සභාපතිතුමා ඇහුවා, මේක සෞඛ්‍ය අමාත්‍යතුමාට කිව්වාද කියලා. නැහැ. අපි තවම කිව්වේ නැහැයි කියලා කිව්වා. එතුමා ඒ කාමරයේ ඉන්නවාය කියලාවත් දන්නේ නැහැ. එතකොට අපි එතුමියගෙන් ඇහුවා. බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන මේ වැඩමුළුව හරි සම්මන්ත්‍රණය හරි - වැඩමුළුවක් නම් ඒකට මුදල් වෙන් කරලා තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාවෙන්ද නැද්ද කියලා පොඩ්ඩක් කියන්න කියලා. ඒකට එතුමියට උත්තරයක් දී ගන්න බැරිව ගියා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් කරනවා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් හරි මුදල් වෙන් කරලා කරනවා නම් අඩුම ගණනේ මේකේ ආණ්ඩුකාරතුමා ඉන්නවා. ප්‍රධාන අමාත්‍යතුමා ඉන්නවා. විෂය භාර සෞඛ්‍ය අමාත්‍යවරයා ඉන්නවා. ඒ කාගේවත් නමක් සඳහන් නොකර, මේ බස්නාහිර පළාතේ මුදල් වියදම් කරලා මේ වාගේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇමතිතුමාටත් ආරාධනා පත්‍රය දෙනවා නම්, අපටත් ආරාධනා පත්‍රය දෙනවා නම් මේකේ ක්‍රියාවලිය මොකක්ද කියලා අපි එතුමාගෙන් ඇහුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා දන්නෙත් නැහැ නේ ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා දන්නෙත් නැහැ. එතුමාත් කිව්වේ, මටත් මෙහෙම වැඩක් කරනවාය කියලා කිව්වා. මම දන්නේ නැහැයි කියලා. ඉතින් අපි ඔබතුමාගේ මාර්ගයෙන් ලේකම්තුමාට මතක් කරනවා. බස්නාහිර පළාතේ මුදල් වියදම් කරලා එහෙම වැඩ මුළුවක් කරනවා නම්, අඩුම ගණනේ තනතුරු දරන විෂය භාර ඇමතිතුමාවත් දැනුවත් කරලා, එතුමාගේ නම සඳහන් කරලා - එතුමාටත් අභිමානයක් තිබෙනවා. එතුමාටත් ගරුත්වයක් තිබෙනවා. මේක එතුමා දැන ගන්න ඕනෑ. එතුමාට මේ පිළිබඳව මන්ත්‍රීවරයෙකුටවත් කියන්න දැනුවත් වෙලා නැහැ. ඒ නිසා මේ වාගේ වැඩ කිරීමේදී ඒ ගැන අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා. ඔබතුමාගේ මාර්ගයෙන් ලේකම්තුමාට අවධානය යොමු කරන්නය කියලා කියනවා. කරුණාකරලා මේක බලන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා නම් මට සභා ගර්භයේ පේන්නේ නැහැ. ඇමතිතුමා ඉන්නවා. ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. ඇමතිතුමා ඉන්නවා. එතුමා දන්නෙත් නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, මට තත්ත්පරයක් දෙනවාද? මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් උත්තරයක් දෙන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මම විනාඩියකින් මේක සොයලා බැලුවා, මොකක්ද කියලා. මේක මේ World bank project එකකින් දෙන මුදල් වගයකින් කරන්නේ කියලා මට කිව්වා. නමුත් මේකේ වැරැද්දක් තිබෙනවා කියලා මමත් පිළිගන්නවා. අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඉන්නවා. ආණ්ඩුකාරතුමා ඉන්නවා. අපේ නම් දා ගන්න නොවෙයි. මේකේ තනතුරු තිබෙනවා නේ? ඉතින් ඒක නොදාපු එකේ පොඩි වැරැද්දක් තිබෙනවා. මේක හොඳ වැඩක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ලොකු වැරැද්දක් ඒක.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒ නිසා මම ලේකම්තුමාට දැනුම් දෙනවා. තවම ඇවිල්ලා නැහැ. මේ ගැන සොයා බලන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, පොඩි වැරැද්දක් නොවෙයි මෙතැන තිබෙන්නේ. ලොකු වැරැද්දක් මේක. ලෝක බැංකු වෙන්න පුළුවන්. දේශීය මුදල් වෙන්න පුළුවන්. මොන දේ කළත් අපේ පළාත් සභාවේ ප්‍රධාන ඇමතිවරයෙක් ඉන්නවා. අපේ ආණ්ඩුකාරවරයෙක් ඉන්නවා. විෂය භාර ඇමතිවරයෙක් ඉන්නවා. අඩු වශයෙන් ඒ අයගේ ප්‍රධානත්වයෙන් මේක කරන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, දැන් රට පාලනය කරන්නේ විදේශීය බැංකු තමයි. රට පාලනය කරන්නේ, රටේ තීන්දු ගන්නේ ඔක්කොම විදේශීය බැංකු තමයි. ඒ නිසා මේක අරුමයක් නොවෙයි. රටේ පාලකයෝ නැහැ. රට පාලනය කරන්නේ විදේශීය බැංකු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා නම් සභා ගර්භයේ නැහැ. ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. මම හිතන්නේ, ඔබතුමා මේ කාරණය සම්බන්ධයෙන් පොඩ්ඩක් සොයලා බලලා, නිවැරදි කිරීමක් කළොත් හොඳයි. නැත්නම් මන්ත්‍රීවරුන්ට මේකේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා.

## ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම
QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ඒ අනුව න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. එතුමිය සභා ගර්භයේ නැහැ. ගරු ඇමතිතුමා, උත්තරය ලැහැස්තිද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

එහෙමයි ගරු සභාපතිතුමනි. පිළිතුරු සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුරු]*
*[Tabled Answer]*

***01.***

***නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/31)***

***ප්‍රශ්නය :***

*අ. 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*අ. 7352 යි.*

***ප්‍රශ්නය :***

*ආ. එයින් පළාත් පාසල්වල ළමුන් සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*ආ. 4935 යි.*

***ප්‍රශ්නය :***

*ඇ. 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් හා අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*ඇ. සමත් ළමුන් සංඛ්‍යාව - 5069 යි.*
*අසමත් ළමුන් සංඛ්‍යාව - 2283 යි.*

***ප්‍රශ්නය :***

*ඈ. 2016 ට සාපේක්ෂව 2017 වසරේ සමත්, අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?*

**පිළිතුර :**

| ඈ. | වර්ෂය | **2017** | **2016** |
|---|---|---|---|
| | සමත් ළමුන් සංඛ්‍යාව | 5069 | 4825 |
| | අසමත් ළමුන් සංඛ්‍යාව | 2283 | 2357 |

**ප්‍රශ්නය :**

ඉ. 2017 වසරේ මීගමුව අධ්‍යාපන කලාපයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය විෂය සමත්, අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

**පිළිතුර :**

ඉ. සමත් ළමුන් සංඛ්‍යාව 4650
අසමත් ළමුන් සංඛ්‍යාව 2702

**ප්‍රශ්නය :**

ඊ. 2016 වසරට වඩා මෙම වසරේ ගණිත විෂය සමත්, අසමත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

**පිළිතුර :**

| ඊ. | වර්ෂය | 2017 | 2016 |
|---|---|---|---|
| | ගණිත විෂය සමත් ළමුන් සංඛ්‍යාව | 4650 | 4230 |
| | ගණිත විෂය අසමත් ළමුන් සංඛ්‍යාව | 2702 | 2952 |

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා, පස් පවි කිව්වේ මහ ඇමතිතුමායි ඇමතිවරු හතර දෙනා ගැනද දන්නේ නැහැ. නැත්නම් මෙතැන මෙතුමාගේ නම දාන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඉවරයි දැන්. පස් පවි ඉවරයි. පස් පංගුව ගැන කිව්වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය නේ?

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. එතුමාත් සභා ගර්භයේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුරු සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**02.**

***එම්.එස්.එම්. ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :*** ***(ප්‍ර/VI(1)/18/31)***

**ප්‍රශ්නය :**

අ. රාමසාන් උපවාස මාසයේ මුස්ලිම් දේවස්ථානවලට රටඉඳි බෙදා දීමක් ඔබ අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ඉටු කරන්නේද?

**පිළිතුර :**

අ. ඔව්.

**ප්‍රශ්නය :**

ආ. එම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ කවදාද?

**පිළිතුර :**

ආ. මෙය ව්‍යාපෘතියක් නොවන අතර සංස්කෘතික වැය විෂය මගින් ආධාර ලබා දීමක් ලෙස සිදු කරනු ලබයි. සංස්කෘතික විෂය මෙම අමාත්‍යාංශය වෙත ලැබෙන විටත් අදාළ ආධාර ලබා දීම සිදු කර ඇති බව ගොනු අනුව අනාවරණය වේ.

**ප්‍රශ්නය :**

ඇ. රටඉඳි බෙදීම සඳහා වාර්ෂිකව වෙන් වූ මුදල් ප්‍රමාණයන් හා බෙදූ රටඉඳි ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

**පිළිතුර :**

ඇ. වාර්ෂිකව මුදලක් වෙන් කිරීමක් නොකරන අතර ලැබෙන ඉල්ලීම් හා පවතින ප්‍රතිපාදන මත පදනම්ව ආධාර යටතේ මෙම අමාත්‍යාංශය මගින් පහත සඳහන් පරිදි රටඉඳි බෙදා දී ඇත.

| වර්ෂය | රටඉඳි ප්‍රමාණය (කි.ග්‍රෑ) | වැය වූ මුදල (රු) |
|---|---|---|
| 2018 | 3000 | 1,033,500.00 |
| 2017 | 4500 | 1,260,000.00 |
| 2016 | 3600 | 900,000.00 |

*ප්‍රශ්නය :*

*ඈ. ඒ ඒ වර්ෂයන්හිදී රටඉඳි බෙදා දුන් දේවස්ථාන හා ඒවාට ලබා දුන් රටඉඳි ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?*

*පිළිතුර :*

| ඈ. | වර්ෂය | දේවස්ථාන ප්‍රමාණය | බෙදා දුන් ප්‍රමාණය |
|---|---|---|---|
| | 2018 | 150 | 20 Kg බැගින් |
| | 2017 | 188 | 20 Kg බැගින් |
| | 2016 | 120 | 30 Kg බැගින් |

*ප්‍රශ්නය :*

*ඉ. රටඉඳි බෙදීමේදී මුස්ලිම් දේවස්ථාන තෝරා ගැනීම සිදු කරනු ලබන ක්‍රමවේදය කුමක්ද?*

*පිළිතුර :*

*ඉ. ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි යොමු කරන දේවස්ථාන ලැයිස්තු වෙත රටඉඳි සංස්කෘතික ආධාර විෂය යටතේ බෙදා දීම සිදු කරනු ලැබේ.*

*ප්‍රශ්නය :*

*ඊ. එම ව්‍යාපෘතිය සඳහා රටඉඳි මිලදී ගනු ලබන ක්‍රමවේදය හා ඒ ඒ වර්ෂයන් හිදීමිලදී ගනු ලැබූ ආයතන කවරේද?*

*පිළිතුර :*

*ඊ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ විවෘත වෙළඳපොල මිල ගණන් කැඳවීම මගින්.*

*2018 - ලංකා ස.තො.ස.*

*2017 – Kanddy Trade Center (Pvt) ltd.*

*2016 – Kanddy Trade Center (Pvt) ltd.*

*ප්‍රශ්නය :*

*උ. අදාළ රටඉඳි නියමිත ලෙස අදාළ දේවස්ථානවලට ලැබුණු බවට වන පසුවිපරම් සහතිකය කුමක්ද?*

*පිළිතුර :*

*උ. බෙදා දීම පවරන ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් භාර ගත් බවට ලිපියක් ලබා ගන්නා අතර, රටඉඳි බෙදා දෙන විට අදාළ දේවස්ථානයේ බලයලත් අයෙකුගෙන් රටඉඳි භාරගත් බවට හැඳුනුම්පත් අංකය සමඟ අත්සන ලබා ගැනීම.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 03 යටතේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, දැන් මෙතුමා සති දෙකක කාලයක් ඉල්ලනවා. මේ සභාවේ මේ ප්‍රශ්නය හතර සැරයක් ඇහුවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා දෙපාරක් ඇහුවා. මීට ඉස්සෙල්ලා මම මේ සභාවේ ප්‍රකාශයක් කළා. මේ තනතුරු සම්බන්ධව. දැන් වැඩ බලන තනතුරුවලට දාලා පඩි ගෙවනවා ඩබල්. අර ඉන්න නීත්‍යානුකූල නිලධාරීන් ඒකට පත් නොකර ඒගොල්ලන්ව අපහසුතාවයට පත් කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙතුමාගේ කාලයේත් කෙරුවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ ප්‍රශ්නයටම කලින් උත්තර දුන්නා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. පසුගිය සභා වාරවලට මම පැමිණීමේදීත්, විශේෂයෙන්ම අද දිනයේ පැමිණීමේදීත් මේ අපහසුතාවයට මම මුහුණ දෙනවා. ඒ මුහුණ දෙන්නේම යතුරු පැදියකින් මේ සභාවට එන මන්ත්‍රීවරයෙක් විධියටත්, ඒ වාගේම අනෙක් මන්ත්‍රීවරුත් මේ සම්බන්ධව මේ ගැටළුවට මුහුණ දෙනවා. පසුගිය කාල පරිච්ඡේදය තුළ මම සභාවට පැමිණීමේදී මගේ යතුරු පැදිය නැවැත්වීම සඳහා නිශ්චිත ස්ථානයක් නොමැති වීම නිසා එතැන ඉන්න නිලධාරීන් දිගින් දිගටම අතනට ගන්න, මෙතැනට ගන්න කියනවා. බොහෝ විට ඇවිල්ලා නැවැත්තුවාට පස්සේ මම යන කොට තිබෙන්නේ, තිබුණු තැන නොවෙයි. අදත් ඒ තත්ත්වය තිබෙනවා. අදත් යතුරු පැදිය ඇතුළට ගන්න එහෙම පහසුකමක් සකසලා නැහැ. ඒ නිසා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පර්මිට් එක අරගෙන දෙන්න. මේ ප්‍රශ්න ඔක්කොම ඉවරයි. පර්මිට් එක අරන් දෙන්න. නිකම් කට පියාගෙන ඉන්න එපා කට්ටියම.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරන කාරණය යම් විධියකින් -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ලොක්කෝ ගෙනැල්ලා රැස්වීම් තියලා, උත්සව තියලා විතරක් හරියන්නේ නැහැ. පර්මිට් එක අරගෙන දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය ඝෝෂා කිරීම් කරන්න එපා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරන කාරණය තමයි, යම් විධියකින් බොහෝ රටවල්වල විශේෂ වරප්‍රසාද ලබා දෙනවා. හේතුව, කාබන් ප්‍රමාණය අඩුයි. ඒ වාගේම පරිසර දූෂණය අඩු කරමින් අපි ඒ විධියට කටයුතු කළත් අනික් මන්ත්‍රීවරුන්ට ලැබෙන වරප්‍රසාදය යතුරු පැදියකින් එන මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ නැහැ. ඒ වාහනයට නිශ්චිත ඉඩක් ලබා දෙන්නේ නැහැ. නතර කළ යුතු තැනක් ලබා දීලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලබා දෙනවා අපි ඒක.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරනවා. අපේ වාහනයටත් ඉඩක් ගන්නවා. අඩි තුනක් හරි හතරක් හරි නිශ්චිතව වෙන් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යතුරු පැදියට නිශ්චිත ස්ථානයක් අපි ලබා දෙනවා. අද ඉඳලා අනිවාර්යයෙන් වෙන් කරලා තිබෙනවා. අපේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) රණසිංහ මහතා සභා ගර්භයේ ඉන්නවා. ඔබතුමා අවධානය යොමු කරන්න. එතුමාගේ යතුරු පැදිය නැවැත්වීම සඳහා අද දින සිට නිශ්චිත ස්ථානයක් වෙන් කරලා දෙන්න.

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 04.

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/36)**

අ. 1999 සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව මහරගම නගර සභාවේ තොග ශේෂය හා භෞතික තොග ශේෂය අතර වෙනස හා ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂ හා භෞතිකව පවතින වත්කම්වල අගයන් අතර වෙනස සම්බන්ධව විමර්ශනයක් කර ඇති බව දන්නේද?

ආ. විමර්ශන වාර්තාවේ (i) අංක 06 යටතේ නිගමනවල 6.1 (iii) ට අනුව ලෙජරයේ ගිණුම් තැබීම අතහැර දැමීමට තීරණය කර ඇති නිලධාරියා වංචා, දූෂණ, අක්‍රමිකතා ක්‍රියාවලියකට ඉඩ සැලසීමේ අදහසින් එකී තීරණය ගෙන ඇති බවද,

(ii) 6.1 (ix) ට අනුව එකී කාලය තුළ ධූරයක් දැරූ සභාපතිවරයා, සභාපතිවරිය දීර්ඝ කාලයක් තුළ ඒ පිළිබඳව නොලසකා හැරීමෙන් තම වගකීම පැහැර හැර ඇති බවද සඳහන් වන බව දන්නේද?

ඇ. සොයා ගත හැකි ලිපි ලේඛනවලට අනුව රුපියල් ලක්ෂ 400 ක මුදලක්, වංචා අක්‍රමිකතාවලට අනුව මහරගම ජනතාවට අහිමි වී ඇති බවත්, පරිත්‍යාග, ත්‍යාග ලෙස ලැබී ඇති දේවල වටිනාකම අනුව මෙම අක්‍රමිකතාවල මූල්‍ය අගය තවත් ඉහළ බවත් පිළිගන්නේද?

ඈ. පළාත් පාලන ආයතන අධීක්ෂණයට ඇති බලතල අනුව මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. නැත. විමර්ශන වාර්තාවේ සඳහන් සොයා ගත හැකි ලිපි ලේඛන අනුව රුපියල් ලක්ෂ හාරසීයකට (රු. 40,000,000.00) ආසන්නව වෙනස් වූ මුදලට අදාළ වී ඇත්තේ පොදු ගබඩා (පාරිභෝගික භාණ්ඩ) වටිනාකම් වන අතර, ස්ථාවර වත්කම් මේ තුළ ඇතුළත් වී නොමැත. නගර සභාවට පරිත්‍යාග හා ත්‍යාග වශයෙන් ලැබෙන භාණ්ඩ වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ඇතුළත් කර ඇත.

ඈ. අදාළ වාර්තාව මේ වන විට ගිණුම් කාරක සභාව ඉදිරියේද විමසුමට ලක් වන තත්ත්වය යටතේ එමගින් ලැබෙන නියෝග ද සැලකිල්ලට ගනිමින් ඉදිරියේදී ඊට අදාළව ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කරමි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය. ඔබතුමා උත්තරය දෙනවා 'නැත' කියලා. එතැනදී නැත කියලා කියන ගමන්ම මේකේම සඳහන් වෙනවා, විමර්ශන වාර්තාවේ සඳහන් සොයා ගත හැකි ලිපි ලේඛන අනුව කියලා. ඒ කියන්නේ මගේ ළඟ තිබෙනවා ගරු සභාපතිතුමනි, විමර්ශන වාර්තාව. මේ විමර්ශන වාර්තාවේ කියනවා මේ දැනට සොයා ගන්න පුළුවන් ලිපි ලේඛන අනුව තමයි මේ ප්‍රමාණය වෙන්නේ. සොයා ගන්න බැරි ලිපි ලේඛන අනුව මේ මුදල මීට වඩා වැඩි වෙයි කියලා. එතකොට ඔබතුමා කොහොමද මේකට නැත කියලා උත්තර දෙන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට ලැබිලා තිබෙන උත්තරය අනුව තමයි මම ඒ ප්‍රකාශය කළේ. මම හිතන්නේ, ඊට වඩා උත්තරයක් නම් දෙන්න විධියක් නැහැ. කොහොමත් දැන් මේ පසුබිම් වාර්තාවේ තිබෙන්නේ, ඉදිරියේදී ගිණුම් කාරක සභාව මෙම වාර්තාවේ කරුණු අධ්‍යයනය කොට ලබා දෙන නියෝග පරිදි ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ කියන එක තමයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ වාගේම ඔබතුමාගෙන් අහන්න තිබෙනවා. දැන් මේ විමර්ශනය කරපු වාර්තාවට අනුව රුපියල් ලක්ෂ දෙකක්

ගෙවන්න තිබෙනවා. මේ අදාළ නිලධාරියාට. දැන් එතකොට ඒ නිලධාරියාට ගෙවන්නෙත් මේ නගර සභාවෙන්ම තමයි. මේ අයගෙන්ම තමයි. ඒ වාගේම මේකෙ ඇතුළේ එතුමා අන්තිමට නිර්දේශයක් දෙනවා, දැන් මේ පරණ ඒවා සොයා ගන්න බැරි වන නිසා මේවා පැත්තකට දානවාද? ඉතින් ඔබතුමාගේ විෂය සම්බන්ධව නිසා යුතුකමක් තිබෙනවා, මේකට නිසි ක්‍රියාමාර්ගයක් ගන්න. ඒ නිසා තමයි මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය ඇහුවේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේකේ පරීක්ෂණයට බාධාවක් වෙන්නේ නැහැ. මොකද, ගිණුම් කාරක සභාවේ විමර්ශනය වෙන නිසා මෙතුමාගේ අදහසට සාධාරණයක් ඉෂ්ට වෙනවා. ඒ ගැන කිසි අපැහැදිලිකමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 05 යටතේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න -** අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති 02 ක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මීට කලින් සභා වාරයකදීත්, ගිය සභා වාරයේත් සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් මමත් කරුණු ඉදිරිපත් කළා, බැංකුවලින් අපට, මන්ත්‍රීවරුන්ට ණය දෙන්නේ නැති එක සම්බන්ධයෙන්. අපට Bank OD එකක් දෙන්නේ නැති එක සම්බන්ධව ඔබතුමාගෙන් අපි ඉල්ලීමක් කළා. බැංකුවේ සභාපතිවරයාට හෝ Treasury යට ලියලා මේ ගැන අපට උත්තරයක් දෙන්නය කියලා. ඔබතුමා මේ වන කොට මේ සම්බන්ධව අරන් තිබෙන පියවර කුමක්ද? ඔබතුමා අපේ සභාපතිතුමා. අපේ 104 දෙනාටම බැංකු එක්ක ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට අපි ගියවර කිව්වා, මේකට අදාළ මුදල් අමාත්‍යාංශයේ මුදල් ඇමතිවරයාට, එහෙම නැත්නම් මහා භාණ්ඩාගරයේ භාණ්ඩාගාර ලේකම්ට එහෙම නැත්නම් ඒ බැංකුවල ඉන්න සභාපතිවරුන්ට මේ කාරණා පැහැදිලි කරන්න. එහෙම අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. දැන් බලන්න. මම අහලා මාස තුනක් වෙනවා. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ගිය සභා වාරයේ ඇහුවේ. සති දෙකක් වෙනවා. දැන් සභාපති හැටියට ඔබතුමාට තිබෙනවා නේ වගකීමක්. මෙවැනි කරුණක් සම්බන්ධව සොයා බලා දැනුවත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා. සභාපතිතුමා වශයෙන් මට බලයක් නැහැ බැංකුවලට -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමාගේ ලේකම්තුමා හරහා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒ සම්බන්ධයෙන් ඒ අයට අභියෝග කරන්න බැහැ. නමුත් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා. මේ කාරණා සම්බන්ධයෙන් අපි අනිවාර්යයෙන් මුදල් අමාත්‍යාංශය දැනුවත් කළා. ඒ සිද්ධියෙන් පස්සේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ බලන්න පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට දෙන වරප්‍රසාද. මම ඒකත් ගෙනාවා. මට මේක දැන් කියවන්න බැහැ. පිටපතක් ලබා දෙන්නම්. මේක study කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න. කියවන්න ගියොත් වෙලාව යනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ විසිත්‍ර ගොඩක් තිබෙනවා. මම ගෙනාවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙන ඔක්කොම වරප්‍රසාද. නියෝජ්‍ය ඇමතිවරුන්ට, රාජ්‍ය ඇමතිවරුන්ට දෙන වරප්‍රසාද සම්බන්ධව. එතකොට අපට -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කියවන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බලන්න. පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු දීමනා. රුපියල් 54,000 ක්. හරිද? ඊට පස්සේ ණය සම්බන්ධව මේකේ තිබෙනවා. ඕනෑම බැංකුවකින් මේගොල්ලන්ට ණය ගැනීමේ අයිතිය තිබෙනවා. ඒ සභාවේ ඉන්න කථානායකවරයාගේ නිර්දේශ මත ගන්න පුළුවන්. (බාධා කිරීමක්) එතකොට අපට තිබෙන්නේ මොකක්ද? ඔබතුමා තමයි අපේ කථානායක. මම මේ ඔක්කොම කියවන්න ගියොත් වෙලාව යන නිසා මම මේක කියවන්න යන්නේ නැහැ. වෙලාවක් අරන් අපට දෙන්න. වෙලාවක අපි මේක ඔබතුමාට පැහැදිලි කරලා දෙන්නම්. එතකොට ඔබතුමා අපේ කථානායක. එතකොට ඔබතුමාට වගකීමක් තිබෙනවා. පක්ෂ භේදයෙන් තොරව අපි 104 දෙනාටම මේ සම්බන්ධව ගැටළුවක් තිබෙනවා. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. මේක මන්ත්‍රීවරයෙකුට බැංකුවකින් ලැබිය යුතු අයිතියක්. අපි බැංකුවේ ගනුදෙනුකරුවෝ. අපේ සල්ලිවලින් තමයි ඒගොල්ලන්ගේ පඩි ගෙවන්නේ. අපේ චෙක් එකක් මාරු කළාම, බැංකුවක deposit එකක් දැම්මාම, අපේ පඩියෙන් ඒගොල්ලෝ ගාණක් කපා ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන පැහැදිලියි. ඒ ගැන අපි භාණ්ඩාගාරය දැනුවත් කරලා තිබෙනවා. ඔබතුමා ඕක සභාගත කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අනිවාර්යයෙන් ඔබතුමා මේක ලියලා මේ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

භාණ්ඩාගාරයෙන් පිළිතුරක් ආපු ගමන් අපි ඔබතුමාව දැනුවත් කරන්නම්. මීළඟට පෞද්ගලික ප්‍රකාශ යටතේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම ප්‍රකාශයක් කරන්න ඉල්ලුවේ අද වර්තමාන ආණ්ඩුව විසින් මේ මාස දෙකක් ඇතුළත තෙල් මිල සංශෝධනය කිරීම ගැන අද මහජනතාවට විශාල ගැටළුවක් පීඩාකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද ඉපදෙන පොඩි දරුවාගේ ඉඳලා ආච්චි, සීයා, මුත්තා දක්වා මේ බලපෑම අද අපට ඇති වෙලා තිබෙනවා. එතකොට රාජ්‍ය සේවයේ වැඩ කරන අයට, පෞද්ගලික සේවයේ අයට, ඒ වාගේම අපේ පාරිභෝගික ප්‍රජාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශයේ ඔහොම නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කුණු හරුප කියනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ලැජ්ජා නැතිව නිශ්ශබ්දව අහගෙන ඉන්න කෝ? ඔබතුමන්ලාට ලැජ්ජාවක් තිබෙනවාද? ඕගොල්ලෝ මේ ආණ්ඩුවේ. අහගෙන ඉන්න පොඩ්ඩක්. ඔබතුමන්ලාටත් සහනයක් දෙන්න කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. ඔබතුමා මට ඉදිරිපත් කරපු කාරණාව ගැන කථා කරන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, දැන් බලන්න මේ තෙල් මිල සම්බන්ධව 2017 - මෙන්න විස්තරේ. හරිද? දැන් මේ රටේ ඇති වෙලා තිබෙන ඉන්ධන අර්බුදය සම්බන්ධව. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 මැයි 19 වන දින මධ්‍යම රාත්‍රියේ සිට ලංකා ඛණිජ තෙල් සංස්ථාව ඉන්ධන මිල වැඩි කරන ලද්දේය. නමුත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, නැවත කැබිනට් මණ්ඩලයට ගෙනැල්ලා මේක අඩු කරලා, මේක වැඩි කරන්න එපාය කියලා ගෙනැල්ලා කැබිනට් මණ්ඩලයේදී නැවත වැඩි කළා. දැන් වැඩි කරලා අද බලන්න. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ. හරිද? ඔක්ටේන් 92 වර්ගයේ පෙට්‍රල් ලීටරයක මිල 117 යි. අද 137 යි. අද රුපියල් 20 කින් වැඩි වෙලා තිබෙනවා. එතකොට ඔක්ටේන් 95 වර්ගයේ පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 128 යි. අද 148 යි. ඔක්ටේන් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බොරු කියන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

2015 ජනවාරි 08 වැනිදාට වැඩිය තවමත් අඩුයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අහගෙන ඉන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැරදියි. වැරදි සංඛ්‍යා ලේඛන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොකද, ඔබතුමාට අමාරුවක් තිබෙනවාද? ඔයත් ගහන්නේ මේ පෙට්‍රල්, ඩීසල්ම තමයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභාව නොමග යවන්න එපා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

අහගෙන ඉන්න පුළුවන්, හරි ඒවා කියනවා නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අහගෙන ඉන්න. ඒ අනුව ඛණිජ තෙල් අමාත්‍ය අර්ජුන රණතුංග මහත්තයා මේ පෙට්‍රල්, ඩීසල් මිල අඩු කළා. ඊට පස්සේ දැන් මේ වන කොට - හරිද? 137 කට තිබුණු ලීටරයක් 145 දක්වා (බාධා කිරීම්)

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දන්ත වෛද්‍යවරයෙකුගේ සහාය අරන් දෙන්න. දත් කුට්ටමක් දා ගන්න. දන්ත වෛද්‍යවරයෙකුගේ. පැහැදිලි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. බාධා කිරීම් කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ වාහනවලට, ජීප්වලට ඔක්කොම ගහන්නේ සුපර් ඩීසල්. අපේ මන්ත්‍රීවරු. ඒක වැඩි වෙලා තිබෙනවා, රුපියල් දහයකින්. සුපර් ඩීසල් ලීටරයක් රු. 119 සිට 129 ක් වෙලා. එතකොට රුපියල් දහයකින් - (බාධා කිරීම්)

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා, මේ මිල දර්ශක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද අපේ පළාත් සභාවේ විපක්ෂය මේ අයගේ ආණ්ඩුව. මේ අයගේ ආණ්ඩුව මේ වන කොට රට සම්පූර්ණ අස්ථාවර තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ. මේ වන කොට කුඩු ගේන්නේ සතොසේ තිබෙන (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මාතෘකාවෙන් පිට යන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කුඩු ගෙනාපු එක්කෙනාව තමයි ෆ්ලයිට් එකේ ගිහිල්ලා බදා ගත්තේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ජනාධිපතිතුමා ගිහිල්ලා බදා ගත්තා නේ කුඩු ගෙනාපු එක්කෙනාව. මීගමුවේදී.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට ලියලා දීපු එක කියන්න. මාතෘකාවෙන් පිට යනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ අනුව දැන් 2011 -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා මොකක් හරි කාරණයක් පැහැදිලි කරනවා. ඒක අපට හොඳින් ඇහුම්කන් දීමේ ඕනෑකම තිබෙනවා. ඒක ඇහෙන්නේ නැහැ. එක්කෝ මාධ්‍යයේ වැරැද්දක්. එක්කෝ මෙකේ වැරැද්දක්. එක්කෝ දත් කුට්ටමේ වැරැද්දක්. ඒ නිසා දන්ත වෛද්‍යවරයෙකුගේ සහාය ලබා දීලා ඒ හඬ නියමාකාරයෙන් උච්චාරණය කරවන්න. මොකද, අපට ඇහෙන්නේ නැහැ මේ මොකක්ද කියන්නේ කියලා. පැහැදිලි නැහැ. චොක් චොක් ගාන සද්දයක් ඇහෙනවා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඒවා හදන්න බැහැ. උත්පත්තියෙන් එන ඒවාට මම මොකද කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙයාට ඔලුවේ අමාරුවක්. ඒ නිසා මෙයාව යවන්න ඕනෑ අංගොඩ. ඒ කියන්නේ, මෙයාට උසාවියේ නඩුවලට පෙනී සිටිනවා වාගේ මේකේ හැසිරෙන්න බැහැ. ඒ නිසා මෙයා උසාවියේ පොඩි දූප්පත් මිනිහාගේ නඩුවලට කථා කරලා රුපියල් පන් දාහක් දුන්නාම, දහ දාහක් දීපන් කියලාමංකොල්ල කන මිනිස්සු. මේ වාගේ ලෝයර්ස්ලා. එතකොට කසිප්පුකාරයාගේ නඩුවට පෙනී සිටින කොට රුපියල් දාහක් දුන්නාම පන් දාහක් ඉල්ලනවා. සූරාගෙන කන මිනිස්සු මේගොල්ලෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ගන්න එපා. ඔබතුමා මට දීපු ටික කියන්න. විවාදවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යහපාලනයට කත් ඇද්දා නම් අහන්නත් පුරුදු වෙන්න යහපාලනය කරන වැරදි සම්බන්ධව. ඒ ගැන පුරුදු වෙන්න ඉස්සෙල්ලා. ඒකයි කියන්නේ. (බාධා කිරීම්) මීට වසර 10 කට ඉස්සෙල්ලා 2008 දී අද පවතින මිලට වඩා බෙහෙවින් ඉහළ යමින් තිබුණු ඇමරිකානු ඩොලරය. 97 කට තෙල් බැරලයක් අපි ගත්තේ. අද තෙල් බැරලයක් කීයද කියලා බලන්න. අද මේ වන කොට තෙල් බැරලයක් රුපියල් - ඇමරිකානු ඩොලර් 74 කට අඩු වෙලා තිබෙනවා. එතකොට මේ 74 ට අඩු වෙලා තිබෙන ඩොලරයත්, තෙල් බැලරයත් අරගෙන අපට මේ විධියට තෙල් මිල වැඩි කිරීම තුළ තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට කරදර කරන්න එපා. මේ සභාවට කරදර කරන්න එපා. ඔබතුමා මට ඉදිරිපත් කරපු ප්‍රකාශයේ ඔය මොකුත් නැහැ. ඔබතුමා මේ වල් පල් කියන්නේ. මට ඔබතුමාට ඉඩ දෙන්න බැහැ. වහාම කථාව නවත්වන්න. ඔබතුමාගේ ප්‍රකාශය නවත්වන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ අය දැන් කථා කරලා මේ කෑ ගහන මන්ත්‍රීවරු හිත යටින් බනිනවා. ඩීසල් ටික ගහ ගන්න, පෙට්‍රල් ටික ගහ ගන්න. මේක තමයි ඇත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අදාළ රීති අනුව කථා කරන්න. කරුණාකර ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා අපි ඉල්ලන්නේ, බස්නාහිර පළාත් සභාවේ මහින්ද රාජපක්ෂ ඒකාබද්ධ විපක්ෂය, පොහොට්ටුවේ මිනිස්සු හැටියට අපි ඉල්ලන්නේ, ආණ්ඩුවට අපි බල කරනවා මේ තෙල් මිල පහළට දාලා, ජීවන වියදම අඩු කරන්න කටයුතු කරන්නය කියලා ඉල්ලමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා හරිම පැහැදිලිව මට දීලා තිබෙනවා ප්‍රකාශය. මේ වාගේ තමයි බලාපොරොත්තු වෙන්නේ ප්‍රකාශයක්. නැත්නම් මේ වාගේ වල් පල් කථා කිරීම නොවෙයි බලාපොරොත්තු වෙන්නේ සභාවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. 1987, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පිහිටුවනු ලැබූ පළාත් සභා ක්‍රමය තුළ අපි දන්නවා පළාත් පාලන විෂය සම්පූර්ණයෙන්ම පළාත් සභාව සතු එකක්. මෙම සංශෝධනයට අනුව ප්‍රාදේශීය සභා පනතින් අපේ රටේ ප්‍රාදේශීය සභා ස්ථාපිත කෙරුණා. එහිදී ප්‍රාදේශීය සභාවල ලේකම් නමින් තනතුරක් හඳුන්වා දෙනු ලැබුවා. එය සිදු කළේ, 1993 පෙබරවාරි 24 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව. අවශ්‍ය නම් ගරු සභාපතිතුමනි, මට ඒ අමාත්‍ය මණ්ඩල තීරණය සභාගත කරන්න පුළුවන්. එහිදී ප්‍රාදේශීය සභාවල ලේකම්වරුන් ලෙස පත් කෙරුනේ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන්. ඒ කියන්නේ, Supra level එකේ නිලධාරීන්. වර්තමානයේ එම ධූරයට පත් කෙරෙන්නේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන්. මේ නිලධාරීන් නිකම් නොවෙයි ගරු සභාපතිතුමනි පත් කරන්නේ. ඔවුන් අධි පන්තියට පත් වන්නේ උපාධි සුදුසුකම ද ඇතුළුව සේවා කාලය මත පදනම්ව ඉතාමත් අසීරු - අපි දන්නවා, සීමිත හා කුසලතා සොයා බලන තරඟ විභාගයක ඉහළම ප්‍රතිඵල මත පවතින සීමිත පුරප්පාඩු සැලකිල්ලට අරගෙන තමයි පත්වීම් කරන්නේ.

ඔවුන් පළාත් පාලනය සම්බන්ධයෙන් විෂයානුබද්ද දැනුම අතින් පෝෂිතයි. ඒ වාගේම ඔවුන්ගේ පළපුරුද්ද හා අත්දැකීම් අති විශාලයි. එහෙම පරිපූර්ණ පිරිසක් තමයි මේ ප්‍රාදේශීය සභාවල ලේකම්වරු විධියට පත් කරන්නේ. පළාත් ප්‍රධාන ලේකම්වරුන් 2013 වසරේදී ප්‍රධාන අමාත්‍ය සමුළුව හරහා පළාත් පාලන ලේකම් සේවයක් ඇති කිරීමට යෝජනාවලියක් ඉදිරිපත් කළා. ගරු සභාපතිතුනි, එය පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ යෝජනාවක් ලෙස එදා කැබිනට් එකටත් ඉදිරිපත් කෙරුණා. මහ ආණ්ඩුවේ කැබිනට් එකට. එම යෝජනාවට සමස්ත කළමනාකරණ සහකාර සේවා වෘත්තීය සමිති 10 ක් හා සමස්ත ලංකා පරිපාලන නිලධාරීන්ගේ සංගමය විරුද්ධ වුණා. ඒ විරෝධතාවත් මා සතුව තිබෙනවා. ඊට හේතුව, ප්‍රාදේශීය සභා ලේකම් තනතුරු සේවා ව්‍යවස්ථාවෙන්ම අධි පන්තියේ පරිපාලන නිලධාරීන් සඳහා හිමි උප ලේඛනගත කරන ලද තනතුරක් වුණා. ඒක තමයි ඒගොල්ලෝ විරුද්ධ වුණේ. ඒ නිසා මේගොල්ලන්ට ඒ අදාළ නිසි අණ පනත්වලින් මේ තනතුර හිමියි කියලා නම් කරලා තිබුණා. දිවයින පුරා මෙවැනි නිලධාරීන් 70,000 ක් විතර ඉන්නවා, ගරු සභාපතිතුමනි. කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට රැකියා උසස් වීමට ඇති එකම හිමිකම අහිමි

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

වන නිසා තමයි එදා ඔවුන් මේ කැබිනට් යෝජනාවට විරුද්ධ වුණේ.

දිවයින පුරා විසිරී සිටින මෙම පිරිස එදා කළ ඉල්ලීම අතිශය මානුෂික හා සාධාරණ එකක් කියලා මේ ලිපි ලේඛන ඔවුන්ගේ විරෝධතා පරිශීලනය කළාම ගරු සභාපතිතුමනි, පෙනී යනවා. එදා කැබිනට් මණ්ඩලය ඒක ප්‍රතික්ෂේප කළා. ප්‍රතික්ෂේප කළා විතරක් නොවෙයි. කැබිනට් මණ්ඩලයේ එදා යමක් ප්‍රකාශ වුණා. මොක්කද ඒකේ තිබුණේ. කැබිනට් මණ්ඩලය සඳහන් කරනවා, ප්‍රාදේශීය සභා ලේකම් තනතුරු සඳහා කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ පරිපාලන නිලධාරීන් පත් කිරීමට දැනට ප්‍රමාද වී ඇති තරඟ විභාග කඩිනමින් පවත්වා පවතින පුරප්පාඩුවලට සුදුසු නිලධාරීන් පත් කළ යුතු බවත්, ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනයට අවශ්‍ය පුහුණුව ද ලබා දිය යුතු බවත්. මේ දෙක තමයි කැබිනට් මණ්ඩලයෙන් එළියට එන්නේ.

ගරු සභාපතිතුමනි, ගෙවී ගිය කාලය තුළ තරඟ විභාග නිසි ලෙස පැවැත්වුවේ නැහැ. එදා ඒ කැබිනට් ඉල්ලීම ක්‍රියාත්මක වුණේ නැහැ. මේ අසමත්කම කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ නොවෙයි. මේ අසමත්කම බලධාරීන්ගේ හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ. කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්ගේ ප්‍රශ්නයක් හෝ ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගේ ප්‍රශ්නයක් විධියට අපට මේක කිසිම විධියකින් දකින්න බැහැ. කරුණු මෙසේ තිබියදී මේ අර පරණ ප්‍රශ්නය, එහෙම නැත්නම් මේ පරණ අවශ්‍යතාව යළිත් වරක් කැබිනට් යෝජනාවක් විධියට 2018 මාර්තු 27 වැනිදා, පසුගිය මාර්තු 27 වැනිදා කරළියට එනවා. මම හිතනවා, බොහෝ දෙනෙක් මේක දන්නේ නැතිව ඇති. මේකේ දේශපාලන අරමුණ හෙළි කරන්න මට මෙතැනදී අවශ්‍ය නැහැ. ඒක විෂය භාර ඇමතිවරයායි ඒ ඇමතිවරයාගේ ලේකම්වරයායි හොඳින් දන්න බව නම් මම දන්නවා. ප්‍රධාන අමාත්‍යවරුන් මේ සම්බන්ධයෙන් අද දරන මතය මම දන්නේ නැහැ. අපේ ගරු මහ ඇමතිතුමා මේක ගැන දරන මතය මම දන්නේ නැහැ. හැබැයි, එතුමාගේ අවධානය යොමු විය යුතුම කාරණයක් කියලා මම විශ්වාස කරනවා. මොකද, මේක ආපසු හරවන්න පුළුවන් පළමුවැනි පියවර තියන්න පුළුවන්. බස්නාහිර පළාතේ ප්‍රධාන ඇමතිවරයාටයි කියලා මම විශ්වාස කරනවා. එතුමා මම හිතන්නේ, මේ ගැන අවබෝධයෙන් කටයුතු කරයි. හැබැයි, මේ වෙලාවේදී එතුමාගේ තීරණය මොකක්ද කියලා මට දැන ගන්න අවශ්‍ය නැහැ. හැබැයි, කළමනාකරණ සහකාර සේවයේ සියලු නිලධාරීන් එදා මෙන්ම අදත් මේ කැබිනට් යෝජනාවට විරෝධය පළ කරලා තිබෙනවා. ඔවුන් මා වෙත ඊයේ ලිපියක් යොමු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ ලිපියේ සවිස්තරව දැක්වෙනවා මේකේ තිබෙන අසාධාරණය පිළිබඳව. මම යළිත් කියනවා. ඔවුන්ගේ විරෝධය අතිශය සාධාරණයි කියලා.

2018 මාර්තු 27 වැනිදා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කොට අනුමත කළ යෝජනා පිළිබඳව දන්වමින් 2018 අප්‍රේල් 04 වැනිදා අමාත්‍ය මණ්ඩල ලේකම් එස්. අබේසිංහ මහතා, ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් හා පළාත් සභා වෙත සංදේශයක් එවනවා. ඒ සංදේශය තමයි ගරු සභාපතිතුමනි, මේ තිබෙන්නේ. සියලු පළාත් සභාවලට යවලා තිබෙනවා. හැබැයි, මේක මම ගත්තේ අපේ බස්නාහිර පළාත් සභාවෙන් නොවෙයි. වෙනත් පළාත් සභාවකින් මේක ගෙන්වා ගත්තේ. හැබැයි, මේක සියලු පළාත් සභාවටල ඇරපු බව මම දන්නවා. ගරු සභාපතිතුමනි, ඒකේ කරුණුවලට අනුව කළමනාකරණ සහකාර සේවා සංගම් විරෝධය පළ කරනවා. ඒකට සාධාරණ හේතුවක් තිබෙනවා. මොකද, 70,000 ක් පමණ වන කළමනාකරණ සහකාර සේවය මේකෙන් හැල්ලුවට පත් වෙන බව පේනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන්ට උසස් වීම් ලබා ගැනීමට ඇති එකම අවස්ථාවත් අහිමි කෙරෙනවා. ප්‍රාදේශීය සභා ලේකම් තනතුර මින් ඉදිරියට කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන්ට අහිමි වෙනවා. ඒ කියන්නේ මේ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට තව යන්න තැනක් නැහැ. යන්න තිබෙන තැන් සියල්ල අහිමි කරනවා. එසේ අහිමි වෙනවා විතරක් නොවෙයි. එම තනතුරුවලට ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් පත් කිරීමටයි සූදානම් වෙන්නේ. කවර අරමුණකින්ද? කාගේ උවමනාවටද? කියලා මෙතැන සාධාරණ ප්‍රශ්නයක් ගොඩ නැගෙනවා ගරු සභාපතිතුමනි. අධි පන්තියේ නිලධාරීන් හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් අතර වෙනසක් පරතරයක් නැතැයි රජය අවස්ථා ගණනාවකදී පිළි අරගෙන තිබෙනවා. ඒ කියන්නේ, මේ ප්‍රාදේශීය සභාවල ලේකම් හැටියට පත් වෙන අයත් පරිපාලන සේවයෙන් මේ පත් කරන්න හදන අයත් අතර වෙනසක් තිබෙන්න බැහැ.

වෙනසක් නැති බව පිළිගන්න කාරණය මම කියන්නම්. මොකක්ද? මේ තිබෙන්නේ 2016 පෙබරවාරි 28 වැනිදා ඉදිරිපත් කෙරුණු කැබිනට් සංදේශයක්. කවුද මේ කැබිනට් සංදේශය ඉදිරිපත් කරන්නේ? රාජ්‍ය පරිපාලන අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා. මොකක්ද ඒකේ තිබෙන්නේ? ගරු සභාපතිතුමනි, ඒකේ මෙන්න මෙහෙම වාක්‍යයක් තිබෙනවා. "ප්‍රාදේශීය සභා ලේකම්, රෝහල් ලේකම්, විද්‍යාපීඨ හා කාර්මික විද්‍යාල ලේඛකාධිකාරී තනතුරු මෙම සේවයට අයත් තනතුරු බවත් - මේ සුප්‍රා සේවයට. එය ආරම්භයේ සිටම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ බඳවා ගැනීම් පන්තියට සමාන කර තිබියදී - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ බඳවා ගැනීමේ පන්තියට සමාන කර තිබියදීත්. ඒකෙන්ම පේනවා මේක පිළිගන්නවාය කියන එක. ඒ වාගේම සම මට්ටමෙන් වැටුප් ලබා දීමට කටයුතු කර තිබීමත් හා දැනටමත් විධායක හා මධ්‍යම කළමනාකරණ මට්ටමේ රාජකාරී ඉටු කිරීමත්, විෂයානුබද්ධ දැනුම, අත්දැකීම් හා පළපුරුද්දෙන් පරිපූර්ණ වැදගත් හා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කරන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ පරිපාලන නිලධාරීන්ට විධායක තත්ත්වය හා නියමිත වැටුප් තලය ලබා දිය යුතුය." මේ කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙන එක. කවුද මේ කියන්නේ? රාජ්‍ය පරිපාලන ඇමතිතුමා, තමන්ගේ කැබිනට් සංදේශයෙන්, කැබිනට් යෝජනාවෙන් පෙන්වනවා මේගොල්ලන්ට දෙන්න ඕනෑ විධායක මට්ටම. මේගොල්ලන්ට දෙන්න ඕනෑ ඒ අදාළ වැටුප් තලය. ඒ කියන්නේ මේගොල්ලෝ රාජ්‍ය පරිපාලන සේවයේ ඒ මට්ටමේ සේවයක් කරනවා. එතකොට මොකක්ද කරන්න හදන්නේ? දැන් මේ කරන්න හදන්නේ මේගොල්ලන්ව අයින් කරලා රාජ්‍ය පරිපාලන සේවය මෙතැනට ගේන්න හදනවා. දැන් මේකේ විහිළුව ඒක නොවෙයි. දැන් රජය පිළිගන්නවා මේගොල්ලන්ගේ තත්ත්වය. එසේ තිබියදී ඇයි දැන් ඒ සමාන තත්ත්වය තිබෙන බව දැන දැනත් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට ඒක පිළිගන්න බැරි වෙලා තිබෙන්නේ.

දැන් බලන්න කෝ. ප්‍රාදේශීය සභා ලේකම්වරුන් අලුතින් පත් කිරීම ගැන සොයන්න පත් කළ කමිටුවේ කවුද ඉන්නේ? මා ළඟ තිබෙනවා ඒ කමිටුව. ඒ කමිටුවේ ඉන්න සියලු දෙනා රාජ්‍ය පරිපාලන සේවයේ. දැන් මේකේ පොඩි අසාධාරණයක් තිබෙනවා. තමන් නියෝජනය කරන සේවයේ අය කැමැති වෙයිද වෙනත් සේවයකින් ඇවිල්ලා පරිපාලන සේවයේ තනතුරුක් ගන්නවාට. ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙනවාට. ඒකට කැමැති වෙන්නේ නැහැ. ඒගොල්ලෝ කැමැතියි, රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරීන් මේකට පත් කරන්න. මේකයි මේකේ රහස. ඒ නිසා ඒ කමිටුවේම තිබෙනවා ලොකු අසාධාරණයක්. ඒක එහෙම වෙන්න බැහැ. ඒකේ ඉන්නේ රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරීන්මයි. ඒ නිසා එතැන පක්ෂග්‍රාහී බවක් පේනවා. මම කියන්නේ, තමන්ගේ සේවයට ප්‍රාදේශීය සභා ලේකම් තනතුරු ලබා දීමට මේ පිරිස අමාත්‍ය මණ්ඩලය නොමග යවා තිබෙනවා කියලා. විෂය භාර ඇමතිවරයාත්, ඔහුගේ ලේකම්වරයාත් මේකට වගකියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මේ ලේඛනයේ ප්‍රාදේශීය සභා වර්ගීකරණයකට ලක් කරලා තිබෙනවා. මේ ලේඛනයේ තිබෙනවා, ප්‍රාදේශීය සභා වර්ගීකරණයට ලක් කරලා. මම ඊයේ කථා කළා අපේ පළාත් පාලන කොමසාරිස්තුමියට. කථා කරලා මම ඇහුවා. කොමසාරිස්තුමිය, මේ ප්‍රාදේශීය සභා වර්ගීකරණයක් තිබෙනවාද පනතේ. එතුමිය කියනවා, එහෙම නැහැ. එතුමියට තේරුණා වැඩේ. තේරිලා එතුමිය කියනවා, නැහැ ඔය අමාත්‍යාංශ දන්නේ නැද්ද? පොඩි නිකම් A, B, C වාගේ එකක් දා ගෙන තිබෙනවා කියලා. එහෙම බැහැ. මම අහන්න කැමැතියි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ එහෙම එකක් තිබෙනවාද කියලා. මෙන්න පනත තිබෙනවා. ඕනෑ කෙනෙකුට බලන්න පුළුවන්. එහෙම එකක් නැහැ. එහෙම වර්ගීකරණයකට යන්න නම් ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කළ යුතු නැද්ද? සංශෝධනය කළ යුතුයි. දැන් මේ යෝජනාව හරහා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය කළමනාකරණ අවුලක් නිර්මාණය කරමින් තිබෙනවා. ගරු සභාපතිතුමනි, කළමනාකරණ සහකාර සේවය පිළිබඳ තීන්දු තීරණ ගන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිසමයි. ශ්‍රී ලංකා පරිපාලන සේවා පත්වීම් මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිසම යටතේ පවතින්නක්. පළාත් රාජ්‍ය සේවා කොමිසම අතික්‍රමණය කරන්න කවුද මේගොල්ලන්ට බලය දුන්නේ? ඒ නිසා මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේක පවතින පනත් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කිරීමක්. ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මගින් ගරු මහ ඇමතිතුමාගේ අවධානයට ලක් කරන්න කැමැතියි. ඔබතුමාගේ විෂය පථය මේක. මේක අධිකරණයට යන්න ඉඩ තියෙනවා. ඔබතුමාට තීරණයක් ගන්න පුළුවන්. අනෙකුත් මහ ඇමතිවරුන් එක්ක එකතු

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

වෙලා මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. තීන්දුවක් දෙන්න පුළුවන්. ඔබතුමන්ලාට පුළුවන් අවශ්‍ය නම් - මම යෝජනා කරන්නේ. මේක වෙන වෙන අය නොවෙයි. අනෙක් මහ ඇමතිවරු එක්ක කථා කරලා මන්ත්‍රීවරුන්ගේ කමිටු පත් කරමු. කමිටු පත් කරලා ඒ හරහා අපි බලමු මේක ගැන තීරණයක් ගන්න. ඒ නිසා මේ කාරණය පිළිබඳව මේ සභාවේ අවධානයට යොමු කරන්න මම කැමැතියි. මේ දීපව්‍යාප්තව 70,000 ක් නියෝජනය කරන සේවයක්. මම විශ්වාස කරනවා මේ සේවය ආරක්ෂා කර ගත යුතුයි. ඒ සඳහා පියවරක් ගත යුතුයි කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සභාවේ කටයුතු. ගරු සභා කටයුතු අමාත්‍යතුමාට අවස්ථාව සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කරන්න. ඇමතිතුමාට එන්න කියන්න. ඉන්නවා නම්. සභා කටයුතු ඇමතිතුමා කොහේද දන්නේ නැහැ ගියේ. ඇමතිවරු න්‍යාය පත්‍රයවත් කියවන්නේ නැහැ නේ? හරි ප්‍රශ්නයක් නේ මේක. න්‍යාය පත්‍රය කියවනවා නම් සභා ගර්භයේ ඉන්නවා නේ? ගරු මහ ඇමතිතුමා ඔබතුමා මේක ඉදිරිපත් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඔය වරප්‍රසාදය ගරු මන්ත්‍රීවරුන්ටත් දෙන්න. දැන් බැරි වෙලාවත් මන්ත්‍රීවරයෙක් මෙතැන යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ හිටියේ නැත්නම් ඔබතුමා ටිකක් වෙලා බලාගෙන ඉන්න. නැත්නම් මොකද, ඒක හැමෝටම තිබෙන්න එපැයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඉතිහාසයේ ඔබතුමා මට එවැනි තුන් ආකාරයකින් සලකලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි ඒ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම මෙතැනින් දොරෙන් එන කොට ඔබේ කාලය අවසානයි කියලා තිබෙනවා. ඒ නිසා ඔක්කෝටම එක හැන්දෙන්ම බෙදන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ මම බැලුවේ - මෙතුමා ඉන්නවා. ඒක වගකීමක් ගරු ඇමතිතුමන්ලාගේ.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"අද දින (2018.07.17 දින) සභා න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 39(1), 39(3) හා 52(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02
SUPPLEMENTARY ESTIMATE - 02 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන් එනම්,*

*පළාත තුළ වැඩ අවසන් නොකළ පාසල් ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීම, අත්‍යවශ්‍ය පාසල් ගොඩනැගිලි ඉදි කිරීම් ඇතුළු අනෙකුත් ඉදිකිරීම් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම (රුපියල් මිලියන හත්සිය පනහක් - රු. 750,000,0000)*

*යන අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා*

*අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් වන (රු. 750,000,000) මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබා ගැනීම මගින් පියවා ගැනීමට අපේක්ෂිත වන හෙයින් ඒ අනුව පිළියෙළ කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 අනුමත කළ යුතුය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම විශ්වාස කරනවා මේ වන විට ඒ පරිපූරක ඇස්තමේන්තුව - 02 ගරු මන්ත්‍රීවරුන්ට ලැබිලා තිබෙනවා. කාටවත් නොලැබී නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, එකම එක සංශෝධනයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව අපට සංශෝධනවලට යන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඒක සංශෝධනවලට යටත්ව තමයි කරන්නේ. මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, එහෙම කරන්න ගියොත් එහෙම ප්‍රශ්නයක් වෙනවා. සංශෝධනවලට යටත්ව කරන්න ගියොත් එහෙම සම්මත කරන්න බැහැ මේක අද අපට. එතැන පොඩි ගැටළුවක් තිබෙනවා. ඒ නිසා අපි ඒ අවශ්‍ය කට්ටියට තිබෙන සංශෝධන ඉදිරිපත් කරන්න කියලා අපි මෙහෙම්මම සම්මත කරමු. නැත්නම් තවත් කාලයක් යනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සමහර විට මේක නිලධාරීන් අතරින් එහෙම ආව එකත්, සමහර වෙලාවට මන්ත්‍රීවරුන් සම්බන්ධයක් නැති ඒවාත් තිබෙන්න පුළුවන්. නමුත් වැඩ කර ගෙන යන කොට අපට අඩුපාඩු හම්බ වෙන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, කැබිනට් එකත් අනුමත කරලා තිබෙන්නේ යම්කිසි සංශෝධනයක් ආවොත් ඒක කරන්න බලාපොරොත්තුවෙන්. ඒ නිසා මන්ත්‍රීවරුන්ට ඒ ගැන සැකයක් හදා ගන්න ඕනෑ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සංශෝධන තුනයි තිබුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අපට නැහැ නේ දැන්. ප්‍රශ්න දෙකයි තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සංශෝධන දෙකයි තිබ්බේ. ගරු සභාපතිතුමනි, මේක සභා කටයුතු කාරක සභාවේත් කථා කරලා සංශෝධනය වුණු යෝජනාවක්. මම යෝජනා කරනවා, මේ පරිපූරක ඇස්තමේන්තුවේ 63 වන යෝජනාව. බප/හෝ/දිද්දෙනිය කනිෂ්ට විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදි කිරීම. මිලියන 10 යි 890 යි. මේ යෝජනාව මිලියන 08 යි 890 ක් කරලා, අවිස්සාවේල්ල ජනාධිපති විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලේ වහළය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මිලියන දෙකක් ඇතුළත් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ මුදල තුළ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ මුදල තුළ. අදාළ මුදල තුළමයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, අවිස්සාවේල්ල ගැන කියන්නේ නැතිව, කිනම් හෝ සංශෝධනයක් කිරීමට අවශ්‍ය වුවහොත් එය සංශෝධනය වීමට ඉඩකඩ දෙන්න කියලා යෝජනාවක් ගේන්න. හරි නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතකොට සංශෝධන ගොඩක් එයි මහ ඇමතිතුමා. සංශෝධන තුනයි තිබුණේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, එතකොට මේකේ නිලධාරීන්, සභා කටයුතු කාරක සභාවේදී පෙන්වලා දුන්න විධියට නීතිමය ප්‍රශ්නයක් මේකට එනවා. ඒ කියන්නේ, අපට දීලා තිබෙනවා මේ පරිපූරක ඇස්තමේන්තුව - 02 සම්බන්ධව ප්‍රකාශය කියලා. එතකොට මේකේ දැන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගිහිල්ලා තමන්ගේම කොට්ඨාශයේ එක අද සංශෝධනය කර ගත්තොත් ඒක තමයි නීතිය වෙන්නේ. හැබැයි, එහෙම නැති ඒවා මේකේ කරන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සංශෝධනය කරන්න පුළුවන් විධියට තමයි මම යෝජනාව ගේන්නේ. ඒ නිසා ඒ ගැන බාධාවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් අපට මෙහෙමයි. ප්‍රධාන ඇමතිතුමා මේක කිව්වාට, මේක ක්‍රියාත්මක කරන නිලධාරීන් අපට කියපු එකත් එක්ක තමයි අපට යන්න වෙන්නේ. මොකද, එතුමන්ලාගේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මේක කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොකද, එතුමන්ලා කියනවා, මේක එහෙම සංශෝධනය කරන්න බැහැ. එහෙම නම් නැවත කැබිනට් එකට ගිහිල්ලා එන්න ඕනෑ කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම නම් සංශෝධන ඉදිරිපත් කරන්න කෝ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම ඒ සංශෝධනය ඉදිරිත් කරනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හරි. හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මහ ඇමතිතුමා කියනවා නම් පොදුවේ සංශෝධන ගේන්න එකහයි කියලා ආයිත් එකින් එක ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ එහෙම නම්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් දැන් ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමා. එදා සභා කටයුතු කාරක සභාවේදී පැහැදිලි වුණු පරිදි සභාවේ සාකච්ඡා වෙන්න ඕනෑ මේක.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, දැන් මේක තමයි නීතිය බවට පත් වෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඔබතුමාට විමසන්න පුළුවන් නේ? බන්දුල මහත්තයා ඉන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැනට එන්න බැහැ නේ? අපි එදා කථා කළා. කථා කරලා ඒ අය කිව්වේ එහෙම.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

පූසා ගියොත් හිලෙන් බල්ලොත් එනවා ඒකෙන්ම.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මේ පරිපූරක ඇස්තමේන්තුව - 02 - 2018 හි 75 වන යෝජනාව. බප/ජය/මාළඹේ ආදර්ශ පිරිමි විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදි කිරීම. මේකේ සඳහන් වෙලා තිබෙන්නේ, මිලියන 2.5 යි. ඒ කියන්නේ ලක්ෂ 25 යි. මේක මීට ඉහත දිගටම ආවේ මිලියන 25 යි කියලා. ඒ නිසා මිලියන 25 හැටියට සංශෝධනය විය යුතුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ප්‍රශ්නයක් නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒ මුදල මේකේ කොහෙන්ද අයින් වෙන්නේ. අපි අහන්නේ ඔන්න ඕක. දැන් එතුමා ඒක මිලියන 25 ක් කර ගන්නවා නම්, ඒ මිලියන 25 වෙන කොහේවත් ලෝකෙකින් එන්නේ නැහැ නේ? මේකෙන් අයින් වෙන්න ඕනෑ. වෙන එකකින්. එතකොට කොහෙන්ද මේක අයින් වෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමාගේ සංශෝධනයත් කියන්න කෝ. මම කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු මහ ඇමතිතුමා, මගේ සංශෝධනයක් මේකේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මහ ඇමතිතුමා, මොනවා හරි යෝජනා -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මේ යෝජනා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම ඉන්නේ, මේ පරිපූරකය ආවේ පාසල්වල වැඩ නිම කර ගන්න බැරි වුණු ගොඩනැගිලිවල වැඩ අවසන් කරන්න. ඒකට මේ වෙන වෙන තැන්වලින් ඇවිල්ලා, වෙන දේවල් එකතු වෙනවාය කියලා කියන්නේ, ඒ අරමුණ ඉෂ්ට වෙන්නේ නැහැ. අර පොදු අරමුණ වෙනුවෙන් මම මැදිහත් වෙන්නේ. නැත්නම් මගේ කියලා එකක් මේකේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේකේ සංශෝධන ප්‍රශ්නයක් නැහැ. මේ මුදල -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අපේ කාගේවත් ඒවා නැහැ. අපි ගෙදර ගෙනියන්න නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

බෙත්මගේ සභානායකතුමා. මම කියපු එක අහන්නේ නැති එක නේ තිබෙන්නේ ඔය හැමදාම. මේ සංශෝධනයක් තිබෙනවා නම්, ඒක සංශෝධනය කරන්න පුළුවන්. ගැටළුවක් නැහැ. ඒ වගකීම මම නේ මුදල් ඇමතිවරයා හැටියට භාර ගන්නේ. ඉතින් ඒකේදී ගැටළුවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය ගන්න එපැයි මේ හැම එකකටම. සංශෝධනවලට කොහොමද -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම යෝජනාව ගේන්නේ ඒ විධියට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට සම්මත කරන්න හම්බ වෙන්නේ නැහැ අද.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, දැන් මේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා. එතුමා කියන විධියට එතුමා ඒ වගකීම ගන්නවා නම්, ඒ වගකීම අරගෙන කටයුතු කරන්න. ඒ වාගේම මම මේ සභාවේදී කියනවා, බැරි වෙලාවත් මෙතුමා කියන විධියට ඒක කරන්න බැරි නම් නිලධාරීන්ට. වහාම අපට සභාවක් හැටියට නිලධාරීන් මේක දැනුම් දෙන්න ඕනෑ. නිලධාරීන් ඇවිල්ලා ඉන්නවා. මෙතැනට මහ ඇමතිතුමා කියන ප්‍රකාශයට අනුව මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් එතුමා කියන යෝජනා අනුව ඔබතුමන්ලා නිලධාරීන් හැටියට මේ සභාවට දැනුම් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අයට උත්තරයක් දෙන්න බැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මුදල් ඇමති මම නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මුදල් ඇමතිතුමා තමයි. නමුත් මේ කටයුතු ක්‍රියාත්මක වීමේදී නිලධාරීන් ඒ අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා නිලධාරීනුත් ඒ වගකීමට බැඳිලා ඉන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නිලධාරීන් අනුගත වෙනවා. නිලධාරීන්ට පුළුවන් අනුගත වෙන්න. මුදල් ඇමතිවරයා හැටියට එතුමාගේ තිබෙන - මේ සභාවේ තිබෙන, සභාවේ තීන්දුව තුළ එන එක නෛතික ප්‍රකාශයක්. ඒක නීතියක් බවට පත් වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

වොරන්ට් එක අත්සන් කරන්නේ මම නේ?

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, දැන් මේකේ සඳහන් වෙලා තිබෙන පාසල්වලට මේ විධියට මුදල් වෙන් කරලා, නැවත වතාවක් ඒක වෙන් කිරීමේ හැකියාවක් නැහැ මම හිතන්නේ. මොකද, නැවත වතාවක් අපි ව්‍යුහ කමිටුව රැස් වෙලා, විශේෂයෙන්ම ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ සම සමව ඒ කොට්ඨාශවලට බෙදී යන ආකාරයට තමයි මේක බෙදා ගන්න උත්සාහ කළේ. නමුත් දැන් මේකේ අපි එදා සාකච්ඡා කරපු ඒවා නොවෙයි මේකට බඳුන් කරලා තිබෙන්නේ. මේකේ කොළොන්නාවට පමණක් තිබෙනවා, තිස් නව කෝටි තුන් ලක්ෂ පනස් දාහක්. දැන් එතකොට මහරගම කියලා කිව්වාම මහරගම මහ ඇමතිතුමා ඉන්න නිසා සමහර කට්ටිය හිතනවා, මහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර ගත්තාය කියලා. ඒ එක පාසලක් අලුතෙන් සංවර්ධනය කරන්න තමයි ඒ මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා මේකේ මුදල් වෙන් කිරීමේ විෂමතාවයක් තිබෙනවා. මම හිතන්නේ, මේ වෙන් කරලා තිබෙන ස්වරූපය වෙනස්. එදා ඒ කියන්නේ මුලින්ම ගිය මන්ත්‍රීවරයා තමන්ට ඕනෑ ටික දා ගත්තා ඒවාට. මහරගමට තිබෙන්නේ, දහ දාහයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක නැවත වතාවක් මුදල වෙන් කරලා, නැවත වතාවක් යෝජනා වෙනමම ගෙන එන්න සාකච්ඡා කළා නම් වඩා හොඳයි කියලා මම හිතනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මිලියන 750 ක් - අපි 3000 අනුමත කළෙත් ඒ 3000 තුළ සංශෝධන. ගරු සභාපතිතුමනි, මේක පැහැදිලි කර ගන්න. මේ මිලියන 750 අපි වෙන් කළාට සමහර ව්‍යාපෘතිවලට යම්කිසි මුදලක් ඉතිරි වෙන්න පුළුවන්. මේ සභාව බලය දුන්නාට වරදක් නැහැ. මිලියන 750 ඇතුළත සංශෝධන කරන්න. ඒක අරන් දුන්නාම ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා, දැන් මේ පරිපූරකය මෙතැනට ආවේ අමාත්‍ය මණ්ඩල තීන්දුවෙන් පස්සේ. අමාත්‍ය මණ්ඩල සාකච්ඡාවෙන් පස්සේ ආවේ. ආයිත් සංශෝධන අමාත්‍ය මණ්ඩලයට මේක යන්න ඕනෑ. තව කාලයක් යනවා මේකට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සභාව මිලියන 750 තුළ සංශෝධනය කර ගන්න දෙන්න කෝ? මම වැඩේ භාර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට ආයිත් කැබිනට් එකට යන්න ඕනෑ. ඒකට ආයිත් කාලයක් යනවා. අපි මේ කියන්නේ කාලයක් යනවා. අපි කෙළින් කථා කරමු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. නැහැ. මේක තේරෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ සභාව යෝජනාවක් සම්මත කරන්න මිලියන 750 ඇතුළත සංශෝධනවලට යටත්ව මේක සම්මත කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අමාත්‍ය මණ්ඩලයට යන්න ඕනෑ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එපමණයි නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා යෝජනා කළා. මම ස්ථිර කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මට කරුණු පැහැදිලි කරන්න අවස්ථාවක් දෙන්න. ගරු සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධව වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණයත් එක්ක ව්‍යුහ කමිටුව ඇතුළේ ලොකු සාකච්ඡාවක් ගියා මේක වෙනස් කරන්න පුළුවන්ද කියලා. ඒ වෙලාවේ මන්ත්‍රවරුන්ට තිබුණා බරපතළ යෝජනා ටිකක්. අලුතෙන් ඉදි කරන්න තිබෙන දේවල්. අවසන් කරන්න ඕනෑ දේවල් ටික. නමුත් අපට ව්‍යුහ කමිටුව ඇතුළේවත් ඒ වැඩේ සංශෝධනයක් සහිතව ඉදිරිපත් කරන්න බැරි වුණා. ප්‍රමුඛත්වය දෙන්න ඒ වෙන කොටත් කාරණා ටිකක් මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් මැදිහත් වෙලා හදලා ඉවරයි. දැන් අපට පුදුමය තමයි මේක සම්මත වුණාට පස්සේ කොහෙන්ද අපි මේ සම්බන්ධව ආයිමත් සංශෝධන ගේන්නේ. ඒක වෙන්න විධියක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, අපි යම් ව්‍යාපෘතියකට යම් මුදලක් ඇස්තමේන්තු කළාට සමහර වෙලාවට ඉදිරියේ පවතින තත්ත්වයන් තුළ, අපි කියමු ස්වභාවික තත්ත්වයන් තුළ අපි කියමු මෙතුමාගේ යෝජනාවට ලක්ෂ 250 ක් දැම්මා කියලා. සමහර විට ලක්ෂ 50 ක වැඩ අපට කර ගන්න බැරි වෙන්න පුළුවන්. දෙසැම්බර් 31 න් ඉස්සෙල්ලා. අපට එතකොට පුළුවන්කම ලැබෙනවා, ඒ 50 අරගෙන අපට වෙනත් ව්‍යාපෘතියකට දෙන්න අපි ඒකට පෙර සූදානමක් ඇතිව මේ වගකීමකින් තමයි අපි මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ. දැන් ඔබතුමන්ලා හිතනවාටත් වඩා එහා ගිහිල්ලා අපි වගකීමක් ඇතිව තමයි මේ පරිපූරකය සම්මත කරලා ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා ඒ ගැන සැකයක් හිතා ගන්න එපා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපේ යෝජනා මෙතැන මොනවත් නැහැ. ඒක ප්‍රශ්නයක් නොවෙයි. නමුත් කලාප මට්ටමින් ගත්තාට පස්සේ ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ. මේ වන කොටත් වැඩ අවසන් නොවුණු ගොඩනැලිගිල විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගොඩනැගිලි නැවත සැරයක් වෙනස් වුණොත් ඒ ගොඩනැගිලිවලට සාධාරණයක් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ඒ කිසිම දෙයක් වෙනස් වෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, දැන් ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට මේ ගොඩ පෙරකදෝරුවෝ වැඩක් නැහැ. මේක උසාවියක් නොවෙයි නේ? තේරුණාද? මේක උසාවියක් නොවෙයි. හරිද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේක උසාවියක් වුණා නම් මේ ප්‍රශ්නෙත් නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගැටළුවක් තිබෙනවා. ගරු මහ ඇමතිතුමා ඉන්න වෙලාවේ අහන්න ඕනෑ. දැන් ගියවර වෙන් කරපු මුදල්වලින් මේ වන කල් වැඩ නොකළ පාසල් තිබෙනවා. අපි වෙන් කරලා. කිසිම වැඩකට අත ගහලා නැහැ. ඉතින් මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සෙල්ලා කොහොමද ඒවා කරලා ඉවර කරන්නේ. තවත් සල්ලි නිදහස් කරන්න ඉස්සෙල්ලා ඒවා නොකිරීම පිළිබඳව සොයලා බලලා වැඩ සටහනක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව අපි දිගින් දිගටම යන්න ඕනෑ නැහැ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා යෝජනා කරනවා. එතුමා ප්‍රකාශ කරනවා. සංශෝධනවලට යටත්ව සභාවේ එකඟතාවය මත අපි මේක සම්මත කරමුයි කියලා. ප්‍රශ්නයක් නැහැ ඉතින්. එතුමා මුදල් ඇමතිතුමා. එහෙම නම් ඉතින් සභාවේ එකඟතාවය මත. සභාව එකඟද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ සංශෝධනය සභාගත කරලා තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

හරි. හරි. අපි එකඟයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ. අපි එකඟ නැහැ. මුලින්ම කථා කරන්න දෙන්න. මම නැගිට්ටා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දයකට යන්න ඕනෑ එහෙම නම්. එකඟ නැත්නම්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නමුත් ගරු සභාපතිතුමනි, මේ මිලියන 750 එන්නේ නිකම්ම හුදෙකලාව ආපු එකක් නොවෙයි. මේක ආපු විධියක් තිබුණා. මේක ආවේ, පළමුවැනි පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයනේ මේ සභාවේ පැන නැගුනු ගැටළුවක් නිරාකරණය කර ගැනීම සඳහා විපක්ෂයෙන් කරන ලද ඉල්ලීමක් මහ ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලයි. හැබැයි, දැන් අද මේ මිලියන 750 දෙවන පරිපූරකය සම්බන්ධයෙන් ගත්තාම මේ හොරණ කලාපයට වෙන් කරලා තිබෙන සල්ලිවලින් වෙන් කරලා තිබෙන පාසල්වලින් 92% ක් තිබෙන්නේ අපේ යසපාල කෝරළගේ නියෝජ්‍ය සභාපතිතුමා නියෝජනය කරන හොරණ කලාපයේ හොරණ පාසල්වලට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේක විවාදයට යන්න ඕනෑ නැහැ. මිලියන 750 ඇතුළත තමයි ඔක්කොම යෝජනා දීලා තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඉතින් හොරණ කලාපය කියලා වෙන් වෙලා තිබෙන්නේ, හොරණ ආසනයේ පාසල්වලට නේ? හොරණ කලාපයේ තිබෙන්නේ හොරණ ආසනය විතරද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේකට විපක්ෂ නායකතුමා සභා කටයුතු කාරක සභාවේ එකඟ වෙලා තිබෙන්නේ. මේකට එකඟ වුණා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හොරණ කලාපයේ තිබෙන්නේ හොරණ ආසනය විතරද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමා, විපක්ෂ නායකතුමා එකඟ වුණා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් එක්ක. සභා කටයුතු කාරක සභාවේදී.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හොරණ කලාපයේ තිබෙන්නේ හොරණ ආසනය විතරද? මේ යෝජනාවලින් 92% ක් තිබෙන්නේ හොරණ ආසනයේ යෝජනා. ව්‍යුහ කමිටුවේ - අර කලාප අධ්‍යක්ෂවරියක් ඉන්නවා. ඒ කලාප අධ්‍යක්ෂවරිය අන්ධ භූත ජාතකය වාගේ. අධ්‍යාපන ඇමතිට හැමදාම කියනවා, ඒ කලාප අධ්‍යක්ෂකව අයින් කරන්නයි කියලා. මේ කියන කියන පදයට නටනවා. යසපාල කෝරළගේ නියෝජ්‍ය සභාපතිතුමා කිව්වොත් එහෙම ඔලුවෙන් හිට ගනින් කියලා, හිට ගන්නවා කලාප අධ්‍යක්ෂ. මේ එහෙම හදපු යෝජනා. මේකේ කොහෙද බණ්ඩාරගමට තිබෙන්නේ. දැන් මම ඉන්නේ බණ්ඩාරගම. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉන්නේ බණ්ඩාරගම. කෝ මේකේ බණ්ඩාරගම ඒවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කියවලා බලන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මොනවාද? වෙනිවැල්පිටියට තිබෙනවා. මැදගම ඉස්කෝලේ ගොඩනැගිල්ල අලුත් වැඩියා කරන්න තිබෙනවා. මැදගම කොහේද අලුත් වැඩියා කරන්න ගොඩනැගිලි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වා වැරදියි. හොරණ කලාප අධ්‍යක්ෂ ඔලුවෙන් හිට ගන්නේ යසපාල කෝරළගේ කිව්වාම නොවෙයි. අධ්‍යාපන ඇමතිතුමා කිව්වාම.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අධ්‍යාපන ඇමතිතුමා කිව්වාම මොකුත් කරන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේකට විපක්ෂ නායකතුමායි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමායි දෙන්නාම එකඟ වෙලා තිබෙන්නේ. සභා කටයුතු කාරක සභාවේදී. ඒ නිසා අපි මේක සම්මත කරමු.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

විපක්ෂයේ සංවිධායක එකඟ වෙන්නේ කොහොමද? මේක මේ ඊළඟ ඡන්දයට හදා ගත්ත දේවල් මේගොල්ලන්ගේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක අද සම්මත කරන්න බැරි වුණොත් ඒ මිලියන 750 වැඩ කරන්න බැහැ. ඒකේ වගකීම ගන්නේ මම.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේවා මේ ඊළඟ ඡන්දෙට හදා ගත්ත දේවල්. නියෝජ්‍ය සභාපතිතුමාට පළාත් සභා එන විධියයි, මහ ඇමතිතුමාට පළමුවැනියා වෙන විධියටයි හදා ගත්ත ඒවා මේවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු මහ ඇමතිතුමා, අපි සහයෝගය දෙන එක වෙන වැඩක්. හොරාට වැඩ කර ගන්න එපා. බෙදලා දෙන්න ඒක.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මිලියන 750 ආවේ කොහොමද මෙතැනට?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකේ වගකීම ගන්නේ මම. මේක අද සම්මත නොකර ගත්තොත් මේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ඕනෑම සංශෝධනයකට යටත්ව මට බලය දෙන්න. මම මේ වැඩේ කරලා දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, එදා සභා කටයුතු කාරක සභාවේදී නිලධාරීනුත් පොරොන්දු වුණා මෙතුමා කියපු කථාවම. කිව්වේ, අඩක් නිම කර ගෙන යන කොට සල්ලි ඉතිරි වුණොත් අනික් ඒවාට දාන්නම් කියලා. එතැනදී මගේ යෝජනාව තිබුණේ පිලපිටිය මගේ අල්ලපු වැට. ඒක තුන් වැනි අදියර යන්නේ. ඒකට ලක්ෂ 25 යි දාලා තිබෙන්නේ. හැබැයි, ඊට වඩා යනවා. මම ඉල්ලීමක් කරනවා, එහෙම ඉතිරි වුණොත් ඒ මුදල දාන්න. පිලපිටිය මහා විද්‍යාලය. අනික් එක කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. එතුමා Embassy එකට ගියා Visa ගන්න. එතුමා කියන්න කිව්වා, එතුමාගේ හොරණ කලාපයේ වරකාගොඩ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පුළුවන් නේ? අපි එකින් එක කථා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක කියන්න ඕනෑ. ඒ නම් දෙක කියවෙන්න ඕනෑ. ඉස්කෝලේ නම් දෙක හැන්සාඩ් වෙන්න ඕනෑ. දීපාලෝක මහා විද්‍යාලය. ඒ වාගේම පොකුණුවිට සිරිමෙවන් විද්‍යාලය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම අවශ්‍ය නැහැ. එක එක කියන්න ඕනෑ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. ගරු සභාපතිතුමා මාර්ගයෙන් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පාසල් පද්ධතියේ මේවා තෝරන විධිය මම නම් දන්නෙත් නැහැ. අපට කථා කරලාවත් නොවෙයි මේවා කළේ. ඒක නිසා පැහැදිලිවම මම ඉල්ලා සිටිනවා - මේක සම්මත කරන එක ගැටළුවක් නොවෙයි. මේක සම්මත වුණාට පස්සේ හොරණ කලාපය කියන්නේ බුලත්සිංහලයි, හොරණයි, බණ්ඩාරගමයි තුනම. මේ මුදල් ආසන තුනට සාධාරණ විධියට බෙදී යන ආකාරයෙන් වැඩ පිළිවෙළක් හදන්න. මේකට අනුගත නොවී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මේක දිගින් දිගටම කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා ඒ ආකාරයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා පැහැදිලිව ප්‍රකාශ කළා, මිලියන 750 ඇතුළතම දැනට ඉදිරිපත් වූ යෝජනාවන්වල යම් සංශෝධනයක් ඇත්නම්, එකී සංශෝධනයන් සිදු කරන්න. ඒ මිලියන 750 සංශෝධනය වෙන්නේ නැහැ. නමුත් යෝජනා හා ඒ යෝජනාවලට ඉදිරිපත් වූ ප්‍රතිපාදන

ප්‍රමාණයන්හී යම් සංශෝධනයක් කිරීමට හැකි වන පරිදි පරිපූරක ඇස්තමේන්තුවට සභාව එකඟද කියලා මට කියන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ හොරණ සල්ලි තියෙන්නේ යසපාල කෝරලගේ නියෝජ්‍ය සභාපතිතුමාගෙයි, නිමල් චන්ද්‍රරත්න මන්ත්‍රීතුමාගෙයි ප්‍රතිරූප -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය මත ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, පිළියන්දල අධ්‍යාපන කොට්ඨාශයේ ශාන්ත ජෝන් විද්‍යාලයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත වුණා. යෝජනාවල සංශෝධනයන්ට යටත්ව. යෝජනාවල සංශෝධනයන්ට යටත්ව සභා සම්මත වූ බව ප්‍රකාශ කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, පිළියන්දල අධ්‍යාපන කොට්ඨාශයේ නුගේගොඩ තිබෙන ශාන්ත ජෝන් විද්‍යාලය එකම පිරිමි විද්‍යාලය. අපි ඉගෙන ගත්තු ඉස්කෝලය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතුරු ටිකත් දානවා. අපි සංශෝධන දානවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒකේ තිබෙන ප්‍රධාන ශාලාව සම්පූර්ණයෙන්ම බිමට කඩා වැටිලා. නමුත් එක ශත පහක්වත් මේ පරිපූරකයෙන් දාලා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන ඒ ශ්‍රවණාගාරයට ලබන සතියේ මුල්ගල තියනවා. ඉස්සෙල්ලා එකෙන් සල්ලි අනුමත කරලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහ ඇමැතිතුමා ශාන්ත ජෝන් විද්‍යාලය. ඒ යෝජනාව දාන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමාත් එක්ක ඒ වැඩ ටික කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නිරෝෂන් මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා එකෙන් අනුමත වෙලා ඉවරයි. මුල්ගල තියනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ අලුත් බිල්ඩින් එකට.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සභා සම්මතයට පෙර මන්ත්‍රීවරුන්ට සංශෝධනයට ඇති නිදහස සහ අයිතිය උල්ලංඝණය කරන්න බැහැ. ඒක රීතිවලත් දැක්වෙනවා. මෙතැන මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා මේක සංශෝධනය විය යුතුයි කියලා කියන අය. අපි සභා කටයුතු කාරක සභාවේදී මොකක් එකඟ වුණත්. ඒ නිසා රීති ප්‍රකාරව මේක ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්න. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි දැන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක කියන්නේ විපක්ෂයේ ඔක්කෝගෙම අදහස නොවෙයි. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සතුටු කළ පමණින් අනෙක් ඔක්කෝම සතුටු වෙන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි එයාව පිළිගන්නේ නැහැ කොහොමත්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ ගැන කණ්ඩායමේ මොකවත් සාකච්ඡා කරලා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එයාව ඔයගොල්ලෝ නැති කරලා නේ තියෙන්නේ. ඔයගොල්ලෝ නටවලා නේ තියෙනේන් එයාව. අපි දැන් එයාව පිළිගන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලයි නටවලා තියෙන්නේ. අපි නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි පිළිගන්නේ නැහැ. ඔබතුමන්ලා නටවලා තියෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමන්ලා වරදාන, වරප්‍රසාද -

[සභාවේ ඝෝෂා]

මේක එහෙම කරන්න බැහැ. මේකේ බණ්ඩාරගම නිමල් චන්ද්‍රරත්නගේ ප්‍රතිරූප ගොඩ නඟන්නයි, හොරණ යසපාල කෝරලගේ නියෝජ්‍ය සභාපතිතුමාගේ ප්‍රතිරූප ගොඩ නඟන්නයි හදලා තියෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සංශෝධනයට තිබෙන අයිතිය උල්ලංඝණය වෙන්න දෙන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපේ පැත්තෙන් එක්කෙනෙක් දෙන්නෙක් සතුටු කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කරන්න.

## 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
APPROPRIATION STATUTE RELEVANT TO THE SUPPLEMENTARY ESTIMATE - 02 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 02 සඳහා අවශ්‍ය රුපියල් මිලියන හත්සිය පනහක් (රු. 750,000,000) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2018 අංක ...... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාව විමසනවා. එකඟයි?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ, නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපි විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ප්‍රකාශ කරනවා සංශෝධනවලට යටත්ව එකඟයි කියලා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එතුමා විතරයි. අනෙක් අය විරුද්ධයි.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේකට අදාළව නොවෙයි නේ?

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

මේක සිංහලෙන් විතරයි තියෙන්නේ. දෙමළෙන් ඇවිල්ලා නැහැ. ඒක වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක පිළිගන්නවා. දැන් මෙහෙමයි. මිලියන 750 ට අදාළ පරිපූරකය මීට කලින් සම්මත වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සම්මත වුණා නේ? දැන් ඉස්සෙල්ලා සම්මත කළා නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විරුද්ධයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මිලියන 750 පරිපූරක ඇස්තමේන්තුව සභාවේ එකඟතාවය අනුව දැන් සම්මත වුණා. අපි දැන් විසර්ජන ප්‍රඥප්තිය ගෙන ආවේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපි විරුද්ධයි කිව්වා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභා සම්මත වෙන්න ඔබතුමා ඇහුවාද? බෙදීමක් තියෙනවාද කියලා ඔබතුමා ඇහුවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇහුවා. ඇහුවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොයි වෙලාවේද බෙදීමක් තිබෙනවාද කියලා ඇහුවේ? සභාපතිතුමාට සල්ලි ටිකක් දැම්මාට පස්සේ, විපක්ෂයේ සංවිධායකට සල්ලි ටිකක් දැම්මාට මේවා කෙරෙන්නේ නැහැ. ඔබතුමා සල්ලිවලට යට වෙලා. මේ මිලියන 750 න් ඔබතුමාටත් හම්බ වුණු නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට හම්බ වුණු දෙයක් නැහැ. මට ඕනෑ සභාව ගෙනියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් මෙතැන ලියැවිලා තිබෙනවාද? මේ ලියැවුණු හැන්සාඩ් එකේ තිබෙනවාද? බෙදීමක් තියෙනවාද කියලා ඇහුවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟයි කිව්වාට පස්සේ ආයිත් බෙදීමක් අහන්න ඕනෑ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොහේද ඇහුවේ? සභාපතිට නටන්න නොවෙයි ඕක දීලා තියෙන්නේ. සභාවේ කාර්ය පටිපාටියට අනුව කටයුතු කරන්නයි. සභාපතිට සල්ලි ටිකක් දීලා සතුටු කළාම සභාපති තුට්ටු දෙකට මේක පාවා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බෙදීමක් අවශ්‍ය නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභාපතිකමත් පාවා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පාවා දෙන්නේ නැහැ මන්ත්‍රීතුමා. බොරුවට කෑගහන්න එපා. මේක උසාවියක් නොවෙයි. මේක අධිකරණය නොවෙයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

උසාවියේ මෙහෙම කෑගහන්නේ නැහැ. උසාවියේ කෑගහන්නේ නැහැ. උසාවියේ ඉන්න මනුස්සයා ඔයිට වඩා ස්වාධීනයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කට තිබුණු පළියට බොරු ප්‍රකාශ කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙතැන ස්වාධීන නැහැ. මෙතැන සල්ලි ටිකක් හම්බ වුණාම -

[සභාවේ ඝෝෂා]

තනතුර මොකක්ද කියලත් මතක නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විසර්ජන ප්‍රඥප්තිය සභා සම්මත වුණේ නැහැ. ඒක මට සම්මත කරලා දෙන්න. පරිපූරකය සම්මත වුණා නේ? දැන් විසර්ජන ප්‍රඥප්තිය ගැන කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සම්මත වුණා. සම්මතයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභාපති දන්නෙත් නැහැ. සභාපතිව ඉස්පිරිතාලෙකට එක්කරගෙන යන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සභාවේ හරියට හැසිරෙන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මිලියන 750 න් කොටසක් දුන්නාම ප්‍රශ්නය ඉවර වෙලා තිබෙන්නේ. ඒක නේ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට එහෙම මුකුත් දීපුවා නොවෙයි. මේක සම්මත කරන්න මට ඕනෑ. නැත්නම් නිකන් අපරාදේ.

මිලියන 750 ක් කියන්නේ විශාල මුදලක්. ඒ අනුව ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 02 සහ ඊට අදාළ විස්ර්ජන ප්‍රඥප්තියත් සභාවේ සංශෝධනයන්ට යටත්ව සම්මත වූ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම එතුමාට ආරාධනා කරනවා රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට. එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අදාළ පරිපූරක ඇස්තමේන්තුවේ දෙමළ පිටපත තැපැල් මගින් එවලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙමළ එකේ අඩුවෙන් තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක නිවැරැදි කරන්නම්. මන්ත්‍රීතුමා දැන් එකක් භාර දෙනවා. හරිද බලන්න. කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. කලින් සඳහන් කළ පරිදි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම එතුමාට ආරාධනා කරනවා එම රීති අත්හිටුවීම සහ ඊට අදාළ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

## රීති අංක 110 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 110

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, *"ඉමහත් සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන මත් උවදුර පිටුදැක එය මැඩලීම සඳහා රටේ පවතින නීතිය උපරිම ආකාරයෙන් ක්‍රියාත්මක කර බලාත්මක කිරීම. පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද බැවින් පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්ය පටිපාටි රීති 14(6), 14(7) (ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කර සිටී."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්තීර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු
PRIVATE MEMBER'S AFFAIRS

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, *"ගෙවී ගිය කාලය තුළ මහ පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ක්‍රියාකාරීත්වය ඉහළ ගොස් ඇති අතර මත් කුඩු රට තුළට ගෙන ඒමද, බෙදා හැරීමද, වැඩි වී ඇත. නීතියේ රැහැනට හසුව සිරගත කර සිටින ජීවිතාන්තය දක්වා මරණ දඬුවම නියමව සිටින මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බන්ධනාගාර තුළ සිට ද, මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවමින් රට තුළට මත් කුඩු කන්ටේනර් පිටින් ගෙන එමින් දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන්ද මත්ද්‍රව්‍ය බෙදා හරින කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කරගෙන ඇත. බන්ධනාගාර පරිපාලනය බිඳ වැටීම හා අකාර්යක්ෂම වීම මෙයට හේතු වී ඇත. එබැවින් මෙම අපරාධකරුවන්ට එරෙහිව රටේ නීතිය ස්වෛරීත්වය ආරක්ෂා කර ගනිමින් නීතිය උපරිම ලෙස ක්‍රියාත්මක කර බලාත්මක කරන ලෙසත් මරණීය දණ්ඩනය රටේ නීතියේ කොටසක් බැවින් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්තීර කරන ලදී. ]***
*[Seconded]*

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරලගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 10.47]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙවී ගිය සතියේ රටේ ප්‍රමුඛ සහ ප්‍රමුඛතම ප්‍රවෘත්තිය බවට පත් වෙලා තිබුණේ මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව, එල්ලා මැරීම සඳහා ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳවයි. අපේ සමාජය තුළ පමණක් නොවෙයි, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් මේ සඳහා විශාල ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ පිළිබඳව විවාදයක් ඇති වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙවැනි තීරණයක් ගන්න හේතු පාදක වන කරුණු කාරණා බොහොමයක් තිබෙනවා. නමුත් මරණ දණ්ඩය පිළිබඳව දාර්ශනික මතවාද තිබෙනවා. ඒ වාගේම සමාජ විද්‍යාත්මක මතවාද තිබෙනවා. ආගමික මතවාද තිබෙනවා. අපරාධ විද්‍යාවේ විවිධ මතවාද මේ සම්බන්ධයෙන් තිබෙනවා. කෙසේ නමුත් රටක නීතියේ කොටසක් බවට පත් වෙලා තිබෙන දණ්ඩ නීති සංග්‍රහයට අනුව මරණ දණ්ඩනය අපේ නීතියේ කොටසක්.

ඒ නිසා දණ්ඩනය කියන එක ඕනෑම සමාජයක යහ පැවැත්ම වෙනුවෙන් දීර්ඝ කාලයක් තිස්සේ මානව ඉතිහාසය තුළ මිනිස්සු සකස් කරගත්තු නීති පද්ධතියක්. එහෙම ඒ නීති මගින් තමයි, දඬුවම් මගින් තමයි, දණ්ඩනය මගින් තමයි සමාජයේ යහ පැවැත්ම තහවුරු කර ගන්නෙත්. සමාජ විරෝධී ක්‍රියාවල නිරත වන අය සමාජයේ පැවැත්මට අහිතකර ආකාරයෙන් සමාජ විරෝධීව කටයුතු කරන පිරිස් කිසියම් විධියකට පාලනය කරන්න, ඔවුන් දඬුවමට ලක් කරන්න හෝ එහෙම නැත්නම් ඔවුන් භෞතිකමය වශයෙන් සමාජයෙන් ඉවත් කරන්න අවශ්‍ය කරන නෛතිකමය ප්‍රතිපාදන සකස් කරලා තිබෙන්නේත්. ඒ නිසා මානව ඉතිහාසය පුරාම දණ්ඩනය කියන එක පැවතිලා තිබෙනවා. එය විවිධ ස්වරූපයෙන් පැවතිලා තිබෙනවා. සමහරු ඒවා ශීලාචාරයි කියනවා. සමහරු ඒවා අශීලාචාරයි කියලා කියනවා. කෙසේ නමුත් අපේ රටේ ඉතිහාසය තුළ අරගෙන බැලුවත්, අපේ රාජාවලිය තුළ, අපේ රාජාණ්ඩු ක්‍රමය තුළත් අනිවාර්යයෙන්ම මේ දණ්ඩනය තිබිලා තියෙනවා. ඒ අනුව කස පහර දීම වෙන්න පුළුවන්, එහෙම නැත්නම් හිස ගසා දැමීම වෙන්න පුළුවන්. ජලයේ ගිල්වා දැමීම වෙන්න පුළුවන්. කියතින් ඉරීම වෙන්න පුළුවන්. විවිධාකාර ස්වරූපයෙන් මේ දණ්ඩනයන් ක්‍රියාත්මක කරලා තිබෙනවා. එහෙම නම් එවැනි දණ්ඩනයන් ක්‍රියාත්මක කිරීම තුළින් බලාපොරොත්තු වුණේ සමාජයේ යහපැවැත්ම සහ සමාජයේ ස්ථාවරභාවයත්, සමාජීය ආරක්ෂාවත් තහවුරු කිරීමයි. ඒක තමයි මේකේ මූලික අරමුණ වුණේ. දැන් අද අපි කථා කරන මේ මරණීය දණ්ඩනයේ අවශ්‍යතාවය මතු වෙලා තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම රටේ නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමට අදාළව තිබෙන පොලිස් දෙපාර්තමේන්තුව තුළින් නිසි පරිදි වගකීම සහ කාර්ය භාරය ඉෂ්ට නොවීම නිසයි. ඒ නිසා තමයි අද අපේ සමාජය තුළින් මෙවැනි මතයක් ඉස්සරහාට ඇවිල්ලා තිබෙන්නේ.

ඒ වාගේම බන්ධනාගාර තුළ අද සිදු වන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව තුළ විශාල අප්‍රසාදයක් නිර්මාණය වෙලා තිබෙනවා. බන්ධනාගාර පරිපාලනය අකාර්යක්ෂම වීම, ඒ වාගේම බන්ධනාගාර පරිපාලනය බිඳ වැටීම තුළින් අද මෙවැනි මරණ දඬුවමක් අවශ්‍යයි කියලා පොදු මහත් සමාජය තුළ මතයක් ගොඩ නැගිලා තිබෙනවා. ඒ වාගේම අධිකරණ ක්‍රියාදාමය පිළිබඳවත් අපේ සමාජය තුළ විශාල අවිශ්වාසයක්, සැකයක් සහ අප්‍රසාදයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ආයතන තුන පිළිබඳව, නීතිය හා සාමය ආරක්ෂා කරන්න තිබෙන පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳවත් විශාල අප්‍රසාදයක් ඇති වෙලා තිබෙනවා. ඔවුන් පිළිබඳව විශ්වාසය පළුදු වෙලා තිබෙනවා. ඔවුන්ගේ ගෞරවය අහිමි කරගෙන තිබෙනවා. ඒ වාගේම අධිකරණය සම්බන්ධයෙන් ගත්තත් මේ තත්ත්වයම තමයි ඇති වෙලා තිබෙන්නේ. අධිකරණය පිළිබඳවත් මේ සැකය, අවිශ්වාසය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අද අධිකරණය ප්‍රශ්න කරන්න පටන් අරගෙන තිබෙන්නේ අධිකරණයත් දූෂිතයි. විනිසුරුවරුත් දූෂිතයි. උසාවියත් නිහඬයි. යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ. යුක්තිය ඉටු වීම අකාර්යක්ෂමයි, ප්‍රමාදයි කියලා අපේ සමාජය තුළ මතයක් ගොඩ නැගිලා තිබෙනවා. ඊළඟට අධිකරණයෙන් දෙනු ලබන තීන්දු තීරණ මත බන්ධනාගාරගත කරලා තිබෙන මේ අපරාධකරුවන්, එහෙම නැත්නම් මත්කුඩු ජාවාරම්කරුවන්, ස්ත්‍රී දූෂකයින් ඒ විතරක් නොවෙයි, මහජන මුදල් කොල්ල කාපු දූෂිතයින් පවා බන්ධනාගාරගතව තමන්ගේ අපරාධ ඉදිරියටත් කරගෙන යෑම සඳහා ආරක්ෂක බංකර බවට පත් කරගෙන තිබෙනවා. අපරාධ මූලස්ථාන බවට අද

බන්ධනාගාර පත් වෙලා තිබෙනවා. ඒ නිසයි අපේ සමාජය තුළ මේ සියලු ආයතන පිළිබඳව තිබෙන විශ්වාසය අද බිඳ වැටිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙවී ගිය සතිය තුළ අරගෙන බලන්න. මේ තිබෙන්නේ, කෝටි 125 ක කුඩු අල්ලයි. ගොඩ බිමෙන් ඇල්ලූ ලොකුම කුඩු තොගය. මේක ඇල්ලුවේ වෙන කොහෙන්වත් නොවෙයි. කොළඹ ආසන්න ප්‍රදේශයකින්. නුගේගොඩ අවට කළුබෝවිල ප්‍රදේශයෙන් තමයි මේ කුඩු තොගය අත්අඩංගුවට ගනු ලැබුවේ. ඒ වාගේම අපේ රටට එන විදේශිකයන් අතර ඉතාම ප්‍රචලිත ක්‍රමයක් බවට පත් වෙලා තිබෙනවා තමන් මේ රට ඇතුළට එනකොට මත් කුඩු ටිකක් රැගෙන එන්න. මේ තවත් ප්‍රවෘත්තියක්. බ්‍රසීල ජාතිකයෙකුගේ බඩෙන් කොකේන ගුලි 72 ක් එළියට. ඒ වාගේම තමයි පකිස්තානුවාගේ ගමන් මල්ලේ කෝටි 05 ක කුඩු. දැන් මේ තවත් ප්‍රවෘත්තියක්. බ්‍රසීල ජාතිකයාගේ බඩෙන් කොකේන් ගුලි 58 ක් එළියට. මේ විධියට අපට දිනපතා අරගෙන බැලුවාම පේන්න තිබෙන ප්‍රවෘත්තිවලින් පෙනී යනවා. ශ්‍රී ලංකාව මත්කුඩු ජාවාරම්කරුවන්ගේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා කියලා. මත්කුඩු බෙදා හැරීම, ඒ විතරක් නොවෙයි ජාත්‍යන්තර වශයෙන් මත් කුඩු බෙදා හැරීමේ කේන්ද්‍රස්ථානයක් විධියටත්, ඒවා ප්‍රතිඅපනයනය කරන තැනක් විධියටත් අද ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වෙනදා මත්කුඩු ගෙනාවේ දකුණු ඉන්දියාවෙන්. තමිල්නාඩුව ආශ්‍රිත ප්‍රදේශවලින්. තලෙයිමන්නාරමෙන්. ඒ වාගේම මන්නාරමින්, කල්පිටියෙන්, මීගමුව වැනි ප්‍රදේශවලින් තමයි රට තුළට මත්ද්‍රව්‍ය ගලාගෙන ආවේ. බෝට්ටු මගින්. නමුත් දැන් මේ මත්ද්‍රව්‍ය ගලාගෙන එන්නේ ප්‍රධාන වශයෙන්ම වරායෙන්.

ඒ වාගේම තමයි ගුවන් තොටුපළෙන් සහ රේගුව කියන මේ තැන්වලින් අද විශාල වශයෙන් රට තුළට මත් කුඩු ගලාගෙන එන්න පටන් අරගෙන තිබෙනවා. මේවා සුළු ප්‍රමාණයන් නොවෙයි, මහ පරිමාණයෙන් තමයි මේවා ගලාගෙන එන්නේ. කන්ටේනර් පිටින් එන්නේ. දැන් පසුගිය කාලයේ අපේ රටට සීනි ගෙන්නුවේ බ්‍රසීලියෙන්. බ්‍රසීලයෙන් එන සීනිවලට වඩා පසුගිය කාලයේ කන්ටේනර් පිටින් කොකේන් එන්න පටන් ගත්තා. ඒ වාගේම පකිස්තානයේ සහ ඇෆ්ගනිස්ථානයේ. මේ කලාපයේ තමයි ප්‍රධාන වශයෙන්ම මත්කුඩු ජාවාරම සිදු වෙන්නේ. විශේෂයෙන්ම මැලේසියාව ඇතුළු මේ කලාපයේ රටවල්වලින් අපේ රට තුළට විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ගලාගෙන ආවා. දැන් එතැනින් ඔබ්බට ගිහිල්ලා අපට පේනවා ලතින් ඇමරිකානු කලාපයේ මෙක්සිකෝව, බ්‍රසීලිය වගේ රටවලින් ඒ වාගේම අප්‍රිකානු මහද්වීපයේ තිබෙන රටවල්වලිනුත් සෝමාලියාව ඇතුළු ඒ රටවල්වලින් අද විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ගෙන එන තැනක් බවට, කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව, අපේ රට පත් වෙලා තිබෙනවා. දැන් ඇත්ත වශයෙන්ම අපි කල්පනා කළේ මේ මත්ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන්ම නගරාශ්‍රිතව පමණයි පරිහරණය වෙන්නේ. මේවා බෙදා හරින්නේ. මේ ජාවාරම සිදු කෙරෙන්නේ කියලා. නමුත් ගිය සතියේ විශාල මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගනු ලැබුවා ත්‍රිකුණාමලයේ සාම්පූර් ප්‍රදේශයේ. ඒ වෙරළබඩ ප්‍රදේශයේ තිබිලා විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගත්තා. ඒ වාගේම තමයි සේරුනුවර ප්‍රදේශයේ විශාල මත්කුඩු ප්‍රමාණයක් අත්අඩංගුවට ගත්තා. එහෙම නම් අද මත්කුඩු තොග වශයෙන් මේ රටට ගලාගෙන එනවා.

මේ තත්ත්වය සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, මෙයින් විශාල සමාජ ව්‍යසනයක් අද සිදු වෙමින් තිබෙනවා. සමාජයේ ඉහළ සිට පහළටම සමස්ත සමාජ දේහයේම පිළිලයක් බවට පත් වෙලා තිබෙනවා මේ මත් උවදුර. විශේෂයෙන්ම මේ මත් කුඩු, කොකේන් කියන ඒවා, ඒ වාගේම හෙරොයින් කියන මත්ද්‍රව්‍යයත්, මත් පෙතිත් අද අපේ සමාජයේ ඉතාම සුලබ දෙයක් බවට පත් වෙලා තිබෙනවා. ඈත ගම්බද ප්‍රදේශවලට ගියාම ඒ ගම්වල අද කුඩා දරුවාගේ ඉඳලා පාසල් දරුවෝ තරුණයෝ විතරක් නොවෙයි. කාන්තාවන් පවා අද මේකට ඇබ්බැහි වෙලා තිබෙනවා. එහෙම නම් මෙය මහ සමාජ ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම නම් මේ සමාජ ව්‍යසනය සම්බන්ධයෙන් අපි සියලු දෙනාටම වගකීමක් තිබෙනවා. මෙය මැඬලන්න, ඒ වාගේම මෙය මර්දනය කරන්න, මෙය පාලනය කරන්න අවශ්‍ය කරන ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. ඒ සඳහා රටේ නෛතිකමය රාමුව ඇතුළේ තිබෙන උපරිම නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. බලාත්මක කරන්න ඕනෑ. මරණ දඬුවම කියන්නේ අලුතෙන් ගේන්න ඕනෑ එකක් නොවෙයි. මරණ දඬුවම, එල්ලා මැරීම කියන එක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ, ඒ වාගේ අපේ නීති සම්පාදනය ඇතුළේ, අපේ දණ්ඩ නීති සංග්‍රහය ඇතුළේ අනිවාර්යයෙන්ම මේක ඇතුළත්ව තිබෙනවා. එහෙම නම් යම් යම්

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

සදාචාරාත්මක හේතු මත, ආගමික හේතු මත එහෙම නැත්නම් වෙනත් සමාජ මතවාද මත මේක අද ක්‍රියාත්මක කරන එක අත්හිටුවලා තිබෙනවා. 1976 තමයි අවසාන වශයෙන් අපි එල්ලා මැරීමක් සිදු කළේ. එයින් පස්සේ එල්ලා මරණ එක නතර කළා. එල්ලා මැරීම සඳහා අත්සන් තබන්න ඕනෑ ජනාධිපතිවරයා. දැන් පසුගිය කාලයේ මේ පිළිබඳව සමාජය තුළ යම් යම් මත ගොඩනැඟුනා. අපරාධ මර්දනය කරන්න බැහැ මරණ දඬුවම ලබා දීමෙන් කියලා. එහෙම නම් ඇමරිකා එක්සත් ජනපදයේ මරණ දඬුවම ක්‍රියාත්මක වෙනවා. ලෝකයේ බොහොමයක් රටවල්වල මරණ දණ්ඩනය ක්‍රියාත්මක වෙනවා. හැබැයි ඒකෙන් අදහස් වෙන්නේ නැහැ ඒ රටවල්වල අපරාධ සම්පූර්ණයෙන්ම පාලනය වුණා කියලා හරි, මර්දනය වුණා කියලා හරි, අපරාධ සිදු වෙන්නේ නැහැයි කියලා. හරි. මෙයින් බලාපොරොත්තු වෙන්නේ අපරාධ කිසියම් ප්‍රමාණයකට මැඩලන්න, මර්දනය කරන්න අවශ්‍ය කරන නීතිය ක්‍රියාත්මක කිරීමයි. සමාජ මතවාදයකින් හෝ ආකල්ප වෙනස් කිරීමකින් හරි, සමාජ ආර්ථික දේශපාලනික කරුණුවලින් තමයි මුළුමනින්ම සමාජයක් තුළ අපරාධ කිසියම් ප්‍රමාණයකට අඩු කරන්න, පාලනය කරන්න පුළුවන් වෙන්නේ. ඕනෑම සමාජයක් තුළ සමාජ විරෝධී ක්‍රියා සිදු වෙනවා. නමුත් අද අපට පේනවා පවතින නීතියට තවදුරටත් මේක පාලනය කරගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අධිකරණය පිළිබඳ විශ්වාසය, ගෞරවය නැති වෙලා තිබෙනවා. ඒ වාගේම පොලීසිය පිළිබඳ විශ්වාසය, ගෞරවය නැති වෙලා තිබෙනවා. බන්ධනාගාර ඇතුළේ අද මේ කටයුතු සිදු වෙන්නේ කොහොමද?

දැන් අපි දැක්කා පසුගිය දවස්වල මේ රටේ ඉමහත් ආන්දෝලනයට තුඩු දුන්නු බැඳුම්කර වංචාවට සම්බන්ධ අර්ජුන් ඇලෝසියස් මහතා සිටිය සිර කුටියේ ජංගම දුරකථන තුනක් අහු වුණා, සිම් කාඩ් පහක් එක්ක. කොහොමද මේවා ඇතුළට යන්නේ. එහෙම නම් බන්ධනාගාර නිලධාරීන්, ජේලර්වරු, බන්ධනාගාර කොමසාරිස්වරයා අනිවාර්යයෙන් මේකේ වගකීම භාර ගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අද ඔවුන්ගේ වත්කම් දිහා අරගෙන බලන්න ඕනෑ. මේ බන්ධනාගාර නිලධාරීන් කොහොමද තට්ටු නිවාස හදන්නේ? සුඛෝපභෝගී ගෙවල් හදන්නේ කොහොමද? යාන වාහන ගන්නේ කොහොමද? තමන්ගේ දරුවෝ ජාත්‍යන්තර පාසල්වලට යවන්නේ කොහොමද? ඒ විතරක් නොවෙයි. ඔවුන්ට විදේශ අධ්‍යාපනය ලබා දෙන්න තරම් මේ අයට කොහෙන්ද මේ වත්කම් ලැබෙන්නේ? ඔවුන්ගේ වැටුපෙන්ද, එහෙම නැත්නම් වෙනත් අයුතු ක්‍රමවලින් මේ අය මුදල් උපයනවාද? විශේෂයෙන්ම බන්ධනාගාරවල සිරගත වෙලා ඉන්න මේ අපරාධකරුවන් සහ මේ නිලධාරීන්, ජේලර්වරුන් අතර, ඒ වාගේම මේ බන්ධනාගාර කොමසාරිස්වරු සහ අනෙක් අය අතර පැහැදිලි සම්බන්ධතාවයක් තිබෙනවා. ඒ නිසා තමයි තවදුරටත් මේ මත්කුඩු ජාවාරම විතරක් නොවෙයි, අනෙකුත් අපරාධ පාතාල අපරාධ පවා සම්පූර්ණයෙන් මෙහෙයවන අපරාධ මෙහෙයුම් මූලස්ථාන බවට අද බන්ධාගාර පත් වෙලා තිබෙන්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි මේ තත්ත්වය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් සාකච්ඡා කරලා තීරණයක් ගත්තා. මේ රටේ දේශපාලන ස්වෛරීත්වය අභියෝගයට ලක් කරන්න කිසිවෙකුටත් පුළුවන්කමක් නැහැ. මේ රට සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේ අයිතිය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඊළඟට කැබිනට් මණ්ඩලයට සහ ජනාධිපතිවරයාට. ඒ තීන්දුව කොහොමද අභියෝගයට පත් කරන්නේ? යුරෝපා සංගමය හරි, එහෙම නැත්නම් මානව හිමිකම් සංවිධානය හරි එහෙම නැත්නම් ජිනීවාවල තිබෙන මානව හිමිකම් කොමිසම හරි වෙනත් අපි අත්සන් කරලා තිබෙන විවිධ සම්මුතීන් තිබෙනවා. මානව හිමිකම් සම්මුතීන් වෙන්න පුළුවන්. ඒ වාගේම සිවිල් අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් වෙන්න පුළුවන්. දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතීන් වෙන්න පුළුවන්. මානුෂික අයිතීන් පිළිබඳ සම්මුතීන් වෙන්න පුළුවන්. එතකොට මේ සම්මුතීන් හරහා රටේ දේශපාලන ස්වෛරීත්වය අභියෝගයට ලක් කරන්න, උල්ලංඝණය කරන්න පුළුවන්කමක් නැහැ. රටේ ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය ගත්තු තීරණය තමයි අද මේ අභියෝගයට ලක් කරලා තිබෙන්නේ.

*"මරණ දඬුවම එපා. රටවල් නවයක් ජනාධිපතිට කියයි."*

දැන් මේ යුරෝපා සංගමය කියනවා මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න එපා කියලා. මේ අය අපට මේ ඇවිල්ලා උපදෙස් දෙන්නේ කොහොමද? මේ අය

පසුගිය කාලයේ කටයුතු කළේ කොහොමද කියලා අපි දැක්කා. විශේෂයෙන්ම ඒ අයගේ නිවේදනයේ කියලා තිබෙන දෙයක් තමයි අධිකරණයේ විනිශ්චය කටයුතුවලදී යම්කිසි වරදක් සිදු වෙන්න පුළුවන්. එහෙම වුණොත් අහිංසකයෙක් නිරපරාදේ මරණයට ලක් වෙන්න පුළුවන් කියලා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒක තමයි ඇත්ත මන්ත්‍රීතුමා

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මම අහන්න කැමැතියි මේ නිවේදනය නිකුත් කරලා තිබෙන රටවල් අද අරගෙන බැලුවාම, යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයත්, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය, ප්‍රංශ, ජර්මන්, ඉතාලි, නෙදර්ලන්ත, රුමේනියා, ඒ වාගේම නෝර්වීජියානු සහ කැනඩා කියන මේ රටවල් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. ශ්‍රී ලංකාව ඇතුළේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරන්න එපා. ඒක ඉතාම අමානුෂිකයි. ඒක සදාචාර විරෝධීයි. ශිෂ්ට සම්පන්න නැහැ. ශීලාචාර නැහැයි කියලා. අපේ මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි කොහොමද ඉරාකයේ ජනාධිපතිවරයා එල්ලා මැරුවේ? ඉරාකයේ ජනාධිපති සදාම් හුසේන්ට -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඔය විධියට තමයි එල්ලා මැරුවේ. ඇමරිකාව කළේ වැරැදි විධියට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

පොඩ්ඩක් ඉන්න. ඔබතුමාට මම ඉස්සෙල්ලා කියන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

බාධා කරන්න එපා. ඉරාක ජනාධිපතිවරයාට එල්ල වුණු චෝදනාව තමයි, බටහිර රටවල්වලින් දාපු චෝදනාව තමයි රසායනික ආයුධ ඉරාකය තුළ නිෂ්පාදනය කරනවා කියලා බොරු වාර්තාවක් ඉදිරිපත් කළා. CNN එකයි, BBC එකයි හරහා. ඒ වාර්තාව පදනම් කරගෙන තමයි ඉරාකයට ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ගිහිල්ලා පහර දුන්නේ. පහර දීලා ඉවර වෙලා අවසානයේ ඉරාක ජනාධිපතිවරයා එල්ලා මැරුවා. එල්ලා මරලා ඉවර වුණාට පස්සේ මොකක්ද කිව්වේ? අන්න බ්‍රිතාන්‍යයෙන් වාර්තාවක් නිකුත් කරලා කිව්වා ඉරාකයේ එහෙම රසායනික අවි නිෂ්පාදනයක් නම් සිදු කරලා නැහැයි කියලා. ඒක පට්ටපල් බොරුවක් කියලා ඒ අයම පිළිගත්තා. එහෙම නම් බොරු වාර්තා සකස් කරලා තමයි ඉරාකය ඇතුළේ මේ අය යුද්ධමය වශයෙන් මැදිහත් වෙලා ඉරාක පාලනය සම්පූර්ණයෙන්ම බිඳ දාලා අන්තිමට ඉරාක ජනාධිපතිවරයා එල්ලා මරන්න කටයුතු කළේ. එහෙම කරපු මේ යුරෝපීය රටවල් තමයි අද අපට ඇවිල්ලා කියන්නේ, මේ අධිකරණයේ විනිශ්චය කිරීමේදී වැරැදි සිදු වෙන්න පුළුවන්.

ඒ නිසා මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරන්නේ නැතුව ජීවිතාන්තය දක්වා සිරගත කරලා තිබෙන එක හොඳයි. ඒ අයට අවශ්‍ය වුණොත් අභියාචනයක් ඉදිරිපත් කරලා ආපහු තමන්ගේ නිරවද්‍යතාවය වෙනුවෙන් පෙනී සිටීමේ අවස්ථාවක් තිබෙනවා කියලා. මේ විධියට රටේ නීතියේ ස්වෛරීත්වය අභියෝගයට ලක් කරන්න බැහැ. Judiciary Severity අභියෝගයට ලක් කරන්න බැහැ. Political Severity එක අභියෝගයට ලක් කරන්න බැහැ. අද මානව හිමිකම් කොමිසන් සභාව ලියුමක් යවලා ආචාර්ය දීපිකා උඩුගම ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා මේක කරන්න එපා. අපේ රටට හොඳ නැහැයි කියලා. ඒ වාගේම අනෙක් පැත්තෙන් මානව හිමිකම් සංවිධාන ජිනීවා ඇතුළු මේ රටවල්, දැන් අපට තර්ජනයකුත් කරනවා. මොකක්ද? GSP Plus සහනය නතර කරනවා කියලා. මෙහෙම ගියොත් අපේ රටේ අපට තිබෙන සියලුම ස්වෛරීත්වයන් අහිමි වෙනවා. දේශපාලන ස්වෛරීත්වය අහිමි වෙනවා. නීතියේ ස්වෛරීත්වය අහිමි වෙනවා. ආර්ථික ස්වෛරීත්වය අහිමි වෙලා ගොඩක් කල්. ඒක නිසා තමයි බටහිර රටවල්, යුරෝපීය රටවල් අපට බලපෑම් කරන කොට ඒවාට අපට අවනත වෙන්න වෙලා තිබෙන්නේ. අහවල්, අහවල් සම්මුතියට අත්සන් කරලා තිබෙනවා. ඒ නිසා ඔයගොල්ලන්ට ඕනෑ ඕනෑ විධියට රටේ නීතිය ක්‍රියාත්මක කරන්නත් බැහැ. දේශපාලන තීන්දු තීරණ ක්‍රියාත්මක කරන්නත් බැහැ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ මේ තත්ත්වය මරණ දඬුවම

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ක්‍රියාත්මක කරනවාද නැද්ද කියන එක සම්බන්ධයෙන් රට තුළ සාකච්ඡාවක් සංවාදයක් ඇති කරන එක හොඳයි. නමුත් බටහිර රටවල්වල හරි යුරෝපීය රටවල්වල හරි බලපෑමට, ඊනියා මානව හිමිකම් සංවිධානවල, රාජ්‍ය නොවන සංවිධානවල බලපෑමට යට වෙලා අපේ රටේ දේශපාලන ස්වෛරීත්වය අහිමි කර ගන්න බැහැ. දේශපාලනික වශයෙන් තීන්දු තීරණ ගැනීමේ බලය තිබෙන අපේ රටේ අයිතියයි මේ අභියෝගයට ලක් කරන්නේ. ඒ නිසා සමහරු මේක පෙන්වන්න පුළුවන් ඔබතුමාත් දැන් මේ මරණ දඬුවම වෙනුවෙන් පෙනී ඉන්නවා. මේවා කියන්න ගියාම අපි අලුගෝසුවෝ වෙනවා. අපව අලුගෝසුවෝ කරනවා. ඒකයි වෙන්නේ. මේක ඇතුළේ මත්කුඩු ජාවාරම කරගෙන යන 219 කගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. මේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් ජනතාවගේ ජීවත් වීමේ අයිතිය ගැන කථා කරන්නේ නැහැ. ඒ අපරාධකරුවන්ගේ අයිතිය ගැන කථා කරනවා. සමහරු උපුටා දක්වනවා වැලිකඩ බන්ධාගාරය ඉස්සරහා තිබෙන, මොකක්ද? "*සිරකරුවෝද මනුස්සයෝය*" කියලා. ඔව්. සිරකරුවොත් මනුස්සයෝ තමයි. ඒ වාගේම තමයි එළියේ ඉන්න දෙකෝටි විසි ලක්ෂයක් මේ රටේ ජනතාවත්, ඒ වාගේම මනුස්සයෝ තමයි කියලා අපි කියන්න ඕනෑ. ඒ අය ගැනද බලන්න ඕනෑ. එහෙම නැත්නම් මේ 219 දෙනා ගැනද?

ඒ නිසා මේ අපරාධකාරයෝ මේ ආකාරයට බන්ධනාගාර ඇතුළේ ඉඳගෙන අද අපරාධ මෙහෙයවන්නේ, සැලසුම් කරන්නේ, මත්කුඩු ජාවාරම කරන්නේ, කුඩු කන්ටේනර් පිටින් අද රට ඇතුළට ගේන්නේ, බෙදා හරින්නේ, මේවා ඇතුළට අද ජංගම දුරකථන යන්නේ කොහොමද? එහෙම නම් මේකට කවුද වග කියන්න ඕනෑ? බන්ධනාගාර පරිපාලනය සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මේ නිලධාරීන් මේක පිටුපස්සේ ඉන්නවා. ඒක නිසා තමයි වෙලේ සුදාට පුළුවන් වෙලා තියෙන්නේ ඒක ඇතුළේ ඉඳගෙන මත්කුඩු ජාවාරම කරන්න. සුසෙයින්ට පුළුවන් වෙලා තියෙන්නේ ඒ මත්කුඩු ජාවාරම මෙහෙයවන්න. ඒ නිසා අපි යෝජනා කරනවා මරන්න බැරි නම්, මරනවාද නැද්ද කියන එක, එල්ලනවාද නැද්ද කියන එක අපි තීරණය කරමු. ඒක අපට තිබෙන අයිතියක්. අපේ රටේ නීතිය කාටද අභියෝග කරන්න පුළුවන් වෙන්නේ? ඒක නිසා ඒක සාදාචාරාත්මකද නැද්ද, ඒක ශීලාචාරද ශිෂ්ට සම්පන්නද නැද්ද කියලා අපි වෙනම සාකච්ඡාවක් කරමු. ඒ අයිතිය අපට තිබෙන්න ඕනෑ.

අද ජූලි 17. 1954 තමයි මේ රටේ හිටපු අවසාන ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා සෝල්බරි ස්වාමි මේ රටෙන් පිටත් වෙලා ගියේ. දැන් අපට බැලුවාම පේනවා ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා පිටත්ව ගියාට තවමත් බ්‍රිතාන්‍ය නියෝගවලට අපි වැඩ කරනවා. යුරෝපයේ නියෝග ආවාම අපේ කකුල් වෙව්ලනවා. අපි Executive Powers තියෙනවා කියලා කිව්වාට, විධායක ජනාධිපති බලතල තිබෙනවා කිව්වාට ජනාධිපතිවරයා තනියම මේ තීරණය ගන්න ගියේ නැහැ. මුළු කැබිනට් මණ්ඩලයම එකතු වෙලා සාමූහික තීරණයක් ගත්තා. ඒකට ඔක්කෝම අත ඉස්සුවා. සියලු දෙනා ඒකට කැමති වුණා. දැන් ඇවිල්ලා එක එක්කෙනා, එක එක කථා කියනවා. ඒ නිසා මේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් ජනතාවගේ මේ ස්වාධීනත්වයයි, ස්වෛරීත්වයයි මේ බටහිර රටවල් යුරෝපයේ රටවල් ඇතුළු අනෙක් රටවල් අභියෝගයට ලක් කරන්නේ. එහෙම නම් අපි මේකට මොකක්ද කරන්න ඕනෑ. අනිවාර්යයෙන්ම අපේ නීතියේ කොටසක් වුණු මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ රජ කාලයේ ඉඳලා මේ දණ්ඩනය ලෝකයේ හැම රටකම තිබෙනවා. දණ්ඩනය කියන එක. ඒවායේ කෲරත්වය එහෙමම තමයි. එල්ලලා මරනවා. කස පහර දෙනවා. දෙකට කපනවා. බෙල්ල කපනවා. විවිධ ස්වරූපවලින් කරනවා. එළිමහනේ කරන ඒවා තිබෙනවා. පොදුවේ ජනතාවට බලා ගන්න. මේ හැම එකක් හරහාම බලන්නේ කිසියම් විධියකට මේවා පාලනය කරන්න.

ඒ නිසා මේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වාගේම පැහැදිලිවම අපි කියන්න ඕනෑ, බන්ධනාගාර පරිපාලනය සම්පූර්ණයෙන්ම මේ වගකීම දරන්න ඕනෑ. එහෙම නම් මේවා තුළ ඉන්න බරපතළ අපරාධකරුවන්, මත්කුඩු ජාවාරම්කරුවන් වෙනම රඳවා තබන්න කටයුතු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඔවුන්ට බාහිර ලෝකයත් එක්ක තිබෙන සම්බන්ධතා පුළුවන්තරම් අවම කරන්න ඕනෑ. ඔවුන් අතට ජංගම දුරකථන යනවා නම්, ඔවුන්ට සියලු සැප පහසුකම් ලැබෙනවා නම්, ඒ වාගේම අනෙක් පැත්තෙන් ඔවුන් මේවා ඇතුළේ ඉඳගෙන මේවා සැලසුම් කරනවා නම් අද අනෙක් සිරකරුවන් එක්කම ඔවුන් රඳවා තබන එක සම්පූර්ණ වැරැදියි. ඔවුන් වෙනම ජනශුන්‍ය ප්‍රදේශයක විශේෂ බන්ධනගාරවල ඔවුන් රඳවා තබන්න ඕනෑ විතරක් නොවෙයි, බාහිර ලෝකයත් එක්ක

තිබෙන සියලු සම්බන්ධතා නතර කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ ඥාති මිත්‍රාදීන් වෙන්න පුළුවන්, වෙනත් පුද්ගලයින් වෙන්න පුළුවන් ඔවුන් බලන්න තිබෙන අවස්ථා පුළුවන්තරම් අවම කරන්න ඕනෑ. සිරකරුවන්ගේ අයිතිවාසිකම් තමයි මේ දවස්වල වැඩිපුරම කථා කරන්නේ. මේ අහිංසක පාසල් දරුවන්ගේ සමස්ත සමාජයේම විශාල ඛේදවාචකයක් බවට පත් වෙලා. පවුල් ජීවිත කඩා වැටිලා. දරුවෝ කාලකණ්ණි වෙලා. මිනිස්සු මත්කුඩු ගහනවා. පාසල් දරුවෝ මත්පෙති බොනවා. එහෙම නම් මේ ඛේදවාචකය පිළිබඳව අද අපට වගකීමක් තිබෙනවා. මේ නීතිය ක්‍රියාත්මක කරලා හරි මේක පාලනය කරන්න අවශ්‍ය කරන පියවර ගන්න ඕනෑ. ඒ නිසා මම ඉල්ලා සිටින්න කැමැතියි මේ යෝජනාව සම්බන්ධයෙන් අනිවර්යෙන්ම සමාජයේ අවධානය යොමු කරන්න ඕනෑ. දැන් සමහරු දෙලොවක් අතර. කලින් ඔක්කෝම කිව්වා හරි ෂෝක් වැඩේ කරමු කියලා. මම දැක්කා හලාවත, පුත්තලම ප්‍රදේශයේ කාන්තාවක් ඊයේ ඉදිරිපත් වුණා. මම ඕක නොමිලේම කරන්නම් කියලා. එල්ලන වැඩේ. අලුගෝසු වැඩේ මම නිකන්ම කරන්නම්, මට මුකුත් වැටුපක් අවශ්‍ය නැහැ. වෙනත් වරප්‍රසාද අවශ්‍ය නැහැ කියලා. ඒ තරම් සමාජ මතයක් අද ඇවිල්ලා තිබෙනවා මේක කරන්න කියලා. ඒක නිසා මේ සම්බන්ධයෙන් ආපහු වතාවක් දෙලොවක් අතර ඉන්නේ නැතුව, මේ ගැන වාද විවාද කරන්නේ නැතුව අපි තීරණයක් ගන්න ඕනෑ. පළමුවැනි දේ තමයි බන්ධනාගාර ඇතුළේ මේ සිදු වන අකටයුතුකම් සහ බන්ධනාගාර අපරාධ මූලස්ථාන බවට පත්වීම වළක්වන්න අවශ්‍ය පියවර ගන්න ඕනෑ.

ඒ වාගේම මම කියන්න ඕනෑ අපේ පොලීසියේ කරලා තිබෙන සමහර කටයුතු නිසාත් මේ අහිංසකයෝ දංගෙඩියට යන්න පුළුවන්. මත්කුඩු ග්‍රෑම් 5 ටත් අල්ලලා, මරණීය දණ්ඩනයට දාලා තිබෙනවා. කවුද ගිහිල්ලා මේ අයට මත්කුඩු පැකට් එකක් දාලා, අධිකරණයට දාලා, ඊට පස්සේ නඩු තීන්දු දීලා ඒ අයව මරණීය දණ්ඩනය දක්වා ගෙනියනවා. මේ ආකාරයට පොලීසියේ කටයුතු සම්බන්ධයෙනුත් බරපතළ ගැටළුවක් තිබෙනවා. කෙසේ නමුත් අද රටේ නීතිය, සාමය සහ අධිකරණය, බන්ධනාගාර පිළිබඳව තිබෙන විශ්වාසය පළුදු වීම නිසා තමයි මේ රටේ පොදු මහත් ජනතාවගේ බහුතරයක් අද ඉල්ලා සිටින්නේ මේ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ නිසා මම කියන්න කැමැතියි මේ මරණ දඬුවම එපා කියන අයටවත් එහෙම නැත්නම් මානව හිමිකම් ගැන කථා කරන අයටවත් නොවෙයි. රටේ පොදු මහත් ජනතාවගේ සුභ සිද්ධිය ගැන සිතා බලා මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න අවශ්‍යයි. කිසිදු ආකාරයක බාහිර බලපෑමකට යටත් වෙන්නේ නැතුව රටේ නීතියේ, ස්වෛරීත්වයත්, දේශපාලන ස්වෛරීත්වයත් ආරක්ෂා කරගෙන තීන්දු තීරණ ගැනීමේ අයිතිය අපි සතුව තබා ගත යුතුයි කියන එක යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.11]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

එල්ලන්න කියනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ කථාව හරි. මම ඒක කියන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාවේ කරුණු ගත්තාට පස්සේ අලුත් කාරණා නොවෙයි. මේ යෝජනාවේ තිබෙන කරුණු දැනට රටේ නීතියේ තිබෙන කරුණු. ඒ නිසා නීතියේ තිබෙන කරුණු ඉෂ්ට කරන එක, ක්‍රියාත්මක කරන එක අදාළ බලධාරීන්ගේ යුතුකම සහ වගකීම. නෛතික බැඳීම. ඒ පිළිබඳව අපි වාද කරන්න යන්නේ නැහැ. නමුත් අපට පේනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේ කාලෙන් කාලෙට වුයින්ගම් එනවා. අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම නිසැක වශයෙන්ම කියනවා මේ මරණීය දණ්ඩනය කිව්වාට මේක ක්‍රියාත්මක කරන්නේ නැහැ. මේ පට්ට බොරුවක් මේ කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහ බැංකු බැඳුම්කර සිද්ධියෙන් මේ සමාජය වෙලා ගත්තා, අවුරුදු 2 ½ කට ආසන්න කාලයක්. ඒකෙන් දිව්වා. ඊට පස්සේ විවිධ විවිධ ජවනිකා කරලියට දාලා, විවිධ විවිධ රංගනයන් දාලා අරගෙන යනවා. විජයකලා රංගනය ආවා. ඊට පස්සේ Times පුවත්පතේ රංගනය ආවා. ඊට පස්සේ පෙට්‍රල් පිළිබඳව. අඩුම ගණනේ පෙට්‍රල් වැඩි කිරීමට අදාළව සංවාදයක් ඇති කරගෙන ඒක කරගන්න බැරි වුණු ආණ්ඩුව. මොනවාද මේ කියන්නේ? ඒක පිළිබඳව සංවාදයක් ඇති කළා. ඊට පස්සේ ආවා මේ ඔක්කෝටම විසඳුම. මොකක්ද? හිට්ලර්. විවිධ කථා නිර්මාණය වෙනවා.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

විජයකලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. විජයකලා රංගනය ආවා. එතකොට මම මේ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජනාධිපතිවරයාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් අපට අදහසක් තිබෙනවා. දැන් සාමාන්‍ය සමාජයේ කථා වෙනවා මොකක්ද මේ ජනාධිපති ධූරය කියලා. ඇත්ත වශයෙන්ම ඊයේ එක්කෙනෙක් කියනවා අඩුම තරමින් මේක ග්‍රාම සේවක ධූරය තරම්වත් වටින්නේ නැති තත්ත්වයට දැන් මේ ජනාධිපති ධූරය යනවා දැයි කියන සැකයක් තිබෙනවා කියලා. අපි කථා කරමු නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, නිසැක වශයෙන්ම මේක ක්‍රියාත්මක වුණොත් ඔබතුමාත් ඉන්නවා. මමත් ඉන්නවා. එදාට බලමු. හැබැයි මම කියනවා මේ තිබුණු ක්‍රියාවලිය අස්සේ කවදාවත් මේක ක්‍රියාත්ම කරන්නේ නැහැ. මේ බොරු කථාවක් මවා පාලා, මේ සමාජයේ තිබෙන ප්‍රශ්න ටික අමතක කරන එක තමයි මේ කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හදන්නේ ඉන්න හිරකාරයෝ ටික එල්ලන්න නේ? මේ මන්ත්‍රීතුමා හොඳ ප්‍රවේශයකට ආවා. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇති වුණු වැරැදිවලට අදාළව අපි කියනවා, මේ හිරේ ඉන්න අව්වු විඳින සිරකරුවන් සම්බන්ධයෙන් අපට අදහසක් තිබෙනවා, මේ සමාජයට අදහසක් තිබෙනවා ඇත්ත වශයෙන්ම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මරණීය දණ්ඩනයට ලක් වී සිටින සිරකරුවන් ඇත්තටම වැරැදිකරුවන් වෙන්නැති. නමුත් මේ සමාජයට අදහස් තිබෙනවා කොන්ත්‍රාත්තුවට මේ වැඩේ කරපු අය, ජාවාරමට මේ වැඩේ කරපු අය අද අව්වු විඳිනවා. ඇත්ත මහ මොළකරු. ඇත්තටම මේ මත්ද්‍රව්‍ය මෙහෙයවපු තැනැත්තා තවමත් නිදැල්ලේ ඉන්නේ. අපි ආන්දෝලනාත්මක එක් උදාහරණයක් කියනවා. පසුගිය ආණ්ඩුව කාලයේ එක කන්ටේනරයක් අත්අඩංගුවට ගත්තා. පසුගිය ආණ්ඩුව කාලයේ කන්ටේනරයේ තිබුණු මත්කුඩු ප්‍රමාණය රොටි පුච්චන්න තරම් ප්‍රමාණවත් මත්කුඩු ප්‍රමාණයක්. එතකොට මේ මත්කුඩු නිදහස් කරන්න කියලා වාප්පු ලිපිකරුවෙකුට ලිපියක් යවපු දේශපාලඥයා කවුද? කරුණාකරලා කියන්න. ඒක පිටිපස්සේ හිටපු දේශපාලඥයා කියන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ජනාධිපති උපදේශක.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට අද ඒකට වන්දි විඳින්නේ, ඒකේ නඩුවට ලක් වෙලා ඉන්නේ ඇත්ත මහමොළකරුද?

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

දී.මූ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දී.මූ. එතකොට ඒ මහමොළකරු තවම නිදැල්ලේ ඉන්නවා. කොන්ත්‍රාත් එකට වැඩේ කරපු මිනිහාව ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට ලක් කරලා තිබෙනවා. එයාව එල්ලන්න කියලා දැන් රටේ විධායකය කියනවා. මම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේකයි කථාව. මේ මත්කුඩු ජාවාරමේ ප්‍රශ්නය විතරක් නොවෙයි. මේ මත්කුඩු ජාවාරාම අපරාධයක්. ඒ අපරාධයට වන්දි ගෙවන්න ඕනෑ, ඒ අපරාධයට අපරාධකරුවන්ට දඬුවම් කරන්න ඕනෑ. ඒක මෙහෙයවන කට්ටිය ඉන්නේ පාර්ලිමේන්තුවේ කැබිනට් එකේ. එහෙම නම් ඒ අයට මරණීය දණ්ඩනය දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් රටේ මත්කුඩු ඇතුළුව අපරාධ රැල්ල වැඩියි කියන සංවාදය යනවා. හැම චැනල් එකකම. මමත් පෞද්ගලිකවම චැනල් දෙකකට ගියා. හැම චැනල් එකකම පොලිස්පති දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා දේශපාලඥයන් එක්ක වාඩි වෙලා දැන් මේ අපරාධ රැල්ල

ගැන කථා කරනවා. අපරාධ රැල්ල අඩුයි කියලා පොලිස්පති කියනවා. අපරාධ රැල්ල අඩුයි කියලා තමයි පොලිස්පති කියන්නේ. හැබැයි පොලිස්පති අපරාධ රැල්ල අඩුයි කිව්වාට එදත් රොටි පුච්චන්න මත්කුඩු ගෙනාවා. අදත් රොටි පුච්චන්න මත්කුඩු අල්ලනවා. මත්කුඩුවල අඩුවීමක් කොහේද තිබෙන්නේ? මත්කුඩුවල අඩුවීමක් නැහැ. හැබැයි සමස්ත අපරාධවල අඩුවීමක් යැයි කියලා කියන්නේ මොකක්ද? එහෙම නම් මේ සමාජයේ අපට පේන්න ඕනෑ, මේ සමාජයේ පැතිකඩක් ලෙස මේ අපරාධ අඩු වී ඇති ප්‍රමාණය. ඇයි මේ වාගේ සංවාදයක් ඇති වෙන්නේ? ඇයි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මේ වාගේ රීති අත්හිටුවීමක් ගේන්න සිද්ධ වෙන්නේ? මේ සමාජයේ අපරාධ රැල්ලේ වැඩිවීමක් එන්න එන්නම තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ මාතෘකාව අල්ලගෙන තිබෙන්නේ මැදින්. මේ මාතෘකාවේ එක කොටසක් අපි අමතක කරලා තිබෙනවා. ඇයි? මේ රටේ නීතිය සහ විධානය සමාන නැහැ. මේ රටේ නීතිය සහ විධානය ක්‍රියාත්මක භාවයේදී සමාන නැහැ. ඒක නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. අද වරප්‍රසාද ලත් කණ්ඩායකමක් ඉන්නවා. ඒ අයට නීතිය අසමානව සලකනවා. නීතිය පක්ෂපාතී වෙලා සලකනවා. ඒක නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද නීතිය ක්‍රියාත්මක භාවිතාව අස්සේ සාමාන්‍ය ජනතාව, පාතාලය මේ නීතිය අතට ගන්න උත්සාහ කරමින් තිබෙන්නේ. මේ නීතිය අතට අරගෙන කටයුතු කරන්න වෙලා තිබෙන්නේ. එක්තරා කල්ලියකට මේ නීතිය සලකන එක පක්ෂපාතී වෙලා.

ඒක නිසා තමයි අපි දකින්නේ රටේ මහජන දේපළ මංකොල්ල කාපු කෙනා අපරාධකරුවෙක්. රටේ මහජන දේපළ මංකොල්ල කෑවා නම්, ඒක අපරාධයක්. ඒකට තමයි පොදු දේපළ පනත තිබෙන්නේ. ඒකට තමයි පසුගිය දවස්වල ඇති තරම් අණපනත් සම්මත කර ගත්තේ. ඒ සම්මත කර ගත්තේ අපරාධකාරී ක්‍රියාවන් නතර කරන්න. හැබැයි අද සිද්ධ වෙනවාද? අද ඒ මහමොළකරුවෝ ටික අහු වුණාට පස්සේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක්, කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක් අපරාධයකට හසු වුණාට පස්සේ මොකක්ද වෙන්නේ? අපට පේනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජනතාවට අත වනාගෙන කඩුවෙල උසාවියට යනවා. අනේ මෙන්න රිමාන්ඩ් වුණාට පස්සේ රෝද පුටුවෙන් යනවා. රෝද පුටුවෙන් ගිහිල්ලා එයා බන්ධනාගාර රෝහලේ දවසක් ඉඳලා අතන මහ රෝහලේ මර්චන්ට් වෝඩ් එකට එනවා. මෙන්න මේ රටේ මහජන දේපළ මංකොල්ල කාපු අපරාධකරුවන්ට සලකන විධිය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්ෂ 2015 වනකොට මූල්‍ය කළමනාකරණය අතින්, දූෂිත ක්‍රියාවලීන් අතින් අපේ රට ලෝකයත් එක්ක සංසන්දනය කරද්දී සිව්වන ස්ථානය ගත්තා. ඇයි? රාජ්‍ය මූල්‍ය හොඳ නැහැ. රාජ්‍ය මූල්‍ය හොඳ නැත්තේ ඇයි? රාජ්‍ය මූල්‍ය හොකරම් කළා. කවුද හොකරම් කළේ? කැබිනට් මණ්ඩලයේ ඇමැතිවරු. පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු. ඒ අය හොරකම් කරද්දී ඒ හොරකමට අද දඬුවම් දීලා තිබෙන්නේ. මේ වර්තමාන ආණ්ඩුව පොරොන්දු දීලා ආවේ හොරු අල්ලනවා කියලා. හොරු අල්ලනවා කියලා පොරොන්දු දීලා ආපු ආණ්ඩුව අවුරුදු තුනයි මාස ගණනක් ගිහිල්ලා හොරු දෙන්නයි ඇල්ලුවේ. කවුද? සිල්රෙදි හොරු. (බාධා කිරීමක්) සිල්රෙදි හොරකම් කරපු, මිලියන 600 ක් හොරකම් කළා යැයි කියන ලලිත් වීරතුංගයි, අනූෂ පැල්පිටවයි විතරයි අත්අඩංගුවට ගත්තේ. ඒ දෙන්නාත් අද ඇප අරගෙන ඕස්ට්‍රේලියාවේ ඉන්නේ. ඒකට නිසි පරිදි ඇප අරගත්තා යැයි කියනවා. ඒ දෙන්නාත් අද ඉන්නේ ඕස්ට්‍රේලියාවේ. අපි කියනවා ජනවාරි 08 වෙනිදා දීපු පොරොන්දුව, අගෝස්තු 17 වැනිදා දීපු පොරොන්දුව අද කෝ? ඒ අපරාධකරුවන්ට නිසි දඬුවම් දීලාද? දීලා නැහැ. අද සිද්ධ වෙන්නේ එකිනෙකාගේ පිට කසා ගැනීම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඇයි විශේෂ අධිකරණය පරක්කු කළේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කඩේ බඩු හොඳ නැද්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කාගේ උවමනාවටද විශේෂ අධිකරණය පරක්කු කළේ?

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

කඩේ බඩු හොඳ නැද්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

විශේෂ අධිකරණය පරක්කු කළේ චේතනාන්විතව. චේතනාන්විතව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රටට විහිළු සපයන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අනේ මේ ඔබතුමා ඉන්න. ඇත්ත කියනකොට -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඇයි කඩේ බඩු හොඳයි කිව්වේ. දැන් අවුරුදු තුනක් ගියාට පස්සේද තේරුණේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කඩේ බඩු ෂුවර් නැහැ කියලා කිව්වේ. වචනය වරද්ද ගන්න එපා. කඩේ බඩු ෂුවර් නැහැ කියලා කිව්වේ. අපේ කථා හොඳට අහගෙන ඉන්න. කඩේ බඩු ෂුවර් නැහැ කියලා කිව්වේ. අපේ ලාල්කාන්ත සහෝදරයා නුගේගොඩ රැළියේදී කිව්වේ. අපට ඒවා හොඳට මතකයි. ඒ නිසා -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔබතුමන්ලාගේ කථා දැන් හොඳට කියනවා පෙරටුගාමී කට්ටිය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මිනී මරපුවාත් මතකයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඇයි විශේෂ අධිකරණයට කලබල වෙන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කියාගෙන ආවේ, ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි කිව්වා මේ රටේ මූල්‍ය අපරාධ කරපු දූෂිතයන්ට දඬුවම් දෙන්න විශේෂ අධිකරණයක් ගේන්න කියලා. අවුරුදු තුනයි මාස ගණනක් ගිහිල්ලා තමයි දැන් කාමරේ සුද්ධ කරන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

JVP කාලේ මරපු අයට මොකද කරන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් කාමරේ සුද්ධ කරන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බස් ගිනි තියපුවාට. ID එකතු කරපුවාට මොකද කරන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියනවා මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හැඳුනුම්පත් ටික එකතු කළා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නේ අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරද්දී මේ විශේෂ අධිකරණයට එන්න ඕනෑ නඩුකර කිහිපයක් තිබෙනවා. ඒ නඩුකර කිහිපය තමයි -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මේ අය විජේවීර මහත්තයාට සලකපු විධිය හෙට අනිද්දා නෝනා උසාවියේදී කියනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විශේෂ අධිකරණයේ විභාග වෙන්න ඕනෑ නඩු කිහිපයක් තිබෙනවා. පළමුවැනි නඩුව මහ බැංකු බැඳුම්කර වංචාව. ඒක හොඳයිද? ඔබතුමන්ලා අනුමත කරනවාද? ඒක අහන්න ඕනෑ මේ විශේෂ අධිකරණයෙන්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔබතුමන්ලා කරපුවා අනුමත කරන්නෙත් නැහැ. ඒවා අනුමත කරන්නෙත් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ විතරක් නොවෙයි. අර මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ඉඳලා ගෝඨාභය රාජපක්ෂ - අර අප්පච්චිගේ සොහොන හදන්න, අන්න විදයම් කරලා තිබෙනවා ආණ්ඩුවේ සල්ලි. ඒවා ගැන අහන්නත් මේ විශේෂ අධිකරණයේ ඉඩක් තියෙන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒවා ඔප්පු කරලා පෙන්වන්න කෝ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බැසිල් රාජපක්ෂ මහත්තයලා අර මල්වානේ ඉඩම් අරගෙන දැක්කාද? පුෂ්පා රාජපක්ෂලා මුල්ගල තියපු ඉඩම්. කෝ ඒවාට?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බට වගයක් දුන්නාම උසාවියේ ගිහිල්ලා නඩු දානවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අන්න ඒවාට අද විශේෂ අධිකරණයේ ඉඩක් දෙන්න ඕනෑ. ජොන්ස්ටන් ප්‍රනාන්දුලා ඒ විතරක් නොවෙයි, ඔය ඉන්න ඒකාබද්ධ විපක්ෂයේ කල්ලියේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා. ඔබතුමාත් මාතෘකාවෙන් පිට පයින්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කල්ලියේ අතිමහත් ප්‍රමාණයක් අද අපරාධ කරලා. මූල්‍ය අපරාධ කරලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමන්ගේ නායකයා මරපු අය හොයා ගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ මූල්‍ය අපරාධ කරලා, ඒ මූල්‍ය අපරාධවලට අද වන්දි ගෙවන්නේ නැතුව අද (බාධා කිරීමක්) ඒක තමයි අපරාධ කියලා කියන්නේ. ඒක නිසා මත්කුඩු කියන්නේ අපරාධ අතර එකක්. ඒ විතරක් නොවෙයි. මේ රටේ මහජන දේපළ මංකොල්ල කාපු කුප්‍රකට හොර නඩයක් ඉන්නවා. ඒ නඩය ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. ඒ නඩය ඉන්නේ ඒකාබද්ධයේ. ඒ නඩය ඉන්නේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මහජන දේපළ ගිනි තියපුවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මෙන්න මේ කාරණා ගත්තාට පස්සේ අපරාධ රැල්ල කියන එක, එක තැනකට කොටු කරන්න එපා. මත්කුඩු කියන්නේ අපරාධයක්. ඇත්ත. හැබැයි මේ සැබෑ අපරාධකරු, මගේ තර්කය තමයි මේ සැබෑ අපරාධකරුවෝ ඉන්නේ තිරයෙන් පිටුපස. ඒ අයව අද අහු වෙලා නැහැ. කොලොන්නාව පැත්තේ හිටපු මත්ද්‍රව්‍ය මෙහෙයවපු අපරාධකරුවන්ට අද මොකද වෙලා තිබෙන්නේ? ඒ අය තවම නිදැල්ලේ ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මේ රටට මත්කුඩු ගෙන්නපු - අපි අහනවා එක්තරා වෙලාවකදී හමුදාව, STF එක දාලා ඔය ගම්පහ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමැතිවරයෙක් අත්අඩංගුවට ගන්න හදනකොට වොපර් එකෙන් ගිහිල්ලා මහින්ද රාජපක්ෂ මහත්තයා වත්තේ බැහැලා බේර ගත්තේ නැද්ද කියලා තමුන්නාන්සේලාගෙන් අපි අහනවා. ඒ වාගේ කැත, නින්දිත ඉතිහාසයක් තිබෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කොහේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ඒවා දන්නේ නැහැ. අනේ නිකන් යන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ නම ප්‍රකාශ කරන්න මෙතුමාට අයිතියක් නැහැ. නිමල් ලාන්සා ඇමැතිවරයා අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අන්න ගොට්ටා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක හැන්සාඩ් එකෙන් සහ අපේ මාධ්‍ය වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. මෙතුමාට අයිතියක් නැහැ. මේගොල්ලෝ මංකොල්ල කාපුවා ගැන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. නම ප්‍රකාශ කරන්න එපා ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේගොල්ලෝ -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වොපර් එකෙන් ගිහිල්ලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළාට කමක් නැහැ. නමුත් ඒ යථාර්ථය මේ රටේ ජනතාගේ හෘදය සාක්ෂියේ තිබෙනවා. එදා වොපර් එකෙන් ගිහිල්ලා ඒ කුඩු මුදලාලිලාව - (බාධා කිරීම්) Election Campan එකට සල්ලි පොම්ප කළේ කවුද? මාතලේ ඉන්න මන්ත්‍රීවරයෙක්. එයා තමයි මේ රටට එතනෝල් ගෙන්වන්න තමුන්නාන්සේලා ලයිසන් එක දීලා තිබුණේ. මාතලේ මන්ත්‍රීට. තේරුණාද?

ඒක නිසා ඕවා කථා කරන්න ආවොත් (බාධා කිරීම්) නිකන් ඉන්න. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මේ රටේ අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරද්දී මහමොළකරුවෝ තිරය පිටුපස ඉන්නේ. ඒ අය තවමත් නිදැල්ලේ ඉන්නේ. අපි කියන්නේ අපරාධ මර්දනය කරන්න, දූෂණය මැඩලන්න ආපු මේ වත්මන් ආණ්ඩුවත් අද හොරුන් රකින තැනට ඇවිල්ලා. මේ රටේ මහජන දේපළ මංකොල්ල කාපු මිනිස්සුන්ගෙන් සල්ලි අයකරගෙන මේ රටේ ණය ගෙවනවා කියලා මේ ආණ්ඩුව බලයට පත් වුණේ. අද එහෙම කියලා ඒ අයව සුද්ධ කරලා මහජනතාගේ පැත්තෙන් සුද්ධයක් තමයි මේ දාන්නේ. බදු බර පටවලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අහනවා අද -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් සතුටුයිද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අද රාජපක්ෂවරුන්ගෙන් කාටද අධිචෝදනා පත්‍ර දීලා තිබෙන්නේ? එකම එක්කෙනාටයි දීලා තිබෙන්නේ. අද සිරිලිය ගිණුම හරහා ආපු ශිරන්ති රාජපක්ෂ මහත්මියට මුකුත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මාතෘකාවට කථා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපෙන් අහගන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා සිරිලිය ගිණුම ගැන කථා කරන්න එපා. තමුන්නාන්සේලා තරම් මිනී මරපු, ID එකතු කරපු, මේ තරම් විනාශයක් කවුද කළේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ රටේ සිරිලිය ගිණුම හරහා මුදල් වංචා කරපු මේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා. මාතෘකාවට අදාළව කථා කරලා අවසන් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද නිකන් කටඋත්තරයක් විතරයි අරගෙන තිබෙන්නේ. හොරු රකින ආණ්ඩුවක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ තරම් විනාශයක් ජනතා විමුක්ති පෙරමුණ නොවෙයිද කළේ? මිනිස්සු මරලා. ජාතික දේපළ විනාශ කරලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපේ දේශපාලන ප්‍රතිරූපයක් තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මිනිස්සුන්ගේ රත්තරන් බඩු ටික මංකොල්ල කාලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපේ වර්තමාන භාවිතයට විවේචනයක් දෙන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

Fund එකේ සල්ලි තිබෙන්නේ එදා හොරකම් කරපු රත්තරන්වලින් ගත්තු සල්ලි. 89 හොරකම් කරපු රත්තරන්වලින් ගත්තු සල්ලි තමයි තවම පක්ෂයේ Fund එක.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, අපට අතීතයට විවේචන ඇති. නමුත් අපි අහනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වර්තමාන දේශපාලන භාවිතාව සම්බන්ධයෙන්. අපේ වර්තමාන දේශපාලන නායකයන්ට තිබෙන විවේචන මොනවාද? අපට මුකුත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මේක මත්ද්‍රව්‍ය සහ එල්ලා මැරීම. මාතෘකාවට අදාළව කථා කරලා අවසන් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපරාධ. එල්ලා මැරීමට අදාළව මම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එල්ලා මරන්න ඕනෑ අය ඉන්නේ, පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩලයේ. එල්ලාවලව එල්ලන්න ඕනෑ නැහැ. අපි කියන්නේ ඒකයි. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි තමුන්නාන්සේට එකක් කියනවා. මේ අපරාධකරුවන් පිටුපස සිටින සැබෑ මහමොළකරුවන්, සැබෑ ක්‍රියාදරයන් අපි අල්ල ඕනෑ කියන සටන් පාඨය කියනවා. ඒක නිසා අපි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට කියනවා, තමන්ගේ අමාත්‍යවරයා ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. එතකොට ඒ අමාත්‍යවරයා හරහා මේ හඬ නඟන්න. මේ හඬ ගෙනියන්න. ඒ නිසා මේ ඇත්ත අපරාධකරුවෝ රකින එකට අපි විරුද්ධයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක නිසා පොදුවේ මේ යෝජනාවේ අර්ථය ගත්තාට පස්සේ මේ සමාජය අපි දන්නවා. අද අපරාධ රැල්ල අඩු වුණාය කියලා පොලිස් දෙපාර්තමේන්තුව වහසි බස් දොඩනවා. හැබැයි අපි දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සේයා සදෙව්මිලා, එතැනින් ගියාට පස්සේ විද්‍යා දැරිය වාගේ ඝාතන ගත්තාට පස්සේ අපට මේ සමාජයේ පිරිහීම තමයි පේන්නේ. සමස්ත සමාජයේ පිරිහීම අස්සේ අපට පෙන්වන පැතිකඩක්. අද නිදාගෙන ඉන් දැරිවියකටත් අතවර කරන සාහසික කල්ලියක් බිහි වෙලා. කවුද මේ සමාජය. විද්‍යා දැරිය පාසල් යනකොට තමයි දූෂණයට ලක් වුණේ. එතකොට අපි බලන්න ඕනෑ ඒ දූෂණයට ලක් කරපු කල්ලි ඇත්ත වශයෙන්ම බිහි කළේ මේ සමාජය. මේ සමාජයේම ඉන්න කොටස් තමයි දූෂණයට ලක් කළේ. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපරාධ ගත්තාට පස්සේ අපට

[ගරු සුනිල් වටගල]

විග්‍රහ වෙන්නේ සමස්ත සමාජයේ පිරිහීම අස්සේ තමයි මේක තිබෙන්නේ. ඒක නිසා කුඩු විතරක් හඹාගෙන ගිහිල්ලා, කුඩු විතරකට පමණක් අපේ සටන් පාඨය බැර කරලා මේ කුඩුවලට අදාළ මිනිස්සු එල්ලා මැරුවාට මේකට අදාළ සමස්ත වැරැද්ද නිවැරැදි වෙන්නේ නැහැ. මේක System එකේ වැරැද්දක් තිබෙන්නේ. ඒක නිසා උඩ ඉඳලා පල්ලෙහාට මේ වැරැද්ද හදාගෙන එන්න ඕනෑ. ඒක නිසා අපි ඉහළ සිට පහළ දක්වා මේ වැරැදි හැදුවොත් පමණයි මේ සමාජයේ නීතිය සහ බලයට විධානයක් ලැබෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැක්කා වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ පැත්තෙනුත් පොලීසියට දෝෂාරෝපණයක් ආවා. අධිකරණයට දෝෂාරෝපණයක් ආවා. හැබැයි, අනෙක් පැත්තෙන් බලනකොට පොලීසියට දෝෂාරෝපණය කරද්දී අධිකරණයට දෝෂාරෝපණය කරද්දී අපිත් අනෙක් පැත්තට හැරිලා බලන්න ඕනෑ, කාටද අපි මේ දොස් කියන්නේ කියලා. එතකොට පොලීසියට දොස් කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ඔවුන්ගේ ක්‍රියා කලාපය නිසා. අධිකරණයටත් යම් දොසක් කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ක්‍රියා කලාපය නිසා. ඒ ක්‍රියා කලාපය විශේෂයෙන් සිද්ධ වෙලා තිබෙන්නේ කොටසක් රකින ක්‍රියා කලාපය නිසා. පක්ෂපාතී ක්‍රියා කලාපය නිසා. අන්න ඒ පක්ෂපාතී ක්‍රියා කලාපය අවාසි වුණොත්තින් ඒක පාර්ශවීය නැතුව ගියෝත්තින් ස්වාධීන වුණොත්තින් මේක නීතියක් විධියට මේ රටේ ජනතාව පිළිගන්න ලැහැස්තියි.

ඒ නිසා ක්‍රම දෙකකට මිනිස්සු ශීලාචාර වෙනවා. එකක් තමන් ස්වයංව හිතලා, ආගමානුකූලව හරි මොකක් හරි හිතලා තමන් ස්වයංව වාරණයට ලක් වෙනවා. එහෙම නැත්නම් නීතියට බයේ වාරණයට ලක් වෙනවා. ඒක නිසා අද වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්වයංව වාරණය වෙන්න සමාජයක් හොඳට නැහැ. අද ආත්මාර්ථකාමී සමාජයක් තිබෙන්නේ. මේ සමාජය පිම්මේ ගමන් කරනවා. ඒ පිම්මේ ගමන් කරද්දී, තමන්ට ස්වයංව වාරණය වීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. අනෙක් පැත්තෙන් නීතියට බය වෙන්නේ නැතුව ගිහිල්ලා තිබෙනවා. කොටසක් නීතිය අතට අරගෙන වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක නිසා කොටසකට නීතිය කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගලේ කොටපු අකුරක්වත්, මඩේ හිටවපු ඉන්නක්වත් නොවෙයි. ඒක නිසා නීතිය කියන්නේ ඇත්ත වශයෙන්ම නම්‍යශීලී විය යුතු එකක්. ඒක නිසා මේ දෙකටම අහු වෙන්නේ නැතුව රටේ නීතිය ක්‍රියාත්මක විය යුතුයි කියන යෝජනාව මම මේ වෙලාවේ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉහළට ආවරණයක් තිබෙන තුරු, ඉහළ අපරාධකරුවන් රකින තුරු අපට පල්ලෙහා අපරාධකරුවන් පිළිබඳව කරීකාවක් නැහැ. ඒක නිසා තමයි අපි පසුගිය කාලයේ දැක්කේ එක්තරා පාතාල කල්ලියක් හිටියා. ඒ පාතාල කල්ලිය රාජ්‍ය ත්‍රස්තවාදය හමුවේ ඔවුන් පළා ගියා. පළා ගියාට පස්සේ තව කල්ලියක් ආවා. ඒ කල්ලියේ මෙයෙවීමෙන් බන්ධනාගාරයට පැනලා STF එකයි, හමුදාවයි පැනලා - බන්ධනාගාරයක කොහොමද STF එකයි, හමුදාවයි යන්නේ? බන්ධනාගාරයට STF එකයි, හමුදාවයි පැනලා ඉවර වෙලා සිරකරුවෝ 26 දෙනෙක් ඝාතනය කළා අපි දැක්කා. ඒක නිසා එක්තරා කාලයක වෙන පාතාලයේ තර්ජන වෙන වෙන පැතිවලින් යනවා. අද වෙනත් ආකාරයක පාතාලයක් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මේ පාතාලය ක්‍රියාත්මක වන එක මත්කුඩු හා සම්බන්ධයි. මත්කුඩු හා සම්බන්ධ කථාවක් තිබෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියනවා පැහැදිලිව මේ ඉහළ මෙහෙයවීම යටතේ, ඉහළ ආදර්ශයක් සපයන තුරු කවදාවත් මේකට ඇත්ත උත්තරයක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා අපි -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

වැරැදිකාරයෝ කීදෙනෙක් නිවැරැදිකාරයෝ කළාද උසාවියේදී?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව අවසානයේදී මම කියන්නේ පැහැදිලිවම මේක පිටුපස්සේ සිටින සැබෑ අපරාධකරුවන් හඳුනාගමු. ඒ සඳහා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමන්ලාට හැකියාවක් තියෙයි. තමන්ගේ තිබෙන වපසරිය මෙහෙයවලා ඒ සඳහා කටයුතු කරන්න. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.36]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි අගය කරන්න ඕනෑ. නමුත් අපි හිතනවා අපි බෞද්ධයෝ වශයෙනුත් මරණ දණ්ඩනය කියන එකට අපි යම් කැමැත්තක් නැති වුණත්, මේ රටේ තිබෙන තත්ත්වය තුළ තමයි මේ කාරණා නිර්මාණය වෙලා තිබෙන්නේ. මම පැහැදිලිව කියන්න ඕනෑ මේක තවත් එක් මාතෘවක් විතරයි. මේකත් දවසක් දෙකක් කථා කරලා අමතක වෙලා යන කාරණාවක්. මේ කාරණාවට පෙරත් මේ මරණ දණ්ඩනය ගෙන එන්න ඕනෑ කියලා දැරියක් දූෂණය කරපු වකවානුවේ මෙහෙම කථිකාවතක් රට තුළ නිර්මාණය වුණා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා අද දිනයේත් මේ යම් යම් මොනවා හෝ කාරණාවක් සමාජගත කරන්න තමයි මේක සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේක සිදු නොවන කාරණාවක්. නමුත් අද අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවට අදහස් දක්වන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම රටක නීතිය ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න නම් ඒක කරනකොට අපරාධත් නැති වෙන්න ඕනෑ. නමුත් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න අපි උත්සාහ කරන කොට අපි දන්නවා අපරාධ කරන මිනිස්සු සමහරවිට රටේ නීතිය අභිබවා ගිහිල්ලා තිබෙනවා.

විශේෂයෙන් අපි නිකමට කථා කළොත්, දැන් අපි ගම්බද ඉන්න යම් යම් වැරැදි කරන මිනිස්සු අපට ළඟට ඇවිල්ලා කියනවා. මන්ත්‍රීතුමා, අපට මෙන්න මේ කාරණාව සඳහා පොලිසිය සම්බන්ධ වෙලා ඉන්නවා. අපට උදව් කරන්න. එතකොට අපට ඇවිල්ලා කියන්නේ මන්ත්‍රීතුමා 54 ගහන්නේ නැතිව මේක කරලා දෙන්නය කියලා. 54 කිව්වාම, ඒ අපරාධකාරයා දන්නවා, මේක වරදක්. ඒ වරදට රිමාන්ඩ් වෙන්නට ඕනෑ. ඒ නිසා පුංචි හෝ වරදකට පොලිසියෙන් ඇප දෙන්න පුළුවන් කාරණා පිළිබඳව ඒ අපරාධකාරයා දන්නවා. ඒ වාගේම අපරාධකාරයා මේකේ වගන්තිය දන්නවා. නඩුවේ වගන්තිය දන්නවා. ඒ වගන්තියට අනුව නඩුව උසාවිගත කරගන්න නැති වෙන්න තමයි උත්සාහ කරන්නේ. ඒ වාගේම තමයි අද අපි දවසක හමු වුණොත් දැන් මේ වරද තුළ දවසකට අපි දන්න නීතිඥ මහත්මයෙක් ළඟට තමයි යන්නේ. ගිහිල්ලා, අපි එතුමාගෙන් උපදෙස් ගන්නට ඕනෑ. හැබැයි ගමේ වැරැදි කරන මිනිහා දන්නවා. මේක ඉඩම් නඩුවක් නම් ඉඩම් නඩුවකට කා ළඟට ද යන්න ඕනෑ කියලා. මේක අපරාධ නඩුවක් නම් කොයි නීතිඥ මහත්මයා ද හම්බ වෙන්නට ඕනෑ. මේක දූෂණයක් නම් කොයි කෙනාද? අධිකරණයෙන් මේකට ඇප දෙනවාද? මේ සියල්ල පිළිබඳව අවබෝධයක් අපරාධකරුවාට තිබෙනවා. ඒ නිසා මේ රටේ අපරාධකරුවෝ සහ වැරැදි කරන මිනිස්සු නීතියට අහු වෙන්නේ නැත්තේ ඒ අය නීතිය පිළිබඳ අවබෝධයක් ඇතිව තමයි මේ සියලු වැරැදි කරන්නේ. නීතියේ ලිහිල් තැන ඔවුන් හොඳින් හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා රටක නීතියේ හිඩසක් නැතිව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ වාගේම තමයි රටේ නීතිය නිවැරැදිව ක්‍රියාත්මක කරලා එල්ලන්න තිබෙනවා නම්, මිනිහෙක් එල්ලලා මරන්නට ඕනෑ. නමුත් මේ කාරණාවට එකඟ වෙන්න පුංචි හරි අකැමැත්තක් තිබෙන්නේ, මේ රටේ එල්ලා මරන ලද මිනිස්සු දිහා බැලුවොත් මොනතරම් අසරණ මිනිස්සු එල්ලලා මරලා දාලා ඇත්ද? සමහරවිට මොනතරම් අහිංසක මිනිස්සු හිරබත් කනවා ඇත්ද? කොපමණ මිනිස්සු රිමාන්ඩ්ගත වෙලා ඇත්ද? ඒ නිසා මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන අය ඒ නීතිය තුළ සිටිමින් මොනතරම් පළිගැනීම්වලට මිනිස්සු ලක් කරලා තිබෙනවාද? ඒ නිසා හෘද සාක්ෂියට එකඟව අපට පුළුවන්කමක් නැහැ, මේ මරණ දණ්ඩනය කියන එකට එකඟ වෙන්න. මේ රටේ ඒ වැරැදි කරන මිනිහාම එල්ලනවා නම්, ඒ මිනිහාම නම් එල්ලලා මරන්නේ අපට එකඟ වෙන්න පුළුවන්. නමුත් අර අහිංසකයෙක් ජීවිතක්ෂයට පත් වෙන්න පුළුවන්.

ඒ නිසා ආගමේ හැටියටත් කෙනෙක් මරණයට පත් කරන්න පෙර කරුණු ගණනාවක් අපේ දහමෙත් උගන්වනවා. ජීවියෙක් බව අපි දැනගන්නට ඕනෑ. ඒ ජීවියා මරන්න මරණ චේතනාවක් ඇති වෙන්නට ඕනෑ. ඒකට අපි උපක්‍රමයක් හෝ සැලසුමක් යොදන්නට ඕනෑ. ඒ සැලසුම හරහා අපි ඒක ක්‍රියාත්මක කරවන්නට ඕනෑ. ඒ හරහා තමයි සිදු කළ මරණය පාප කර්මයක් වන බව අපේ ආගමේ හැටියට දහමේ දක්වන්නේ. පුද්ගලයෙක් මරණයට පත් කරන කොට කාරණා 05 ක් සම්පූර්ණ වෙන්නට ඕනෑ. එතකොට රාජ්‍ය නියෝගයක් අනුව, මෙය නියෝගයක් වශයෙන් ක්‍රියාත්මක කරන කොට රටේ පාලනය හරහා ඒක පාපයක් වෙනවාද කියන එක මම දන්නේ නැහැ. නමුත් මේවාට අත උස්සලා අපි නීති ක්‍රියාත්මක කළොත්, අහිංසක පුද්ගලයෙක් මේ තුළින් මරණයට පත් වුණොත් ඒ පාපයට

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

අපිත් වග කියන්නට ඕනෑ. ඒ නිසා මම නිරන්තරයෙන් විශ්වාස කරන්නේ, නිවැරදි අපරාධකාරයා තෝරා ගැනීම පිළිබඳ ගැටලුවක් තිබෙන නිසා මෙවන් කාරණාවක් සම්බන්ධයෙන් අපට යම්කිසි සැකයක් තිබෙනවා.

ඒ වාගේම තමයි මේ කථා කරන්නේ, කුඩු ජාවාරම ගැන. උස මහත මනුස්සයෙක් මරලා දාලා ගියොත් මිනිස්සු කියනවා, අපරාධයක් කියලා. මම මේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අපේ ප්‍රදේශයේ ප්‍රදර්ශනයක් තිබුණා. ඒ ප්‍රදර්ශනයට ගබ්සාව පිළිබඳව සජීවී පටියක් ගෙනැල්ලා ගබ්සාව සිදුවන ආකාරය පිළිබඳව ඒ ප්‍රදර්ශනය තුළ පෙන්නුවා. හය හතර උස මනුස්සයෙක් වෙඩි තියලා මැරුවාම අපරාධයක් කියලා මිනිස්සු කළබල වෙන කොට, අර බඩ ඇතුළේ ඉන්න දරුවා කෑළි කෑළිවලට කපලා එළියට ගන්න කොට ඒක අපරාධයක් නොවේද? එහෙමනම් මේ රටේ වැරදි කරන්නේ, මේ රටේ සජීවී මිනිස්සුන්ට වඩා හොඳට ඇඳගත්ත, ටයි එක දාපු, උගත්, අපට සමත් කරන්න බැරි වුණු, විභාග සමත් කරපු මිනිස්සු. මේවා අපරාධ ගණයට ගන්නේ නැද්ද? බඩ ඇතුළේ ඉන්න, මේ ලෝකය දැක්කේ නැති දරුවන් මරලා දාන ඒ අය එල්ලලා මරන්නට ඕනෑ. ඒ ළමයා අහනවා. ඒ කථාවේ සිංදුවේ කියනවා, අපට මේ ලෝකය දකින්න ඉඩ තියන්නේ නැත්තේ ඇයි අම්මේ? ඇයි තාත්තේ අපට මේ ලෝකයේ ඉඩ තියන්නේ නැත්තේ. පුංචි දරුවා කෑළි කෑළිවලට කපලා අඩුවලින් තමයි එළියට ගන්නේ. මේ වාගේ කාරණා හද කකියනවා. ඒ නිසා මිනිස්සු කුඩු බොනවා වෙන්න පුළුවන්. ඒ වාගේම වැරදි වැඩ කරනවා වෙන්න පුළුවන්. නමුත් මේ හරහා මේ ගබ්සාවල් වාගේ දේවල් බෞද්ධ පදනමක් බහුතරයක් තිබෙන රටක මේ වාගේ නූපන් දරුවන් මරණවා නම් මේ මිනිස්සු එල්ලලා නොවෙයි, උල තියලා මරන්නට ඕනෑ. එහෙමනම් මේවාට කවුද කථා කරන්නේ? මේවාට කථා කරන කෙනෙක් නැහැ.

ඒ වාගේම තමයි ස්ත්‍රී දූෂණ. අවුරුදු ගණන් පුංචි දරුවන් මේ රටේ දූෂණය වෙනවා. පෙළක් තැන්වල තමන්ගේ දරුවාව තාත්තා දූෂණය කරලා. සමහරවිට තමන්ගේ අම්මාව පුතා දූෂණය කරලා. සමාජ කථිකාවත කොහොමද ඇති කරන්නේ? තමන්ගෙන් තමන්ගේ අම්මාට දරුවෝ ඉපදුණොත් ඒ දරුවාට කියන නෑදෑකම මොකක්ද? තමන්ගේ දුවට තමන්ගේ තාත්තාගෙන් දරුවෙක් ඉපදුණොත් මේ දරුවාට කියන නෑදෑකම මොකක්ද? අපේ සමාජ කථිකාවත කොතැනටද යන්නේ. මෙහෙම මිනිස්සුන්ට අපි කරන්න ඕනෑ මොකක්ද? ඒ නිසා මේ රටේ කුඩුවලට පමණක් නොවෙයි එල්ලලා මරන්නට ඕනෑ. අපේ ආගමට පරිබාහිරව යනවා නම්, මේ සදාචාර සම්පන්න සමාජය ඒ කාරණාව සම්මත කරන්නට නම් යන්නේ ඒ හැම දෙයක්ම අපරාධ ගණයට වැටෙන්නට ඕනෑ. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, විවිධ වූ කාරණා දිහා බලන කොට සමාජ තත්ත්වය දිහා බලන කොට විවිධ අපරාධ - ඒවා මිනී මැරුම් වෙන්නට පුළුවන්. ඒවා සමාජයේ වෙනත් දූෂණ ක්‍රියා වෙන්නට පුළුවන්. අපචාර වෙන්න පුළුවන්. ඒ වාගේම විවිධ වූ හොරමැරකම්, වංචා, දූෂණ, අල්ලස් ගැනීම්, කප්පම් ගැනීම් මේ සියල්ල වැරදි දේවල් කියලා අපි දකිනවා. නමුත් රටක් ඉදිරියට යන්න නම් මේ නීතිය තදින් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ නීති ක්‍රියාත්මක කරන්න නම්, ඒ නීතිය ක්‍රියාත්මක කරන මිනිස්සු ඒ කාරණා නිවැරදිව ඉටු කරන්නට ඕනෑ. ඒ නිසා නීතිය ක්‍රියාත්මක කරන අය ඒ දේ හරියට නොකරන තාක් මේක කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා රටේ මිනිස්සුන්ට එක්කෝ ප්‍රජාතන්ත්‍රවාදීව අපේ කාර්යභාරය හිතන්නට ඕනෑ. එහෙම නැත්නම් ඒකාධිපතිව හිතන්නට ඕනෑ. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න අපට පැවරිලා තිබෙන කාර්යය මොකක්ද? ඒ නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයාට තිබෙන රැකවරණය මොකක්ද? නීතිය ක්‍රියාත්මක කරන්න ගියාම මේ රටේ බහුලව සිද්ධ වුණේ නීතිය ක්‍රියාත්මක කරන්න යන පුද්ගලයා තමයි අගතියට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ අයට තිබෙන ආරක්ෂාව පිළිබඳව අපි හිතන්නට ඕනෑ. ඒ වාගේම රාජ්‍ය නිලධාරියාගේ ඒ වගකීම් මොනවාද? මෙන්න මේ වාගේ කාරණාත් එක්ක හිතන කොට මට හිතෙනවා, මේ රටේ එල්ලා මැරීම සම්බන්ධයෙන් අපට පොඩ්ඩක් හෝ හිතන්නට ඕනෑ.

මීට වසර 2563 කට පෙර තමයි බුද්ධ පරිනිර්වාණය සිද්ධ වෙන්නේ. ඒ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 45 ක් අපේ බුදු හාමුදුරුවෝ බණ දේශනා කරද්දී සුරාමේරය කියන වචනය නිරන්තරයෙන් පාවිච්චි කරලා - මම අපේ ගිහියන්ට හොඳ ශීලයක් කිව්වා. උඹලා මෙන්න මේ කාරණාව කරන්න එපා. මිනිහෙක් සමාජයේ පිරිහෙනවා. මිනිහෙක් අගතියට යන්න, සුරාව ප්‍රධාන කාරණාවක් බවට පත් වෙනවා. ඒ කාලය තුළ අදටත් මේ සුරාව සම්බන්ධයෙන් මේ කාරණා

අපට තිබෙනවා. ඒක අපේ සිඟාලෝවාද සූත්‍රයේ දේශනාවේද සඳහන් වෙනවා. අපට තිබෙන පංචසීලයට අමතරව වෙනත් කටයුතු ගිහි විනය තුළත් මේක නිවැරැදිව කිව්වත් මිනිස්සු මේවායින් මිදුණේ නැහැ. දවසින් දවස මිනිස්සු මේ කාරණා හරහා ඒවාට යොමු වුණා. ඒ නිසා මේවා පහසු කාරණා නොවෙයි. රටක ජාතියක ආගමක් බිහි වෙන්නේ, සංස්කෘතියක් බිහි වෙන්නේ, දේශකයෝ බිහි වෙන්නේ මෙන්න මේ කරන වැරැදි අනුව. පුද්ගලයා එල්ලා මරනවාට වඩා, පුද්ගලයා සංවර්ධනය කිරීමයි මේ හැම ආගමකම ශාස්තෘවරුන් සිද්ධ කරලා තිබෙන්නේ. මිනිස්සුන්ට යහපත් දේ කියලා දීලා, ඒ වැරැදි අවම කරලා සමාජය යහපත් කරන්න තමයි ආගමික ශාස්තෘවරයන් වහන්සේලා ඒ දේශනා කරලා තිබෙන්නේ. ඒ අනුව තමයි අනුගාමිකයෝ බිහි වෙන්නේ. ඒ අනුව තමයි ශාස්තෘවරු බිහි වෙලා තිබෙන්නේ. අදටත් කරන්න තිබෙන එකම දේ තමයි, පුද්ගලයා සංවර්ධනය කරන්නට ඕනෑ. පුද්ගලයා පුනරුත්ථාපනය කරන්නට ඕනෑ. මිනිස්සු එල්ලලා මැරුවයි කියලා මේ කාරණය ඉටු වෙන්නේ නැහැ. අපි දන්නවා ගම තුළ - අර කසිප්පු කියලා බිව්වාට පස්සේ ඇස් ඉදිමිලා, ඇඟපත ඉදිමිලා, බඩ ඉදිමිලා මළමිනී ගාණට තමයි ඇවිදින්නේ. මේවා බීලා තමන්ගේ යාළුවා මැරෙනවා. ඒත් පහුවදාටත් අනික් කෙනාත් ඒදේම පානය කරලා මැරෙනවා. සමහර වෙලාවට ගමේ මිනිස්සු කියන්නේ, ඒවා ඇතුලේ නයි ඉන්නවා. උන් එළියට ඇදලා දාලලු අරක්කු බොන්නේ. සමහරවිට ගැරඬි වැටිලා ඉන්නවාලු, අර පෙරන්න තිබෙන ගෝඩා කියන ඒවායේ. උන් එළියට ඇදලා දාලා තමයි මිනිස්සු බොන්නේ. තනිකර විෂ තමයි පාවිච්චි කරන්නේ. මැරෙන බව දන්නවා. එල්ලලා මැරෙනවාට වඩා තමන් මැරෙන බව දැන දැනත් පාවිච්චි කරන්නේ. එක්කෝ මිනිස්සු මේවාට ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් පුද්ගලයන් සංවර්ධනය කරලා, මේ අය වඩා හොඳ තත්ත්වයට ගන්න එක තමයි මම හිතන්නේ වඩා හොඳ කාරණාව වෙන්නේ.

ඒ වාගේම රජයක් මේවාට දෙන අනුබලයන්, බියර් වෙන්න පුළුවන්. අරක්කු වෙන්න පුළුවන්. මත්ද්‍රව්‍ය වෙන්න පුළුවන්. ගංජා වෙන්න පුළුවන්. මේ සියලු දේවල් මත්ද්‍රව්‍ය නම් රජය කියනවා, බියර් මිල අඩු කරන්නට ඕනෑ. ඒ වාගේම තැබෑරුම්හල් රාත්‍රියේ එළිවනතුරු ඇරලා තිබෙන්නට ඕනෑ. එහෙමනම් රජය එක ක්‍රියා මාර්ගයක් ගන්නවා. ඒකේම වෙනත් කාරණා සඳහා රජය පනවන්න හදනවා මරණ දණ්ඩනය. ඉතින් අපි දන්නේ නැහැ, මොකක්ද මේ තත්ත්වය කියලා. ඒ නිසා අපි කියනවා, රටක පාලකයා විසින් යම් යම් කාරණා සම්බන්ධයෙන් දැඩි තීන්දු ගන්නට ඕනෑ. ඒ තීන්දුව කාටද කියන එක නොවෙයි. මම ගිය සභාවේත් කිව්වා. එළාර රජ්ජුරුවන්ගේ පුතා අතින් හරක් පැටියෙක් මැරුණා කියලා. රජ්ජුරුවෝ දෙමළ රජ කෙනෙක් වුණත් ඔහු අණ දෙනවා තමන්ගේ දරුවත් ඒ විධියටම ඒ සිද්ධියටම දඬුවම් ලබන්නට ඕනෑය කියලා. පාලකයා නිවැරැදි වෙන්නට ඕනෑ. පාලකයාට ඍජු දැක්මක් තිබෙන්නට ඕනෑ. නීති ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒවා නොකර මේවා සමාජයෙන් අහන්න ගිහිල්ලා, රටෙන් අහන්න ගිහිල්ලා මේවා කවදාවක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

මම දන්නවා, හරක්මස් සම්බන්ධයෙනුත් මේ වාගේ කතිකාවතක් ආවා. කවදාවක්වත් මේ ලංකාවේ හරක් මරන්න දෙන්නේ නැහැයි කිව්වාට වසර 3 ½ ක් අදටත් හරක් මරනවා. කුඹුරු ගොඩ කරන්න දෙන්නේ නැහැයි කිව්වා. අදටත් මහා පරිමාණයෙන් කුඹුරු ගොඩ වෙනවා. ඒ නිසා මේ රටේ පාලකයන් කියන දේවල් යථාර්ථයක් නොවුණු වකවානුවක තමයි අපි මේ ජීවත් වෙන්නේ. ඒවා හරි වෙන්න පුළුවන්. පාලකයා ගන්න තීන්දුව හරි වෙන්න පුළුවන්. වැරැදි වෙන්න පුළුවන්. පාලකයා තීන්දුව ගන්න ඕනෑ. පාලකයා තීන්දුව නොගන්නාතාක් මිනිස්සුන්ට විශ්වාසය ගොනු වෙන්නේ නැහැ. අදත් මේ කාරණාව හරහා අපට කියන්න තිබෙන්නේ, මේක සිද්ධ නොවෙන, තවදුරටත් මෙය සමාජ කතිකාවතක් බවට පත් වෙලා - මේ ආණ්ඩුව පත් වුණු මුල් යුගයේ සේයා දරුවාගේ දූෂණය ගෙනාවා. ඊට පස්සේ රන් කඩු ගෙනාවා. ඊට පස්සේ රාජපක්ෂලාගේ හොරකම් ගෙනාවා. ඊට පස්සේ වෙනත් කාරණා ආවා. ඉතින් මේ වාගේ කාරණා ආවා මිසක් දවසින් දවස සිද්ධීන් ගෙනැල්ලා රූපවාහිනිය ළඟ හවස හය වෙන කොට අපව කොටු කළා. අපි රස වින්දා. නමුත් ඒවාට විසඳුම් එකක්වත් මේ වනතුරු ලැබිලා නැහැ. ඒ නිසා මේකටත් මේ විසඳුම ලැබෙන්නෙත් නැහැ. මේවාට පොදු රාජ්‍ය මණ්ඩලය මැදිහත් වෙනවා. මානව හිමිකම් මැදිහත් වෙනවා. ආගමික නායකයන් මැදිහත් වෙනවා. හැබැයි මේ කවුරු මැදිහත් වුණත්, නායකයා නිවැරැදි තීන්දුව ගන්නවා නම්, එය ධර්මානුකූල නම්, එය නිවැරැදි නම් එය අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් ගන්නවා නම් ඒවාට අපේ සහයෝගය තිබෙනවා. ඒ නිසා මම නැවතත්

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

කියන්නේ, එල්ලා මරන්නට ඕනෑ වැරැදි කරන මිනිස්සු. එහෙම මරනවා නම් ඒ මිනිස්සු නිවැරැදිම පුද්ගලයා හඳුනාගන්නට ඕනෑ. අපි මේ කියන්නා වූ කාරණා හරහා අහිංසක මිනිහෙක්, එහෙම නැත්නම් වැරැදි නොකරපු මිනිස්සු මේ තත්ත්වයට පත් වෙනවා නම්, ඒක පාපයක් බවට පත් වෙලා අපට ශාපයක් වෙයි. ඒ නිසා වඩා නිවැරැදිව මේ රටේ රාජ්‍ය බලය මෙහෙයවන අය නීතිය ක්‍රියාත්මක කරන අය නිවැරැදිව කටයුතු කළ යුතුයි. ඒ අනුව අපරාධ අඩු කරන්න මරණ දණ්ඩනය පුළුවන්ද කියන විශ්වාසය අපි බලන්න ඕනෑ. ඒ නිසා පුද්ගලයා තවදුරටත් සංවර්ධනය කරලා, මේ ඇස් දෙක පෙනෙන, කන් ඇහෙන, හිතන්න පුළුවන් මනුෂ්‍යා කියන පුද්ගලයාව තවදුරටත් අපි ශිෂ්ට සම්පන්න කරලා, පුනරුත්ථාපනය කරලා, ඔහු සමාජගත කිරීම වඩා වැදගත් කියන කාරණාව ප්‍රකාශ කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරන ගමන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මම මූලාසනයට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair.*

[පූ.භා. 11.49]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සතුටු වෙනවා. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා තවත් මහජන මුදල් කාබාසිනියා කරන යෝජනාවක් අපේ පළාත් සභාවට - අපේ පළාත් සභාවේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලිවලින් මේ පළාත් සභාවේ විදුලිය, අපට කන්න දෙන ඒවාට කාලය කන්න තවත් යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. මොකද 2015 ජනවාරි 08 වැනිදා මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව පරාජය කරන්න, ඒ තිබුණු ආණ්ඩුව පරාජය කරන්න විශාල මෙහෙයක් මෙහයවපු මන්ත්‍රීවරයෙක් තමයි නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා. 2015 ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මේ රටේ ජනාධිපති වෙලා පළමුවැනි නීති විරෝධී ක්‍රියාව කළේ ප්‍රජාතන්ත්‍රවාදී රටක හිටපු අගමැතිවරයාට තව අවුරුද්දක කාලය තිබෙද්දී, දී.මු. ජයරත්නව අස් කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව රනිල් වික්‍රමසිංහව අගමැති කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කාබාසිනියා කළා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය කාබාසිනියා කරපු දිනයේ සිට මේ වන කොට අද මේ එල්ලුම්ගහ දක්වා එන්න ඇවිල්ලා තිබෙන අවුරුදු 03 ½ තුළ මේ ආණ්ඩුව කරපු වැරැදි ක්‍රියාපටිපාටිය නිසා තමයි මේ තත්ත්වයට එන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එදා මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ මේකේ හිටපු කුඩුකාරයෝ, මංකොල්ලකාරයෝ, කප්පම්කාරයෝ, මේ සියල්ලටම නීති හදලා ගෙනැල්ලා ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම්තුමා හැටියට විශාල පාතාළ සිද්ධීන් සියල්ලක්ම අඩපණ කරලා, මේ රටේ හිටපු ජනතා විමුක්ති පෙරමුණ 71 කැරැල්ලෙන් ඇති වුණු ඒ මහා භීෂණ යුගයත් එක්ක, උතුරට ගිය එල්.ටී.ටී.ඊ. සංවිධානය ඇති වුණු ඒ ත්‍රස්තවාදයත් එක්ක, මේ රට නැති කරලා දාපු කාලය ඉවත් කරලා මේ රට සාමකාමී රටක් බවට පරිවර්තනය කරලා උතුරේ තිබුණු යුද්ධය අවුරුදු දෙකකින් අවසන් කරලා මේ රටේ උතුරත් දකුණත් එකතු කරලා, පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුවට වනතුරු සාමකාමී මිනිහෙක්ව හඳන්න පුළුවන්කමක් එදා ලැබුණා. අද මේ අවුරුදු 03 ½ වන කොට වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාම මේ සභාවට යෝජනාවක් ගෙනැල්ලා අද කියනවා, පොලිසිය දූෂිතයි. අධිකරණය දූෂිතයි. Custom එක දූෂිතයි. එතකොට පාලකයෝ. මේ රටේ හැට අට ලක්ෂයක් ඡන්දය දුන්නු මිනිස්සු.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කොන්ද පණ නැතිව තීරණයක් ගන්න බැරි නිසා තමයි අද මෙවැනි පතාළය හැදිලා තිබෙන්නේ. කුඩු ගෙන්වන්නේ. ජාවාරම්කාරයන් ඇති වෙලා තිබෙන්නේ. බැංකු මංකොල්ල කන්නේ. එතකොට චේන් කඩා ගන්නේ. මේ සියල්ලක්ම ඇති වෙලා තිබෙන්නේ මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ යහපාලන ආණ්ඩුවේ ක්‍රියාවලිය නිසා කියන එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ජනාධිපතිතුමාගේ නම පාවිච්චි කරන්න එපා. ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියලා මම නියෝග කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ ජනාධිපතිතුමා. මට සමාවෙන්න. අපේ ජනාධිපතිතුමා. හරිද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ඒ නිසා අපේ ජනාධිපතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම කියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා අද කථා කරන අය කථා කරනවා. දැන් බලන්න, මේ අධිකරණයට දූෂිතයි කියන්නේ අධිකරණ පොත අනුව තමයි නඩුකාරයෝ තීරණ ගන්නේ. අධිකරණ පොත අනුව තමයි ඒකට නීතිඥයන් කථා කරන්නේ. ඒ පිටු අංක අනුව තමයි තීරණ දෙන්නේ. ඒ නිසා මේ රටේ එල්ලුම්ගහ ගෙනාවා කියලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ පොලිසිය වෙනස් කළා කියලා මේ ප්‍රශ්න වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. මේ රට STF එකට භාර දුන්නා කියලා ප්‍රශ්න වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා පළමුවෙන්ම මේ රටේ කරන්න ඕනෑ, නීති පද්ධතිය වෙනස් කරන්න ඕනෑ. නීති පද්ධතිය වෙනස් කළොත් තමයි, මේ දූෂිතයාට චෝදනාවක් කරලා දඬුවමක් දෙන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා ලෝකයේ තිබෙන මානව අයිතිවාසිකම් කොමිසමේ ගිහිල්ලා අත්සන් කරලා මේ ජිනිවා සමුළුවට පොරොන්දු වෙලා කරුණු 36 කට ලංකාව එකඟ වෙලා, මේ එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ යහපාලන ආණ්ඩුව, සංහිඳියා ආණ්ඩුව ඒ අනුව මේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා නොදැනද මේ එල්ලුම් ගහ කියන එක ගේන්න හදන්නේ. එදා බණ්ඩාරනායක මහත්තයාට සෝමාරාම වෙඩි තියලා එදා බණ්ඩාරනායක මැතිනිය එල්ලුම්ගහට අරින කොට එදා මේ රටේ මිනිස්සු, එදා තිබුණු සදාචාර සම්පන්න රටක මිනිස්සු, බෞද්ධ රටක මිනිස්සු ඒකට එදත් විරුද්ධ වුණා, එල්ලුම්ගහ එපා කියලා. ඒ නිසා තමයි එල්ලුම්ගහ මේ රටේ නැති වුණේ. ඒ අනුව අද නැවත එල්ලුම්ගහ ගේන්න කිව්වාම කුඩු ප්‍රශ්නය අඩු වෙන්නේ නැහැ. එල්ලුම්ගහ ගෙනාවා කියලා මේ රටේ මිනී මැරුම් අඩු වෙන්නේ නැහැ. එල්ලුම්ගහ ගෙනාවා කියලා මේ රටේ තිබෙන අනිකුත් මංකොල්ලකෑම්, දූෂණ අඩු වෙන්නේ නැහැ. ඒකෙනුත් එල්ලුම්ගහට ගේන්න යන්නේ කවුද? දඬුවම් ලැබුණු 16 දෙනෙක්. දැන් දඬුවම් ලබපු 16 දෙනා - මම මේ ආණ්ඩුව යටතේ හිරගෙදර තුන් සැරයක් ගිය මිනිහෙක්. මම හිරකරුවන්ව ඇසුරු කළා. පාතාළයේ සහෝදරයොත් ඇසුරු කළා. ඒකේ හිටපු අනිකුත් සාමාන්‍ය වැරැදිකරුවන්ව අපි ඇසුරු කළා. ඒ අය කිසිම කෙනෙක්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් කිසිම විධියකින් කුඩු පැකට් ගේන්න පුළුවන්කමක් නැහැ. ඒ ඔක්කොම බොරු. බන්ධනාගාරය ඇතුළත දැකලාවත් නැති අය තමයි මේ කථා කරන්නේ. එතකොට එහෙම ගෙනියන්න පුළුවන්කමක් නැහැ. හදිසියට අපට සබන් කැල්ලක් ගේනවා නම්, ඒ සබන් කැල්ලෙත් ඇතුළ chek කරලා, බත් පැකට් එක chek කරලා තමයි මේක ඇතුළට ගේන්නේ. එතකොට අද වැරැදි උපදෙසක් මේ ජනාධිපති අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ රටේ ඉන්න උපදේශකයෝ දීලා තමයි මේ එල්ලුම්ගහ ගේන්නේ. එතකොට එල්ලුම්ගහ ගේන්න -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉස්සර මහින්ද රාජපක්ෂගේ උපදේශක ඔයා නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ තිබුණු සතොස ආයතනයේ මේ බ්‍රසීලයෙන් ගෙනාපු සීනි කන්ටේනර්වල ඇවිල්ලා තිබුණේ සීනි නොවෙයි. කුඩු. එතකොට දැන් මේ කුඩු ටිකට මොකද වුණේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඔබතුමාගේ ඥාතියෙක් නේ කසුන් පලිසේන. කසුන් පලිසේනට කොහොමද බන්ධනාගාරය ඇතුළට මොබයිල් ෆෝන් ගියේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මොබයිල් ෆෝන් ගියේ කොහොමද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බන්ධනාගාරය ඇතුළේ අපි හිටපු නිසා දන්නේ. බන්ධනාගාරය ඇතුළේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කසුන් පලිසේන ඔබතුමාගේ ඥාතියෙක් නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මෙයාගේ ඥාති ඉන්නවාද කුඩු බිස්නස් කරන කට්ටිය?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කසුන් පලිසේන කියන්නේ කවුද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔබතුමාගේ ඥාතියෙක් ඉන්නවාද කුඩු බිස්නස්කාරයෝ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මම කථා කරන ප්‍රශ්නයට මේ අයට උත්තර දීගන්න බැහැ නේ. මොකද මේ ආණ්ඩුවේ පක්කලි සර්විස්කාරයෝ නේ. ඒක නේ වැඩේ තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක නේ ඔයාගේ රස්සාව ඉස්සර.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෙන මාතෘකාවක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔයා කලින් කරපු රස්සාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න පුළුවන්කමක් නැහැ. පොලිසිය පාලනය කරගන්න බැහැ, පොලිසිය භාරව ඉන්න ඇමැතිවරයාට. මේ රටේ රේගුව පාලනය කරගන්න බැහැ, රේගු ඇමතිවරයාට. මේ රටේ නීතිය පාලනය කරගන්න බැහැ, නීතිය භාර ඇමතිවරයාට. මේ රටේ ඔක්කොගෙම නායකයා වන මේ අගමැතිට පාර්ලිමේන්තුවේ, මෛත්‍රීපාල සිරිසේන රටේ ජනාධිපතිට -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බිරිඳව පාලනය කරගන්න පුළුවන්ද දන්නේ නැහැ නේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාලනය කරගන්න බැරි නිසා තමයි අද මේ අවුල ඇති වෙලා තිබෙන්නේ. එතකොට මම කියාගෙන ආපු කුඩු කන්ටේනර් හතර, අද සතොසට ගෙනාපු, රාජ්‍ය ආයතනයකට ගෙනාපු ඒ කුඩු කන්ටේනර් එකේ තිබුණු කුඩු ටිකට මොකක්ද කළේ? අද වනතුරු කුඩුවලට වුණු දෙයක් නැහැ. අර කුඩු කන්ටේනරය බාපු නාට්ටාමිලා දෙන්නා හිරේ. මෙන්න ආණ්ඩුවේ තිබෙන නීතිය. මෙන්න යහපාලන ආණ්ඩුවේ නීතිය. අද මේ යෝජනාවෙන් එල්ලුම්ගහ ගෙනාවා කියලා මේ රටේ එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. හිරගෙදරකට ගිහිල්ලා, ඒ සිරකාරයොත් එක්ක කථා කළාම, එයාලට තිබෙන චෝදනා දිහා බැලුවාම තිබෙන නීති පොත අනුව එයාලට තිබෙනවා වර්ග. සමහරු වැරැදි කරලා නැහැ. සැකපිට ගෙනහිල්ලා පොලිසිය විසින් වැරැදිකාරයෝ කරලා ඒ නඩුව පටලලා ආලා සමහරු ජීවිතාන්තය දක්වා හිරේ ගිහිල්ලා තිබෙනවා. නමුත් දැන් බලන්න, දුමින්ද සිල්වා මන්ත්‍රීතුමා. ඒ නඩුව සම්බන්ධව. දුමින්ද සිල්වා මන්ත්‍රීතුමාගේ නඩුවට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒකපාර්ශවිකව නඩුවක් දාලා ඒ වෙඩිකාපු-

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසාවියේ යන ප්‍රසිද්ධ නඩුවක් පිළිබඳව මේ සභාවේ කථා කරන්න බැහැ. මේ මන්ත්‍රීතුමාට මේක තේරෙන්නේ නැත්නම් තමුන්නාන්සේවත් අඩුම ගණනේ මේක නිවැරැදි කරලා දෙන්න. කෙහොමද මේක වෙන්නේ? දුමින්ද සිල්වා මන්ත්‍රීතුමාගේ - මොනවද මේ කියන්නේ. පිස්සු නේ කෙළින්නේ දාගෙන. තමුන්නාන්සේත් හැල්ලු වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරුන්ට අපහාස විධියට කථා කරන්න එපා. මම උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලන්නේ,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දුමින්ද සිල්වා මන්ත්‍රීතුමා, අද මන්ත්‍රීවරයෙක් නොවෙයි. මන්ත්‍රීවරුන්ට අපහාස කළේ ජේ.වී.පී. එකේ මන්ත්‍රීවරයා. දුමින්ද සිල්වා අද මන්ත්‍රීවරයෙක්. එයා ජීවිතාන්තය දක්වා සිරගත වෙලා තිබෙන කෙනෙක්. අද එයාගේ - (බාධා කිරීම්) එයාගේ වැරැද්දක්ද? appeal එක අද යනවා. අභියාචනය යනවා. එයාගේ වැරැද්දක්ද? නැහැ මේකේ කියන්න. එතකොට මම කියන්නේ මේ නඩු ගැන. (බාධා කිරීම්) නීතිය සම්බන්ධව ඒ නීති සංශෝධනය නොකර මේ ප්‍රශ්න ගෙනැල්ලා අපේ කාලේ කාලා වැඩක් නැහැ. එල්ලුම්ගහට ඇරියා කියලා මේ රටේ නීතිය වෙනස් වෙන්නේ නැහැ. අපරාධ, දූෂණ, වංචා අඩු වෙන්නේ නැහැ. ඒ නිසා අපි ලෝකයේ සම්මතයත් එක්ක ගත්තාම මානව අයිතිවාසිකම් කොමිසම. අද මේක කරන්න එපා කියලා තිබෙනවා. ඒ නිසා මම හිරබත් කාපු මිනිහෙක් හැටියට, මම සිරකාරයන්ගේ ඒ දුක්ගැනවිලි දැක්ක කෙනෙක් හැටියට මේ නීතියේ තිබෙන වැරැදි නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. මෙන්න මේ නිසා අද අපි කියන්නේ, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ආණ්ඩුවේ ජනාධිපතිතුමාගේ උපදේශක. හරිද? වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාගේ උපදේශක හැටියට ජනාධිපතිතුමාගේ vote එකෙන් යම් තෙල් දෙනවා. මෙයාට වාහනයක් දීලා තිබෙනවා. මෙයාට පඩියක් දීලා තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

බොරු කියන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙයාට පඩි -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා මේ පැත්තට කථා කරන්න. මේ යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රජයේ ජනාධිපතිතුමාගේ අරමුදලෙන් මෙයා තෙල් -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒවා ගන්න ඕනෑ. ඒවාත් අර විශේෂ අධිකරණයට දාන්න ඕනෑ. ඒවා ගන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මෙතුමාට උපදෙසක් දෙන්න පුළුවන්, ජනාධිපතිතුමාට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ කාලය විනාඩි 10 යි?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

දැන් 10 ට වැඩියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම වෙලාව බලලා නේ පටන් ගත්තේ. මට තව විනාඩියක් දෙන්න. අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා පසුගිය කාලයේ - මේ රටට ත්‍රස්තවාදය පළමුවෙන්ම ඉගැන්නුවේ ජනතා විමුක්ති පෙරමුණ. 71 කැරැල්ල. රාජ්‍ය දේපළ ගිනි තියලා. බස් ඩිපෝ ටික ගිනි තියලා. කෘෂිකර්ම මධ්‍යස්ථාන ගිනි තියලා. පුස්තකාල ගිනි තියලා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගිනි තියලා. ප්‍රාදේශීය සභා ගිනි තියලා. රාජ්‍ය ආයතන ගිනි තියලා. ජෝර්ජ්ගේ ගෙදරටත් අඳුරු නීතිය දාලා. හරි. එහෙම පුරුදු කළ ඒ කට්ටිය තමයි අද සාධාරණත්වය කථා කරන්නේ. ඒ කට්ටිය කරපු අපරාධය ඉගෙන ගත්ත මේ තරුණයන් අද තවමත් නොමහට ගිහිල්ලා ඒගොල්ලන්ව ප්‍රතිසංවිධානය කරගන්න බැරි නිසා තමයි -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

විජය කුමාරණතුංග වාගෙ කලාකරුවෝ මරලා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අය පුනරුත්ථාපනය කළේ, ජනතා විමුක්ති පෙරමුණත් පුනරුත්ථාපනය කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බණ්ඩාරනායක මැතිනියත්, අපේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් කියන එක අපි කියන්න ඕනෑ. ඒ වාගේම මේ හිරගෙවල් ඇතුළේ අද නීතිගතව තිබෙනවා ඒගොල්ලන්ව පුනරුත්ථාපනය කරන වැඩ සටහන්. මම ඇස් දෙකෙන් දැක්කා. එතකොට මේ කුඩු ගහපු මිනිහා, කුඩුවලට ඇබ්බැහි වුණු කෙනා, ස්ත්‍රී දූෂකයා අරක්කු කසිප්පු බීපු මිනිහා වෙනුවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඒ වැඩ සටහන් තිබෙනවා. ඒ අනුව මේ අය පුනරුත්ථාපනය කරන්න ක්‍රමවේදයක් මේ ආණ්ඩුවේ නැහැ. මෙන්න මේ නිසා තමයි මේ පිරිහීමට අපේ රට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ස්තුතිවන්ත වෙනවා. යහපාලන ආණ්ඩුවේම සාමාජිකයෙක් මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා එල්ලුම්ගහ ගේන්න කියන එක රට පාලනය කරගන්න බැරි නිසා, රටේ තිබෙන ආර්ථිකය කඩා වැටිලා තිබෙන නිසා, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි නිසා, ඡන්දය නොතියන නිසා මේ කරුණුවලට මොකක් හරි විෂබීජයක් ගෙනැත් දාලා මිනිස්සුන්ගේ මනස වෙනස් කරන්න හදනවා විතරයි. ඒ නිසා මේ පළාත් සභාවේ බදු ගෙවන මිනිස්සුන්ගේ මේ මුදල් මේ සභාව ඇතුළේ කාබාසිනියා කරන යෝජනා ගේනවාට අපි වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට තවත් අපේ ස්තුතිය, ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.04]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම දීර්ඝව අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන් විවාදාත්මක යෝජනාවක්, කාරණයක් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම විවාදාත්මකයි කිව්වේ, මේ වන විට සමාජයේ විවාදාත්මක නිසා. මම කල්පනා කරන හැටියට ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදාත්මක කාරණාවක් නොවෙයි. රටේ නීතිගත වුණු නීතියක්. ඒකේ බලය ජනාධිපතිතුමාට තිබෙනවා. ක්‍රියාත්මක කරනවාද නැද්ද කියන කාරණය එතුමා අතේ තිබෙන්නේ. මේ කාරණාව අද මේ සමාජයේ විවාදාත්මක තත්ත්වයට පත් කරලා තිබෙන්නේ, රටේ ප්‍රශ්න අමතක කරන්න. ඒක තමයි මේ යහපාලන ආණ්ඩුවේ අවුරුදු තුනක ක්‍රියාදාමය ආපස්සට හැරිලා බැලුවාම බොහොම පැහැදිලිව පේනවා. රටේ කථා

කළ යුතු, විවාද කළ යුතු ප්‍රශ්න පැත්තක තියලා, විවාද නොකළ යුතු ප්‍රශ්නයක් ඉස්සරහාට අරගෙන විවාද කරනවා. ඇයි මම විවාද කරන්න ඕනෑ නැහැයි කියන්නේ? මේක අපේ රටේ නීතියෙන් ජනාධිපතිට තිබෙන බලයක්. ඒක ජනාධිපති ක්‍රියාත්මක කරන එකයි තිබෙන්නේ. මේක කැබිනට් එකට දාලා රටේ ජනතාවගෙන් අහ අහ ඉන්න දෙයක් නොවෙයි. මේක නීතිය තුළ සම්මත වුණු දෙයක්. ජනාධිපතිගේ බලාධිකාරයේ තිබෙන දෙයක්. ජනාධිපතිට ඒක ක්‍රියාත්මක කරන්නයි තිබෙන්නේ. මේ වෙන කිසිවක් නොවෙයි. රටේ තිබෙන ප්‍රශ්න ටික, ජනතාවගේ ප්‍රශ්න යට ගහන්න මේ කාරණාවක් ගෙනැල්ලා දැන් විවාද කරනවා. ඒක තමයි ඇති වෙලා තිබෙන්නේ.

ඊළඟට මම එක කාරණයක් කියන්න කැමැතියි. මම පෙරේදා දැක්කා, සිරකරුවන් අරගෙන බන්ධනාගාර රථයක් යනවා. ඒක පිටිපස්සේ STF වාහන දෙකක් යනවා. ඉස්සරාහින් එකයි. පස්සෙන් එකයි. අපි දන්නවා, අපේ රටේ STF එක කිව්වාම බොහොම ගෞරවයක් තිබෙන පිරිසක්. යමක් හරියට කරයි කියලා විශ්වාස කරන පිරිසක්. STF එක සම්බන්ධව බොහොම ගෞරවයක් තිබෙනවා. ඇත්තටම මාත් එක්ක ඒ වෙලාවේ IP මහත්මයෙක් සිටියා. මම එතුමාගෙන් ඇහුවා, මේ බන්ධනාගාර බස් රථය පසුපසින් STF එක යන්නේ ඇයි? කියලා. එතුමා කිව්වා, ඕක තමයි දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය කියලා. ප්‍රභූවරයෙක්ට දෙන ආරක්ෂාව මේ බන්ධනාගාරයේ යන හිරකරුවන්ට අපට දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. පාතාළයේ ප්‍රබල පාතාළකරුවන්ට දැන් STF එකේ ආරක්ෂාව දෙනවා. උසාවියට යන කොට, බෙහෙත් ගන්න යන කොට. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම මම විශ්වාස කරන හැටියට බරපතළ අපරාධ කරපු උන්ට මරණ දඬුවම දෙන්න ඕනෑ. ඒක මගේ පෞද්ගලික මතය. මම බොහොම පැහැදිලිව කියනවා. මහ පරිමාණයෙන් කුඩු විකුණන, මේවාට හවුල් වෙන, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා, බන්ධනාගාර දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑය කියලා. කුඩු ජාවාරම්කරුවන්ට සියලු සැප පහසුකම් හැන්ඩ් ෆෝන්, මේ සියලු දේවල් මේවාට සම්බන්ධ හැම කෙනාටම දඬුවම දෙන්න ඕනෑ. මේක අහ අහා ඉන්න දෙයක් නොවෙයි. රටේ ජනාධිපතිතුමාට බලය තිබෙනවා. ඒ අධිකාරිය තිබෙනවා. ඔවුන් ක්‍රියාත්මක කරන්න ඕනෑ.

හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපේ රටේ ඉතිහාසය දිහා බැලුවාම අපට අපේ රටේ හිටපු රාජ්‍ය නායකයන් ගැන මතකයන් තිබෙනවා. ඔවුන් ගැන ජනතාවගේ යම් අදහසක් තිබෙනවා. කාලයක අපි බත් දුන් පියා කියලා කෙනෙක්ව හඳුන්වනවා. ඒ වාගේම අපට නිවාස හදලා දීපු රාජ්‍ය නායකයා කියලා කෙනෙක්ව හඳුන්වනවා. යුද්ධය ඉවර කරපු නායකයා කියලා කෙනෙක්ව හඳුන්වනවා. මේ වර්තමාන ජනාධිපතිතුමා මේ රට පාලනය කරලා අවුරුදු තුනක් වෙනවා. අපට හඳුන්වන්න තිබෙන්නේ, කියපු කිසි යෙක් නොකරපු ජනාධිපතිතුමා කියලා. දැන් ආසන්නම උදාහරණය. පෙට්‍රල්, ඩීසල් වැඩි කළා. එතුමා සාකච්ඡාවක් කැඳෙව්වා. කැඳවලා තීරණයක් ගත්තා, ඒක නවත්වන්න. කී දවසද ඒක තිබුණේ? ආයේ කැබිනට් එකට ආවා. වැඩි කළා. මට මතකයි දැන් අවුරුද්දකට විතර ඉස්සෙල්ලා එතුමා පොළොන්නරුවේ ගිහිල්ලා, මහා ලොකු කථාවක් කරලා කිව්වා, බදු වැඩි කරන්න දෙන්නේ නැහැයි කියලා. තමුන්නාන්සේලාට මතක ඇති. හැබැයි ඒක ඒ විධියටම ක්‍රියාත්මක වුණා. ඒ නිසා රටේ ඉතිහාසයේ හිටපු රාජ්‍ය නායකයන් අපි විවිධාකාරයෙන් හඳුන්වනවා. ඒ නිසා මේ ජනාධිපතිතුමාට මම වාගේ පොඩි මිනිහෙක් අභියෝග කරන්නේ නැහැ. මම කවුද රටේ ජනාධිපතිතුමාට අභියෝග කරන්න. මම අභියෝග කරනවා. රටේ ජනාධිපතිතුමාට කරුණාකරලා පුළුවන් නම් මේ නීතියවත් ඔබතුමා ක්‍රියාත්මක කරලා පෙන්වන්න. ක්‍රියාත්මක වෙන්නේ නැහැ. කිසි දෙයක් කරගන්න බැරි ජනාධිපති. කියපු කිසි දෙයක් නොකරපු ජනාධිපති හැටියට ඉතිහාසගත වෙනවා. ඒකෙන් බේරෙන්න නම් අඩුම වශයෙන් මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීමවත් මේ ජනාධිපතිට ක්‍රියාත්මක කරලා පෙන්වන්නය කියලා අපි අභියෝග කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.09]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

බේරුවල කුඩු නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මාත් පිළිගන්නවා. බේරුවල කුඩු නැති වුණාට සමහර ව්‍යාපාරිකයෝ කුඩු ගෙනැල්ලා විකුණනවා. ඒ වැරැදිවලට දඬුවම් දිය යුතුමයි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව කලෝචිත යෝජනාවක් හැටියට මම පිළිගන්නේ මරණ දණ්ඩනය දඬුවම් ලැබිය යුතු කෙනාට දිය යුතුමයි. ඒ පිළිබඳව තර්කයක් නැහැ. විරෝධයක් නැහැ. අනිවාර්යයෙන්ම වැරැදි කරපු කෙනාට දඬුවම් ලැබිය යුතුයි. ඒ වාගේම අද ලෝකය අරගෙන බැලුවාම ලෝකය පාලනය කරන ලෝක පොලීසිය ඇමරිකාව. මේ ඇමරිකාවත් එක්ක තමයි යුරෝපා සංගමයත් පාලනය වන්නේ. මුළු ලෝකයත් එක්කම SI ලා, OIC ලා වාගේ තමයි ලෝකය පාලනය වන්නේ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම ලෝකයේ දන්නවා. වැරැදි කරපු අයව මරන්නේ නැතිව වැරැදි නොකරපු අයව මැරුවා කියන එක. ඒ පිළිබඳව එතුමාගේ කථාවේදීම කියනවා, ඉරාකයේ ජනාධිපතිතුමාව මරනවා. හැබැයි, ඇමරිකාව 91 දී ඉරාකයට ගහනවා න්‍යෂ්ටික අවිආයුධ තිබෙනවා කියලා. ඒ ලේකම්වරයා Donald Rumsfeld. ව්‍යාපාරිකයෙක් හැටියට හඳුරුවනවා ඇමරිකාවේ පෙට්‍රල් හොරකම් කරන්න. ඒ නිසා ඇමරිකාවට ගහන්න සැලසුම් කරලා, උතුරු ඇමරිකානු රටවල්වල ගිවිසුම් ගහනවා ඉරාකයට ගහන්න ඉස්සෙල්ලා පෙට්‍රල් ලබා දෙනවා කියලා. කොන්ත්‍රාත් පදනම මත තිබෙන බුදල් ටික ලියාගෙන. 2003 දී ඇමරිකානු ආරක්ෂක මණ්ඩලය තීන්දු කරනවා, Donald Rumsfeld. ඉරාකයට කරපු වැරැද්ද නිසා ඔහුව වැරැදිකරු හැටියට චෝදනා කරලා, ඔහුට Surcharge එකකුත් අතට පත් කරලා ඔහුව ඉවත් කරනවා. ඔහුට පැන්ෂන් එකක් අද වනතුරු ලැබෙන්නේ නැහැ. එහෙම හොරෙක් තමයි ලෝකය පාලනය කළේ. ඒක වෙනම කථාවක්, ගරු ඇමතිතුමනි. ඒ කථාව කථා කරන්න ගියා නම් අපේ රටේ ප්‍රශ්න ගැන කථා කරන්න බැරි වෙනවා. එතුමා කථා කරපු නිසා මම කිව්වේ.

ඒ වාගේම මේ රට බෞද්ධ රටක් හැටියට මේ රටේ සුද්දන්ගේ නීතිය ක්‍රියාත්මක වන නිසා මේ සියලුම දේවල් ක්‍රියාත්මක කරන්නත් අපට අපහසුතාවයක් තිබෙනවා. බෞද්ධ රටක් හැටියට අපි පිළිගන්නවා. මම හිතන්නේ පෙර කළ පව් වැරැදි නිසා තමයි, පූර්ව කුසල කර්මවේදනීය කර්මය ඇති වෙන්නේ කියලා බෞද්ධ ධර්මය තුළ කියන නිසා ඒ තීන්දුව ඒ අය විසින්ම, දෙවියන් විසින්ම, ඒ දේවතාවන් විසින්ම එය කරාවි කියලා. නමුත් එහෙම කරන්න ගියා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහා පරිමාණයේ විශාල අපරාධ ගණනාවක් ඇති වෙනවා. අපට මතකයි සේයා සදෙව්මි දැරියගේ මරණය. දූෂණය කරලා මරණයට පත් වුණාම මුලින්ම පොලිසිය ගිහිල්ලා අල්ලන්නේ මාමාව. වැරැදිකරු හැටියට ගෙනැල්ලා දඬුවම් දීලා, පත්තරේ වාර්තාකරුවෝ ඉදිරිපත් කරලා, හොරාව අල්ලා ගත්තා කියලා හිරගත කළාට පස්සේ වැරැදි කරපු දූෂිතයාම දුරකථනයෙන් කියනවා, අරයා නොවෙයි කළේ. අහවල් පුද්ගලයා. වැරැදි කරපු කෙනාගේ සහෝදරයා කියලා. එයාවත් ගෙනැල්ලා අත්අඩංගුවට අරගෙන අර මාමාව නිදහස් කරනවා. නිදහස් කළාට පස්සේ එයත් නොවෙයි, වැරැදි කළේ. දුරකථන පණිවිඩය දීපු අර කැළෑවේ හැංගුණු මනුස්සයා කියන එක තීන්දු වෙලා තිබෙනවා. හැබැයි, මේ පොලිසිය ජනතාවට දීපු පණිවිඩය තමයි මම මේ කියන්නේ. හැබැයි එදා ලෝක පොලිසිය එහෙම කළේ නැහැ. කවුද කියලා අවසාන තීන්දුවකට ඇවිල්ලා තීන්දුවකට දුන්නත් එයත් වැරැදියි කියලා අවුරුදු 13 කට, 14 කට පස්සේ තීන්දු දෙනවා නම්, මේ රටේ අවුරුද්දෙන් දෙකෙන් තීන්දු කරද්දී වැරැදි කරපු අයව නොවෙයි එල්ලලා මරන්නේ. තමන්ගේ විරෝධී කෙනාව එල්ලලා මරණ තත්ත්වයකට මේ රටේ නීතිය පත් වෙලා තිබෙනවා කියන එක කනගාටුවෙන් කියන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ප්‍රකාශ කළා වාගේම මම කියන්න හැදුවේ මුලින්ම වෙනස් කරන්නට ඕනෑ, මේ රටේ පොලීසිය. පොලීසිය B පත්‍රිකාව දෙන කොට සාධාරණව දෙනවාද කියන එක දැනගන්න වෙනවා. කිසිම හොරෙකුට නැත්නම් වැරැදිකරුවෙකුට තමන්ගේ B පත්‍රිකාව උසාවියේ ගිහිල්ලාත් කියවන්නේ නැහැ. දැනගන්න ලැබෙන්නේ නැහැ. බන්ධනාගාර නිලධාරී තෝතැන්නක් කරලා තිබෙනවා, ඔබතුමා කියනවා වාගේම සමානවම අද වැරැදිකරුවන්ගේ තෝතැන්න වෙලා තිබෙන්නේ බන්ධනාගාරය. එතැනට වෙලා රැකවරණයත් එක්ක අද වැරැදි සිද්ධ කරනවා කියලා හැමෝම කියනවා. හැබැයි මටත් තවත් ඒකට විශේෂ ඌන පූර්ණයක් එකතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, වැරැදිකරුවන් එළියේ ඉඳගෙන රස පරීක්ෂකගේ වාර්තාව ගෙන්වනවා. රස පරීක්ෂක රුපියල් ලක්ෂයට වාර්තාව දෙනවා. ඔබ

උසාවියේදී කියන්න. මෙය කුඩු නොවෙයි. ඔබ තමයි ගෙනාවේ කියලා කියන්න කියලා. නමුත් එදා රස පරීක්ෂක පොරොන්දු වෙලා ඒ වාර්තාව ඉදිරිපත් කරනවා කියලා, වාර්තාව ඉදිරිපත් කරන කොට උසාවියට ඉදිරිපත් කරන්නේ එය කුඩු නොවුණත් මේ මත්ද්‍රව්‍ය ජාතියක්. ඒ නිසා මෙයාට දඬුවම් ලබා දෙන්නය කියලා. එතකොට අර මෙහෙයවන, කුඩු ගේන නිලධාරියා නිදහසේ ඉඳගෙන තමයි මේ සියලුම දේවල් කරන්නේ. වැරැදිකරුවාට දඬුවම් ලැබිලා නිසා එතැනින් ෆයිල් එක වැහෙනවා. ඒ නිසා මේවා මේ රටේ සොයා බලන්නේ නැහැ, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමනි. මේවා සොයා බලන්නේ නැති නිසා තමයි නිවැරැදිකරුවන් මිනීමැරුමට ලක් වෙන්නේ. ඒ හා සමානවම මිනීමරුවන් හැටියට මේ රටේ ඇත්තටම සැරිසරන නායකයෝ ඉන්නවා. ඒ නායකයෝ සැලසුම් සහගතව තමන්ගේ පාලනය රැකගන්නත් මිනීමරපු ඉතිහාසය මේ රටේ තිබෙනවා. ඒ හා සමානවම තමන්ගේ ආර්ථිකය රැකගන්න මිනී මරණ ව්‍යාපාරිකයන් ඉන්නවා. තමන්ගේ ව්‍යාපාර වර්ධනය කරන්න රුකුලක් වෙනවා නම්, අවහිරයක් වෙනවා නම් සැලසුම් සහගතව මිනී මරණ අයත් මේ රටේ ඉන්නවා. ඒ අය අහු වෙන්නේ නැහැ. සල්ලි වලට ගත්ත කෙනා හිරබත් කන කොට, ඒ අයට දඬුවම් දෙන කොට සැලසුම් සහගතව මුදල් වියදම් කරලා අත්අඩංගුවට ගන්න කෙනාව අත්අඩංගුවට ගන්නට දේශපාලන අධිකාරිය මේ රටේ ඉදිරිපත් වෙනවා. එයාට තහංචි ඉදිරිපත් කරනවා. ඒ නිසා මේ සියලුම දේවල් වෙනස් විය යුතුයි. මේ රටේ මරණ දඬුවමක් ලබා දිය යුතුයි.

හොඳ ඉතිහාසයක් අපට තිබෙනවා. අපේ රජය තුළත්. පසුගිය දවස්වල රජයක් හැටියට අධිකරණ ඇමතිතුමා නඩු දාන්න ඉදිරිපත් කරන්න එපා කියලා ඉදිරිපත් කරපු පත්‍ර වාර්තා අපි දැකලා තිබෙනවා. හිටපු ආරක්ෂක ලේකම්තුමා මේ රටේ ජනමාධ්‍යකරුවන් මැරුවා කියන එක මේ රටේ වාර්තාවක් වෙලා තිබෙනවා. අදත් නඩුවක් අහගන්න බැරි උසාවියක් හැටියට මේ රට පාලනය වෙන්නේ. මේ රට කොහේද යන්නේ කියලා කනගාටුවෙන් අපි මතක් කරන්න වෙනවා. ඒ නිසා මේ සියලුම දේවල් එක්ක සංසන්දනය කරලා බලද්දී මේ රටේ නීති පද්ධතිය වෙනස් වෙන්නට ඕනෑ. විශේෂයෙන් පොලීසිය භාරව ඉන්න අභ්‍යන්තර කටයුතු පිළිබඳ ආරක්ෂක අමාත්‍යවරයා මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. අධිකරණ අමාත්‍යාංශය මේ රටේ තදින් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ සියලුම දේවල් ක්‍රියාත්මක නොකරන තුරු මේ රටේ පාලනයක් ඇති වෙන්නේ නැහැයි කියන එක මතක් කරන්නට වෙනවා.

ඒ නිසා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිත යෝජනාවක් හැටියට අපි පිළිගන්නවා. ඒකේ තර්කයක් නැහැ. වැරැදිකරුවන්ට මරණ දඬුවම දෙන්න ඕනෑ. මම දන්නා එක් චූදිතයෙක් ඉන්නවා. ඔහුට මරණ දණ්ඩනය නියම වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔහු කුඩු කිලෝවක් මදුරාසියේ සිට ලංකාවට ගේනකොට එයාර්පෝට් එකේදී ඔහු අත්අඩංගුවට ගත්තා. ගත්තාම ඔහුගේ ඒජන්ත ඒ කියන්නේ, මහා පරිමාණ මොළකරු ඔහු ළඟට ගිහිල්ලා කිව්වා - බන්ධනාගාර කොමසාරිස්ගේ ආරාධනය ඇතිව ගිහිල්ලා බලලා කථා කරලා කිව්වා, ඔබ මේ වැරැද්ද පිළිගන්න. ඔබ නිදහස් වෙනවා. මේ කුඩු නොවෙයි කියලා. නමුත් වැරැද්ද පිළිගත්තාම ජීවිතාන්තය දක්වා සිර දඬුවමට ලක් වුණා, ඒ වැරැද්ද පිළිගත්ත කෙනා. හැබැයි අර මහා පරිමාණ ව්‍යාපාරිකයා අදත් මදුරාසියෙන් ලංකාවට එන්නේ නැහැ. මදුරාසියේ සිට තවමත් ලංකාවට කුඩු එවන පුද්ගලයෙක් හැටියට ඔහු ජීවත් වෙනවා. ඔහු ශ්‍රී ලාංකිකයෙක්. එහෙමනම් මේවා ගැන මේ රටේ නීතිය සොයන්නේ නැහැ. මේ අය ගැන Interpole පොලිසියට දැනුවත් කරලා නැහැ. මේ අය අත්අඩංගුවට ගන්න බලයක් නැහැ. මේ සියලුම දේවල්වලට දඬුවම් ලබා දිය යුතුයි. විශේෂයෙන්ම සැලසුම් සහගත මිනීමරුවන්ට අනිවාර්යයෙන්ම මරණීය දණ්ඩනය ලබා දිය යුතුයි. හේතුව ඒ සැලසුම් සහගත මිනීමැරුමක් කරන්නේ, පවුලක් විනාශ වනවා විතරක් නොවෙයි. ඊට පස්සේ ඉදිරි කාලවලදීත් එයාට විරුද්ධ වන ඒ සියලුම බලවේග විනාශ කරනවා කියන්නේ මේ කුඩු උවදුර වාගේම විනාශයක් මේ රටට පත් වෙනවා කියන එකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපට මේ රටේ ක්‍රියාත්මක වන නීතිය වෙනස් කරලා, කිසිම දෙයක් නොකරපු ජනාධිපතිතුමා මේ දේ හරි ඉටු කරලා මේ රටේ අනාගතයට දායාදයක් හැටියට ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.19]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් කාලෝචිත යෝජනාවක් අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම හිතන්නේ මේ යෝජනාව පිළිබඳව - අර අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක විවාදයට ගත යුතු කාරණාවක් නොවෙයි. රටක නීතිය ක්‍රියාත්මක නොකිරීම තුළ තමයි මේ ප්‍රශ්නය දැඩි ලෙස උග්‍ර වී ඇත්තේ. ගෙවී ගිය කාලය තුළ මම හිතන්නේ මහා පරිමාණයේ කුඩු, විවිධ මත්ද්‍රව්‍ය මේ ලංකාවට ගෙන ඒමත් තුළ මම හිතන්නේ රටේ සෑම ගමකම තරුණ ජීවිත, පාසල් දරුවන්ගේ ජීවිත විනාශයට පත්වෙලා තිබෙනවා. මේ සෑම ගරු මන්ත්‍රීවරයෙක්ගේම මුවින් පිට වෙන්නේ මත්ද්‍රව්‍ය ලංකාවට ගෙන එන, ගෙන්වන මහා පරිමාණයේ පුද්ගලයා පැත්තක සිටිද්දී විකුණන සමාන්‍ය මිනිහාවම තමයි ගිහිල්ලා ඇතුළට දාන්නේ. මේකට සම්පූර්ණයෙන් වගකිව යුත්තේ පොලීසිය කියලා සමහරු කිව්වා. පොලීසිය කිව්වාට පස්සේ, පොලීසිය කියලා ඔක්කෝටම චෝදනා කරන්න බැහැ. බන්ධනාගාරයේ නිලධාරීන් කිව්වාට පස්සේ බන්ධනාගාරගේ හැම නිලධාරියෙකුටම චෝදනා කරන්න බැහැ. මේවාට උදව් කරන, ආරක්ෂා කරන, ඒ සියලු පුද්ගලයන් මේ හැම අංශයකම ඉන්නවා.

මම පුංචි උදාහරණයක් පෙන්වන්නම්. කළුතර දිස්ත්‍රික්කයේ මේ වන කොට කසිප්පු ජාවාරම මහා පරිමාණයෙන් ප්‍රසිද්ධියේ ක්‍රියාත්මක කරනවා. හැබැයි ලංකාවේ කළුතර දිස්ත්‍රික්කයේ කසිප්පු අල්ලන්න බැහැ. ඔබතුමා දන්නවා නේ ගරු මන්ත්‍රීතුමා? අද මේ වන විට හවස ගියාම ගමේ තරුණ ජීවිත පාර අයිනේ 10, 15 ක් කසිප්පු බීලා වැටිලා ඉන්නවා. අපි මේවා සභාවල කථා කළා. දිස්ත්‍රික් කමිටුවේ කථා කළා. නීතිපතිතුමාට තවම බැරි වුණා මේ නීති සංශෝධනය කරලා පොලීසියට අවශ්‍ය කරන ශක්තිය දෙන්න. මේ කසිප්පු ටික අල්ලන්න. Excise එකෙන් අල්ලන්න ගියාම, සමහර Excise එකේ නිලධාරීන් අල්ලන්නේ නැහැ. හැබැයි රට තුළ යම්කිසි ව්‍යාපාරයක් කරගෙන යන්න මොනවාහරි දෙයක් ක්‍රියාත්මක කරන්න, ලංකාවේ දේශීය නිෂ්පාදනය කරන්න හැදුවොත් අන්න ඒකට ඉන්න දේශපාලනයත් ක්‍රියාත්මක වෙනවා. සමහර නිලධාරීනුත් ක්‍රියාත්මක වෙනවා. මම හිතන්නේ මේවාට නීතිය ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ නැහැ. පොලීසියේ සමහර නිලධාරීන් ඉන්නවා, කුඩු විකුණන තැන්වලින් මුදල් ගන්නවා. රා විකුණන තැන්වලින් මුදල් ගන්නවා. කසිප්පු විකුණන තැන්වලින් මුදල් ගන්නවා. විවිධ වූ අනීතුත් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන පුද්ගලයින්ගෙන් මුදල් අරගෙන මේවා ක්‍රියාත්මක කරනවා. ඒ වාගේ තමයි අද පාසල් දරුවෝ වැඩි හරියක්ම මහා පරිමාණයේ නොයෙකුත් වර්ගයේ පෙති වර්ග, මුද්දර, එහෙම නැත්නම් හක්ක පටස්, මෙවන් වූ ක්‍රියාදාමයන් තුළ යෙදී සිට, අද සමහරු පාසල ළඟ තිබෙන කඩවලට මේ බඩු ටික දාලා, ටොෆි වර්ග ටික දාලා විකුණලා ඒ දරුවන්ව මේ මත්ද්‍රව්‍යවලට හුරු කරලා තිබෙනවා. හැබැයි පොලීසියේ ඉන්න සමහර නිලධාරීන් මේවා අරගෙන ගිහිල්ලා මොනවද කරන්නේ? B වාර්තාව ඉදිරිපත් කරන කොට. සම්පූර්ණ ඒ අහිංසක දරුවාට, ඒ බීපු මනුස්සයාට විරුද්ධව තමයි දාන්නේ. හැබැයි මේ විකුණපු එකාව කවදාවක්වත් නීතියේ රැහැනට ගන්නේ නැහැ.

එහෙමනම් මම හිතන්නේ මේවා ක්‍රියාත්මක කරන්න කටයුතු කරන කොට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා අද මේ මරණ දණ්ඩනය ගැන මේ යෝජනාව ක්‍රියාත්මක කරන්නය කියලා යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. මේක කවදාවක්වත් ඉටු වෙන්නේ නැහැ. උදාහරණයක් වශයෙන් කොකේන් කියන විශාල මත්ද්‍රව්‍ය ටික ගෙනැල්ලා ලංකාවේ ඉන්න ගොඩක් සල්ලිකාරයන් තමයි මේක බොන්නේ. සල්ලිකාරයන් බොන්නේ මොකටද? මේක සමහර දේශපාලඥයනුත් බොනවා. හේතුව තමයි මේක බිව්වාට පස්සේ, මේක ඉරුවාට පස්සේ මේක හොඳට කැලිවලට කපලා සූරලා, තලලා, ලයින් කියලා ගහලා, ලයින් එක දාලා ඇද්දට පස්සේ ඔහුගේ ඇඟේ පාට වෙනස් වෙනවා. පාට ලස්සන වෙනවා. ඔහුට වෙනත් වූ ශක්තියක් ඇඟ තුළට එනවා. හැබැයි මහා පරිමාණයේ සල්ලිකාරයොත් සමහර දේශපාලඥයොත් මේවා දිගින් දිගටම පාවිච්චි කරනවා. ඒවා අපි දන්නවා. නමුත් මේවා ගෙන්වන, මේවා ක්‍රියාත්මක කරලා බෙදා හරින ඒ සියලු දෙනාම සමහර දේශපාලඥයනුත් ආරක්ෂා කරනවා. පොලීසියේ සමහර නිලධාරීනුත් ආරක්ෂා කරනවා. බන්ධනාගාරයේ ඉන්න සමහර නිලධාරීන් මේවා ඇතුළට ගේන්න ක්‍රියාත්මක කරනවා. හැබැයි ඒකේ ඉන්න ASP නැත්නම් Chief jailer දුරකථන අල්ලන්න, කුඩු ටික අල්ලන්න මොනවා හරි කරන්න ක්‍රියාත්මක වුණොත්

අන්න ඒකට සම්බන්ධ වන දේශපාලනඥයා අර උඩ සිට ඔහුව වෙනත් තැනකට මාරු කරනවා. ඒවා අල්ලන අයව වෙනත් තැනකට මාරු කරනවා. අද ගම් තුළත් තිබෙන්නේ මෙන්න මේ දේ තමයි. ඒ නිසා මම දීර්ඝව කථා කරන්නේ නැහැ. හැමෝගෙම තිබෙන්නේ එකම අදහස්. මේ මත්ද්‍රව්‍ය රට තුළ ගෙනෙන ඒ මහා පරිමාණයේ මිනිස්සුන්ට හරි විධියට නීතිය ක්‍රියාත්මක කළා නම් එල්ලලා මරන්න දෙයක් නැහැ. සදාකල් හිරේටම හරි දාලා, පිට රට වාගේ ඔවුන් වෙන් වෙන් ආකාරයෙන් බන්ධනගාරයේ වෙනම කාමරවල තිබුණා නම්, ඔවුන්ට දුරකථන දෙන්නේ නැත්නම්, වෙනත් වූ දේවල් දෙන්නේ නැත්නම්, කන්න ටික දීලා වහලා දැම්මා නම්, මම හිතන්නේ මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. මේක විවිධ විධියට කථා කරන්න පුළුවන්. උදාහරණයකට ලංකාවේ හිර ගෙදරින් තමයි මේ විධියට හිර ගෙදර තුළ සිට මහා පරිමාණයේ මංකොල්ල කෑම්, දූෂණ ක්‍රියාවන්, එහෙම නැත්නම් මිනීමැරුම් සියල්ල සිදු වන්නේ. අද අපේ දකුණු පළාතට යන කොට, පසුගිය කාලය වන විට බලන්න. එක දිගටම මහා පරිමාණයේ මිනීමැරුම් ක්‍රියාත්මක වෙනවා. හැබැයි අහු වෙන්නේ කාවද? සාමාන්‍යය පුද්ගලයෙක්ව. හරි මිනිහාව අල්ලන්නේ නැහැ. හරි මිනිහාව අල්ලලා ගන්න කොට මොකද කරන්නේ? ටක් ගාලා දේශපාලනය ක්‍රියාත්මක කරලා ඔහුව ඇතුළට දානවා. මොකද ඔහුගෙන් ප්‍රශ්න කරන්නවත් ඉඩ දෙන්නේ නැහැ.

එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දිගින් දිගටම මේ පිළිබඳව කථා කරනවාට වඩා හොඳයි රටේ නායක අතිගරු ජනාධිපතිතුමාට පුළුවන් නම් අපි අභියෝග කරනවා. ඔබතුමාගේ ශක්තිය තුළින් මෙන්න මේකට මම හිතන්නේ අත්සන යොදලා හැබැයි වැරැදි කරන පුද්ගලයන්ව විතරක්, මහා පරිමාණයේ වැරැදි කරපු පුද්ගලයන්ව විතරක් හරියට සොයා බලලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. අද හිර ගෙදර ඇතුළේ නිකන් මිනිස්සු ඕනෑතරම් ඉන්නවා. නිකන් බොරුවට දාලා අහිංසක දරුවෝ හිර ගෙදර ඇතුළේ ඉන්නවා. මොකද ඒ සමහර නිලධාරීන්ගේ වැරැදි ක්‍රියා නිසා. අද මිනී මරන්නෙත්, කුඩු විකුණන්නෙත්, නොයෙකුත් වැරැදි කරන්නෙත් පොලිසියේ සමහර නිලධාරීන් කරන ජරා කුජ ව්‍යාපාර නිසා. ඒ නිසා තමයි අද ඔවුන් මහා පරිමාණයේ නරක මිනිහෙක් බවට පත් වෙන්නේ. එන්න එන්නම මේවා වැඩි වෙනවා. එන්න එන්නම දිගටම මේවා ක්‍රියාත්මක කරනවා. හැබැයි, මේවාට හරියාකාරව නීතිය ක්‍රියාත්මක කරලා - අපි බේරුවල, අපි කළුතර - හැබැයි බේරුවලත් මේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පසුගිය කාලයේ මත්ද්‍රව්‍ය විශාල ලෙස ඇල්ලුවා. උදාහරණයකට ගත්තොත් ඒ පැත්තේ බාබුල් කියන ටොෆි වර්ගයක් ඉස්කෝලේ ළමයින්ට කන්න දීලා අල්ලන කොට හැබැයි අර කියන ලොක්කාව ඇල්ලුවේ නැහැ. අර රත්මලානේ සමූපකාර ලොරියෙන් ගෙනැල්ලා, කන්ටේනරයෙන් මහා පරිමාණයෙන් බාපු ඒ සියල්ල ගෙනාපු පුද්ගලයෙක් අද වනතුරුත් නැහැ. මහා පරිමාණයෙන් කොකේන් ගෙනාවේ. මම හිතන්නේ අද ඒවාට වෙච්ච දෙයක් නැහැ. ඒ නිසා අපි මතක් කරනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව හොඳයි. හැබැයි මේක ක්‍රියාත්මක කරලා රටේ හැම ජාතියකටම නිදහසේ ජීවත් වීමේ අයිතිය ශක්තිවන්තව ලබා දෙන්න කටයුතු කරන්න. ජනාධිපතිතුමාට මෙය අත්සන් කරලා ඉක්මණින් ක්‍රියාත්මක කරන්නය කියලා මම ඔබතුමා මාර්ගයෙන් ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 12.27]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඇත්ත වශයෙන්ම අද මත්ද්‍රව්‍ය, කුඩු ජාවාරම් කරන පුද්ගලයන් සම්බන්ධව රටේ ප්‍රවෘත්ති අනුව අපි හැමදෙනාම දැන ගන්නවා. නමුත් ඇත්ත වශයෙන්ම මේකේදී මරණ දඬුවම දෙන්න, එල්ලුම් ගහට යවන්න තීරණය ගන්න ඉස්සෙල්ලා අපි ටිකක් අපේ මට්ටමින් හිතා බලන්න ඕනෑ. අද රටේ තිබෙන වාතාවරණය දිහා බලන කොට 65% ක්, 70% ක් නරක පැත්තට තමයි, හොඳ නැති පැත්තට තමයි හුඟක් ක්‍රියාත්මක වන්නේ කියලා මට පෙනී යනවා. නමුත් මේකේදී අද මුදල් කියන්නේ - අද මුදල් හැම කෙනාටම, හැම තැනටම අවශ්‍ය වෙලා තිබෙනවා. අද පොලිසිය ගැන කථා කළා. නිලධාරීන් ගැන කථා කළා. දේශපාලකයන් ගැන කථා කළා. ජනාධිපතිතුමා ගැන කථා කළා. කාට අපි ඇඟිල්ල දික් කරලා කිව්වත් අපට හදවතක් තිබෙන්නට ඕනෑ. අපට හදවතක් නැත්නම් මේ රට පාලනය කරන්න බැහැ. තම තමන්ගේ හදවතක් තිබුණොත් මේ රට හරියාකරව ගෙනියන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවා. මම සමහරවිට සමහර තැන්වලට යනවා. මන්ත්‍රී කියලා

[ගරු එම්. ෂාෆි රහීම්]

කියන්නේ නැතිව සමහර තැන්වලට ඔහේ සාමාන්‍ය මිනිහෙක් ලෙස ගියාම සමහර තැන්වල සමහර කථා කියනවා. සමහර දේවල්, වැරැදි දේවල් වැරැදි විධියට, සමහර පොලිස් නිලධාරීන් ක්‍රියා කරනවා. මුදල්වලට ක්‍රියා කරනවා. පොඩි දෙයකට සමහරුන්ව හිරේට යවනවා. සමහරු ලොකු වැරැද්දක් කරලා තිබුණත් එයාව නිදහස් කරනවා. ඒ වාගේ මේ රට තුළ සාමාන්‍ය පුද්ගලයන් ඉන්නවා නම් - අපි නිකන් අපේ අසල්වැසියන් ගැන හිතමු කෝ. අපේ පවුලේ අය ගැන. අපේ ගම ගැන. මුදල්වලට කොපමණ මූලිකත්වයක් දෙනවාද? මුදල් දෙනවා නම් ඒ මිනිහා වාගේ වටිනා මිනිහෙක් මේ රටේ නැහැ. වරප්‍රසාද දෙනවා නම් ඒ වාගේ හොඳ මිනිහෙක් නැහැ. දවසක් දෙකක් නොදී හිටියොත් මොකද වෙන්නේ? ඒ වාගේ නරක මිනිහෙක් නැහැ. ඒක ඇවිල්ලා තමන්ගේ පවුල ඇතුළත්, තමන්ගේ බිරිඳ වුණත් සල්ලි දෙනවා නම්, හොඳට සලකනවා නම් ඒ බිරිඳ කියනවා ස්වාමි පුරුෂයා හොඳයි කියලා. ඒ වාගේම අසල්වැසියෙකුට හොඳට මුදල් දෙනවා නම්, තමන් ඉල්ලන දේවල් දෙනවා නම් ඒ මිනිහා හොඳයි. ඇමතිවරයෙකුගෙන් හරි ගෙයක් ඉල්លුවොත් ගෙයක් දුන්නොත්, ඉඩමක් ඕනෑ නම් ඉඩමක් දුන්නොත් අර මිනිහා හොඳයි.

දැනට තිබෙන නීතිය හොඳටම ඇති. නමුත් මේක ක්‍රියාත්මක කරන පුද්ගලයින්ගේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම අද සමහර තැන්වල සමහර කාන්තාවන් මත්පැන් බොනවා. මත්පැන් පොවනවා. අද බලන්න අරක්කු බොනවා කියන්නේ, මරණ ගෙදරටත් අරක්කු අවශ්‍යයි. උපන් දවසටත් අවශ්‍යයි. මඟුල් ගෙදරටත් අවශ්‍යයි. සමහර මඟුල් ගෙවල්වල අරක්කු දුන්නේ නැත්නම් මොකද වෙන්නේ? කියන්නේ ඌ ලෝභයෙක්. මඟුල් ගෙයක් වාගේද? අරක්කු දුන්නේ නැහැ නේ? සමහරු මොකද කරන්නේ? එදාට අරක්කු බොන්න ඕනෑය කියලා පිටින් හරි අරගෙන ඇවිල්ලා මේසේ උඩ තියලා අරක්කු බොනවා. ඒ වාගේ සමාජයක් අද බිහි වෙලා තිබෙන්නේ. මේක වෙනස් කරනවා නම් කොහොමද වෙනස් කරන්නේ? සමහර දේශපාලනඥයන් ඉන්නවා. තැබෑරුම් 10 ක් විතර තිබෙනවා. නමුත් එනකොට සුදු ගහලා ලස්සනට එනවා. ආදායම් මාර්ගය මාසයකට කීයද? ලක්ෂ 02 යි. ලක්ෂ 10 යි. සමහරතැන්වල ඒ වාගේ ලාභ ලබන පුද්ගලයන් ඉන්නවා. ඉතින් අපේ මිනිස්සු මොකද කරන්නේ. රට අරක්කු කියලා ඉස්සෙල්ලා ලොකු දේවල් බොනවා. ඊට පස්සේ වයින් ස්ටෝර්ස් එකට යනවා. ඊට පස්සේ කසිප්පු බොනවා. කසිප්පු බීලා අන්තිමට දවස ගණනේ කසිප්පු බීලා අපේ රටේ රෝහල්වල මැරෙන සංඛ්‍යාව තවම ගණන් කරලා නැතිව ඇති. මම හිතන්නේ ත්‍රස්තවාදයට වඩා අරක්කු බීලා මිනිස්සු මැරෙනවා. අද සිගරට් බොනවා. මේ සිගරට් එක කෙහෙන්ද පුරුදු කළේ. තහනම් කරන්න පුළුවන්. අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් කිව්වා. මේවා නැවැත්තුවොත් අනික් පැත්තෙන් මේ රජය පෙරළන්න මුන්ට ශක්තිය තිබෙනවා. මේ දේශය පාලනය කරන්න ලෙහෙසි පහසු නැහැ. මේක විදේශීය බලවේගය ඇතුල් වෙලා තමයි මේ ගමන යන්නේ. නමුත් හැම කෙනාම හොඳ හදවතින් මේ රට හොඳ තත්ත්වයකට ගේන්න කටයුතු කරන්න ඕනෑ.

මේ වාගේ කුඩු ජාවාරම්. අද බලන්න. පන්සල්, පල්ලි, කෝවිල් කාටවත් හිරිහැර නොකරන, කූඹියෙක්වත් මරන්නේ නැති පුද්ගලයෙක් පාරේ එක පැත්තකට තියන්න. මිනී මරන එකෙක්වයි, කුඩු විකුණන මිනිහෙක්වයි, තව පැත්තක තියන්න. එහෙම දෙපාර්ශවයම දෙපැත්තේ තියලා පොඩ්ඩක් දෙන්නාටම දෙපැත්තේ ගමන් කරන්න කියන්න කෝ බලන්න. ගෞරවය කරන්නේ කාටද? මිනී මරන මිනිහාටයි, අර කුඩු විකුණන මිනිහාටයි තමයි මිනිස්සු සලකන්නේ. අර පන්සල්, පල්ලි, කූඹියෙක්වත් මරන්නේ නැති මිනිහාගේ පැත්තට ගියොත් ඌව මිනිස්සු ගණන් ගන්නේ නැහැ. මිනිස්සුන්ටත් දැන් ලෙඩක් වෙලා තිබෙන්නේ. මම කියන්නේ මිනිස්සු හොඳ මොළයක් ඇතිව කටයුතු කරන්න ඕනෑ. අර කුඩු විකුණන මිනිහෙක් ආවොත් දුර දී දැක්කත්, අර අයියා එනවා නේද? ටක් ගාලා සරම පල්ලෙහාට දාලා ආ.. අයියේ කියනවා. මේ හොඳ පන්සල්, පල්ලි යන මිනිහාට සලකන්නේ නැහැ. අද පුටි බයිසිකලෙන්, මෝටර් බයිසිකලයෙන් ගියොත් සලකන්නේ නැහැ. හොඳ ලොකු වාහනයක ගියා නම්, හොඳට ඇඳුම් පැළඳුම් ඇඳගෙන ගියා නම් අන්න ගෙවල් දොරවල්වලට කැඳවන හැටි. අපි මනුස්සයින්ගේ හදවත තුළ වෙනස් වෙලා තිබෙනවා. එම නිසා මේ කුඩුකාරයින්ට බන්ධනාගාරවල සහයෝගය තිබෙනවා. පොලීසියේ සහයෝගය තිබෙනවා. මේවා නවත්වන්න පුළුවන්. මහ දෙයක් නොවෙයි. මේවා නවත්වන්න හැකියාව තිබුණත් මේක කරන්නේ නැහැ. ඇයි? කළු සල්ලි මේස යටින් යනවා. හොඳ හදවතක් තිබෙන මිනිස්සු මේවායේ ඉන්න

ඕනෑ. හුඟ දෙනෙක් සිටියත්, ජනාධිපතිතුමාට එල්ලුම්ගහ ගේන්න හැකියාවක් තිබුණත්, මම හිතන්නේ නැහැ ඒක ගේන්න පුළුවන්කමක් තිබෙනවා කියලා. නමුත් මේ වැරැදි කරලා තිබෙන මිනිස්සු ගැන හොඳට සොයා බලන්නත් ඕනෑ. අසරණ සමහර දුප්පත් අම්මලා අයියලා මල්ලිලා තමයි මේකේ සමහරවිට හසු වෙන්නේ. නමුත් කෝටිපතියෝ කාමරවලට වෙලා ගනුදෙනු කරනවා. උන් මේකට සම්බන්ධ වෙලාත් නැහැ. උන් සල්ලි ගෙවනවා. මෙතැන සහෝදර ගරු මන්ත්‍රීවරු කථා කළා. සමහර මිනිස්සු මිනී මරනවා. මරණ මිනිහා දන්නේ නැහැ, මම මොනාටද මරන්නේ කියලා. මැරුණු කෙනා දන්නේ නැහැ, මම මොනවාටද මැරුණේ කියලා. ඒ වාගේ තත්ත්වයක අද මේ රට තුළ හුඟක් ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේදී අපි අවංක වෙන්න ඕනෑ. අපි හරි දේ කරන්න ඕනෑ. කාටත් අපි ඇඟිල්ල දික් කරලා එයාට චෝදනා කරලා වැඩක් නැහැ. නමුත් රට තුළ අර ජනාධිපතිතුමා එන්න ඕනෑ. මේ ජනාධිපතිතුමා එන්න ඕනෑ. මේ පක්ෂය හරි නැහැ. අර පක්ෂය හරි නැහැ. ඉතින් මරාගෙන, සල්ලි යොදවලා, ප්‍රශ්න ඇති කරලා, කෝළාහල ඇති කරලා මේ රට තුළ මේ බලය ගන්න හැම දෙයක්ම මොනා හරි කරලා අපි බලයට එන්න ඕනෑය කියලා සමහර මිනිස්සුන්ගේ ආශාවක් තිබෙනවා. මේවා ඔක්කොම වැරැදියි. කවුරු ජනාධිපති වෙලා සිටියත් රටේ ජනාධිපති, ජනාධිපතිතුමා. හෙට තව කෙනෙක් ආවොත් එයත් අපට රටේ ජනාධිපති. කවුරු වුණත් ප්‍රශ්නයක් නැහැ. නමුත් බලයට එන්න මුදල් යොදවනවාද? විදේශ මුදල් මේ රට තුළ ගෙනැල්ලා ඒවා පරිහණය කරලා පල්ලෙහාට වනතුරු මුදල් වියදම් කරලා මේ බලය ගන්න කී දෙනෙක් උත්සාහ කරනවාද? ඒ වාගේම තමයි ආයුධ විකුණන මිනිහා. අද ඇමරිකාව ගැන කථා කළා. සදාම් හුසේන් ගැන කථා කළා. මේ දේවල් ගැන අපට හොඳට අවබෝධ වෙන්න ඕනෑ. අපේ රට ගැන. අවංක හදවතක් තියාගෙන මනුෂ්‍ය ජාතිය ඇවිල්ලා උතුම් ජාතිය හැටියට අපි සලකලා ඉදිරි ගමනට අපි සැම දෙනාම එක් රැස් වෙලා රටේ ජනතාව හොඳ මාර්ගයේ ගෙනියන්න අවංක චේතනාවෙන් අපි කටයුතු කරමුයි කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.36]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන මේ යෝජනාව කාලෝචිත යෝජනාවක් වශයෙන් අපි දකිනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ රටේ කුඩා දරුවාගේ පටන් මහල්ලා දක්වා හැම කෙනෙක්ම දැඩි පීඩනයකට, දැඩි හිරිහැරයකට, දැඩි අපහසුතාවයකට පත් වෙන දෙයක් තමයි මේ මත් ද්‍රව්‍ය, මත් කුඩු, මත්පැන් ජාවාරම. මේක කොහොම හරි මර්දනය කරන එක මේ රටේ පාලකයින්ගේ, ඒ වාගේම මේ රටේ අනිකුත් පාලකයින්ගෙත්, ඒ වාගේම මේ රටේ අනිකුත් බලධාරීන්ගේ යුතුකමක් හා වගකීමක් වෙනවා. ඒ නිසා තමයි මම කියන්නේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද මේ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් කියලා. මොකද එල්ලලා මරලා හරි, මරලා එල්ලලා හරි මේ වැඩේ ඉවරයක් කරන්න ඕනෑ, රටක් වශයෙන් මේ රට පවත්වාගෙන යාම සඳහා.

අපි දකිනවා මේ ආණ්ඩුව බලයට එන කොට, මේ ආණ්ඩුව බලයට ගේන්න බොහොම මහන්සි වුණු කෙනෙක් තමයි මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ. උන්වහන්සේ වේදිකාවේ පුන පුනා කිව්වේ, පසුගිය ආණ්ඩුව කාලයේ මේ රටේ එතනෝල්, එතනෝල් - උන්වහන්සේගේ සුමුදුරු කට හඬින් කිව්වා, තවම මගේ කන්වල රැව්පිළි රැව් දෙනවා. එතනෝල් කියලා ඇදලා වේදිකාවේ දී කිව්වේ මිනිස්සුන්ගේ හදවත්වලට දැනෙන්න. කුඩු, කුඩු, කුඩු කියලා ලොකුවට මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ කණ පැළෙනකම් වේදිකාවල කිව්වා. අද මේ රටේ පත් වුණු ජනාධිපතිතුමා, ඒක නැති කරනවා කියලා ආපු ජනාධිපතිතුමාට ඒක මතක් වෙන්නේ අවුරුදු හතරක් විතර ගියාට පස්සේ. අන්තිම අවුරුදු 1 ½ තිබෙන කොට. ඡන්දය ළඟ නිසා. මේ රටට ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ මේක. හැබැයි මෙච්චර කලක් මේක ක්‍රියාත්මක කළේ නැහැ. ඒ දවස්වල කුඩුවල මිලත්, අද කුඩුවල මිලත්, ඒ වාගේම කුඩු ලබා ගන්න තිබෙන පහසුවත්, ඒ කාලයේ තිබුණු පහසුවත් ගැනත් කල්පනා කළොත් අද රටේ කුඩු කොහොමද ගැවසෙන්නේ කියන එක පිළිබඳව තර්කයක් විතර්කයක් නැහැ. අද හවසට ගමක ලයිට් කණුවක් ළඟට ගිහිල්ලා වටයක් දෙකක් කැරකිලා, එහෙම නැත්නම් බිත්තියක තාප්පයක් ගාව හිමින් සැරේ

[ගරු ජනක වැලිවත්ත]

කැරැකිලා, එහෙම නැත්නම් කම්බි වැටක් ළඟ කැරැකුණොත් කුඩු පැකට් එකක් ගහ යටින් ගන්න පුළුවන්. ඒ වාගේ තත්ත්වයක් මේ රටේ ඇති වෙලා තිබෙන්නේ. නිර්මාණය වෙලා තිබෙන්නේ. මේක මේ ආණ්ඩුව බලයට එනකොට ජනතාවට දීපු පොරොන්දුවක්. මෙතුමන්ලා තමයි මේ ආණ්ඩුව බලයට පත් කළේ. මෙතුමාගේම කථාවේ තිබෙනවා, මේ වන කොට මේක ජාත්‍යන්තර කුඩු බෙදා හරින මධ්‍යස්ථානයක් බවට පත් වෙලා ඉවරයි කියලා. අපි දැක්කා, පසුගිය කාලයේ කුඩු අහු වුණේ කොපමණද? අහු වුණේ නැති කුඩු ප්‍රමාණය කොපමණ වෙන්න ඇතිද කියලා. ඒ නිසා මේ නොහැකියාව තිබෙන මේ ආණ්ඩුව, කිසි දෙයක් නොකරපු මේ ආණ්ඩුව මේ රටේ ආර්ථිකය විනාශ කළා. මේ රටේ ජනතාවගේ ජීවත් වීමේ අයිතිය විනාශ කළා. මේ රටේ සාමය විනාශ කළා. මේ රට මත්ද්‍රව්‍ය වලින් පිරුණු රටක් බවට මේ ආණ්ඩුව පත් කළා. අද කියනවා, එල්ලලා මරන්නම්ලු. එල්ලලා මරන්න අපි දෙන්න ඕනෑ නැහැ. අපේ ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ එල්ලලා මරන්න අපි දෙන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමාට නීතිය අනුව බලය තිබෙනවා. ඕක කිය කිය මාධ්‍යවල දාලා මම එල්ලන්නද? අනේ මම මරන්නද? මම එල්ලන්නද? ඕක පත්තරේ කිය කියා ඉන්න දෙයක් නැහැ. මේක රටේ ප්‍රශ්නයක්. මේක නවත්තනවා කියලා වගකීම භාර ගත්තේ. අර විධායක ජනාධිපති ක්‍රමය වාගේ.

මුල ඡන්ද කාලයේ කිව්වේ. මහින්ද මහත්තයා කිව්වා. කළේ නැහැ. මේ අය එළියට බැස්සේ ඒ හින්දා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කිව්වා. නමුත් ඒක කළෙත් නැහැ. ඒ වාගේ තමයි මේකත්. අද මේක මාධ්‍යට දානවා. ජනප්‍රිය වෙන්න. තව පාරක් ඡන්දය ඉල්ල ගන්න පුළුවන්ද කියලා බලන්න. මේ රට විනාශ කරලා දැම්මා. අද මේක විතරක් නොවෙයි, රටේ ප්‍රශ්නය. අද මත්පැන්, මත්කුඩු හරහා මේ රටේ පාතාලය අද උපරිම හිස ඔසවලා. මිනී මරාගන්න විතරක් නොවෙයි. මේ රටේ සාධාරණ ව්‍යාපාර කරලා, සාධාරණව මිල මුදල් උපයන මිනිහෙකුට ජීවත් වෙන්න විධියක් නැහැ. දුරකථන ඇමතුමක් දෙනවා. අර මොකෙක්ගේද නමක් දාගෙන තිබෙනවා. පාතාලයේ එකෙක්ගේ. ඌගේ නම කියලා අහවල් ගණන අහවල් දවස් දෙකකට ඉස්සෙල්ලා දෙන්න ඕනෑය කියලා. මේ රටේ ව්‍යාපාරිකයන් දැඩි පීඩනයකින් ඉන්නේ. තමන්ගේ අතේ යම් මුදලක් ගැවසෙන මිනිස්සු දැඩි පීඩනයක ඉන්නේ. මුදල් ආයෝජනය කරන්න විධියක් නැහැ. ලොකු මුදලක් දාලා ආයෝජනය කළොත් අරහෙන් කෝල් එකක් එනවා, මෙන්න මේ මුදල් ටික ලෑහැස්ති කරලා තියන්න. මේ මුදල් ටික සතියක්, දෙකක් ඇතුළත ගෙවන්න ඕනෑ. නොගෙව්වොත් මරනවා කියලා. අර අපේ ඇඹුල්ගම ප්‍රදේශයේ සිද්ධියක් සිද්ධ වුණා. පාතාලයෙන් ඇවිල්ලා මුදල් ඉල්ලුවා. මුදල් දුන්නේ නැහැ. අපේ හිතවතෙක්. වැලි රාජු කියලා. නමුත් ඒ මිනිහාට තවම ව්‍යාපාරය කරගන්න බැහැ. මාස ගණනක් වෙනවා. නමුත් තවමත් හරි පාතාලයේ අය අල්ලගන්න පුළුවන්කමක් නැහැ. හැබැයි අපි පසුගිය ආණ්ඩුව කාලයේ දැක්කා. මේවා හොඳින් හෝ නරකින් මර්දනය කරලා තිබුණා. ඒකේ පහසුව රටේ ජනතාව වින්දා. ව්‍යාපාරිකයන් වින්දා. මේ රටට මිනිස්සු ආවා. ආයෝජකයන් ආවා. ස්ථාවරව ව්‍යාපාරයක් කරගෙන ගියා. අර බන්ධනාගාරයේ හිටපු තක්කඩි හොරු ටික මැරුවයි කිය කියා අදත් පුළුවන්ද බලනවා ගෝඨාභය රාජපක්ෂව අල්ලගන්න. නමුත් ඒ හොරු ටික මැරුණු නිසා මේ රටේ ඒ කාලයේ කප්පම් ගත්ත සියල්ල නැවතුනා. ඒවා කවුරුත් අද කථා කරන්නේ නැහැ. එදා දුරකථන ඇමතුම් දීදී දිගින් දිගටම ඔය සෙල්ලම කළා. කුඩු ගත්තා. කප්පම් ගත්තා. සියල්ල පාතාළේ හොල්මන් කළා. ඒවා නැවතුනා. රට තුළ නිදහසේ ඉන්න පුළුවන් වුණා. මිනිස්සු හොඳින් ජීවත් වුණා. තමන්ගේ දේ හරියට ඉස්රහාට ගෙන ගියා. අද මේ සියල්ල නැති වෙලා. රට අසරණ වෙලා.

අද මේ රටේ මිනිස්සු කොපමණ අපහසුතාවට පත් වෙලා ඉන්නවාද කියලා බලාගන්න පුළුවන්, ආගමන විගමන පරීක්ෂණ බැලුවොත්. මේ රටේ ඉගෙන ගත්ත, මේ රටේ බුද්ධිමතුන්, යමක් කමක් තිබෙන පුද්ගලයන් කොපමණ ප්‍රමාණයක් දවසකට රට හැර යනවාද කියලා බලාගන්න පුළුවන්. මොකද, මේ රට පිළිබඳව තිබුණු විශ්වාසය නැහැ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ මේ රටේ යුද්ධය අවසන් වුණාට පස්සේ විශාල පිරිසක්, රට හැර ගිය මිනිස්සුත් මේ රටට ඇවිල්ලා මේ රටේ පදිංචි වුණා. මේ රට ජීවත් වෙන්න හොඳ රටක් බවට පත් වුණයි කියලා ඒ විශ්වාසයත් එක්ක මේ රටේ පදිංචි වුණා. ඒ සියල්ල විනාශ කරලා ගත්තු මේ ආණ්ඩුව මේ වන කොට ජනතාවගේ බලාපොරොත්තුව සුන් කරලා, අද විශාල පිරිසක් දිනෙන් දින, දිනෙන් දින මේ රට හැර යනවා. ජීවත් වෙන්න සුදුසු රටවල් සොයනවා.

ඒ විතරක් නොවෙයි. මේ මාතෘකාවත් එක්ක කථා කරන්න ගන්න කොට කුඩු පාතාල - ඒ වාගේම අද අපේ ආහාර ගැන කථා කළොත් ආහාර සම්පූර්ණයෙන් විෂ ආහාර. කාටවත් ජීවත් වෙන්න හරි ආහාරයක් ගන්න පුළුවන්කමක් නැහැ. ඒකට ආපු ගමන් කිව්වේ Glyphosate නවත්වනවා කියලා. ඊයේ පෙරෙයිදා වන කොට ඒකත් ඉවත් කරලා දාලා. මොකක්ද මේ ආණ්ඩුව කළේ? මේ ආණ්ඩුවේ නොහැකියාව කළේ. වෙන කිසි දෙයක් නැති තත්ත්වයට මේ රට පත් කළා. ඒ නිසා අපි කියන්නේ, මේ රටට ලොකු ප්‍රශ්නයක් මේක. ඒ විතරක් නොවෙයි. හැම දෙයක්ම ප්‍රශ්නයක්. මේවා විශාල ප්‍රශ්නයක් වෙනවා. මේක නවත්වන්න එල්ලුම්ගහ කියන ජනප්‍රිය මාතෘකාව දාලා ජනාධිපතිතුමා හෝ මේ ආණ්ඩුව කාලය ගෙවනවා නම් ඒක විකාරයක්.

මේක නවත්වන්න නම් තිබෙන්නේ මොකක්ද? මේ බන්ධනාගාරයේ ඉන්න නම් 18 ඇවිල්ලා තිබෙන්නේ. එල්ලා මරන්න සුදුසු මිනිස්සු දෙසිය ගණනක් ඉන්නවාලු. නමුත් මේ පුද්ගලයන් 18 දෙනා බන්ධනාගාර නීතිය අනුව නම් එල්ලා මරන්න හෝ මරණ දණ්ඩනය නියම වුණු පුද්ගලයන්ව බලන්න යන්න පුළුවන් පවුලේ ඥාතීන්ට පමණයි. මාසයකට එක පාරයි බලන්න යන්න පුළුවන්. පෝය දවසට ද කොහේද? තව අමතර දවසක් තිබෙනවා. ඉතින් මේ කෙටි කාලය, මේ සීමා කරලා තිබෙන පහසුකම් තුළ මේ මිනිස්සු මේ සියල්ල මෙහෙය වන්න බන්ධනාගාරය ඇතුළට කොහොමද දුරකථන යන්නේ. මේ සම්බන්ධතා ඇති වෙන්නේ කොහොමද? මේවා හරියට නායකයෙක් ඇතිව හරි තැනකින් හරියට පාලනය වෙනවා නම්, මේ බන්ධනාගාර භාරව ඉන්න උදවිය පාලනය වෙනවා නම් ඒ මිනිස්සු වෙන් වෙන්ව තියන්න ඕනෑ. ඒ තිබිය යුතු විධියට තියනවා නම් මේවා බන්ධනාගාරය ඇතුළේ සිට කරන්න පුළුවන් සෙල්ලම් නොවෙයි. හැබැයි ඒ බන්ධනාගාරයේ සිරකරුවන්ට අවශ්‍ය පහසුකම් දෙන වටපිටාව හදලා තිබෙනවා නම් ඒක කරන්න පුළුවන්. අපේ ජනාධිපතිතුමා කිසි දෙයක් දන්නේ නැහැ නේ. හැම දෙයක්ම දන්නේ පත්තරෙන් නේ. ඒ නිසා එතුමාට මේක පත්තරේ වැටුණාට පස්සේ කියෝලා බලාවී. එතුමා ඉස්සෙල්ලා කරන්න ඕනෑ මිනිස්සු ටික එල්ලලා මරණවාද කියන එක තීරණය කරන එක නොවෙයි. බන්ධනාගාරය ඇතුළේ සිට ඕක මෙහෙයවන එක නවත්වන්න. බන්ධනාගාර ඇතුළට දුරකථන, බන්ධනාගාරය ඇතුළත සිට තිබෙන සම්බන්ධතා පවත්වන ක්‍රමය ඉස්සෙල්ලා නවත්වන්න කටයුතු කිරීමයි. ඊළඟට කරන්න ඕනෑ, පොඩි කුඩුකාරයෙක් අල්ලා ගත්තාම - අපේ රටේ බුද්ධි අංශය ඉතා ප්‍රබලයි. සමහර සිද්ධි දිහා දැක්කාම අපි දකිනවා, බුද්ධි අංශය ඉතා ඉක්මණින් හොරු අල්ල ගන්නවා. හැබැයි කුඩුකාරයෙක්ගේ කුඩු පැකට් එක ගේන පොඩි කුඩු කාරයා අල්ල ගන්නවා. ඒක ලැබුණු පඩි පෙළ උඩට උඩට නඟින්නේ නැහැ. මඟදී අතහැරනවා. මේවා සොයන එක සුළු දේවල්. නමුත් මේවා සොයා ගන්න බැහැ. ඒ නිසා අපි කනගාටු වෙනවා. මේ රට බලයට ගන්න දිගින් දිගට කෑ ගහලා, වේදිකාවල් පලලා, එක ප්‍රචාරයක්වත් දීගන්න බැරි වුණු මේ ආණ්ඩුව මේ කරන වැඩේ හෝ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

හැබැයි විකල්පය මේක නොවෙයි. මේ මිනිස්සු 18 දෙනා එල්ලුවා කියලා මේ රටේ කුඩු නැති වෙන්නේ නැහැ. කුඩු නවත්වන්න නම් ඕනෑ කරන වැඩේ තමයි කුඩු එන තැන සොයලා, පොඩි තැන සිට උඩට ගිහිල්ලා, පඩි පෙළේ උඩම එකාව අල්ලාගෙන, ඊළඟට ඔය බන්ධනාගාරවලට තිබෙන සම්බන්ධතා සියල්ල නවත්තලා, බන්ධනාගාර තුළට යන දේවල් නවත්තලා, බන්ධනාගාර ඇතුළේ සිට තමයි පාතාළ සියල්ල මෙහෙය වන්නේ. ඒ සියල්ල නවත්තලා පාලනයක් ඇතිව රට ගෙනි යන්න එතැනට කටයුතු කරන්න. හැබැයි මේ දේ කෙසේ හෝ නවත්තන්න කියන එක තමයි මේ වැඩ බැරි, මෙලෝ දෙයක් කරගන්න බැරි ආණ්ඩුවෙන් අපට ඉල්ලන්න තිබෙන්නේ. ඒක නිසාම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාම මේක ගෙනාපු එක ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, මෙතුමන්ලා අපේ ආණ්ඩුවෙන් එළියට බැස්සේ අපේ ආණ්ඩුවෙන් ඒවා වුණේ නැති නිසා කියලා නේ කියන්නේ. අද මේ වන කොට තව ඡන්දය තියන්න තිබෙන්නේ අවුරුදු 1 ½ ක් වාගේ කෙටි කාලයක්. ඒ නිසා දැන් හරි මේක මතක් වෙලා මෙතුමන්ලාගේ බලාපොරොත්තු ටික අපි හිතන විධියට ඉෂ්ට කරලා දෙනවා නම් හොඳයි. නැත්නම් මෙතුමන්ලාත් නිකන් නිකමුන් බවට පත් වෙනවා. ඒ තත්ත්වයට පත් නොකරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි, ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම අපේ ගරු මන්ත්‍රීවරු සියලු දෙනාම එළියේ ඉන්න නිලධාරී ගැන, සියලු දෙනා ගැන අපි වැරදි කථා කරනවා. අපි කනගාටු වෙනවා. මේ මන්ත්‍රීවරු ටික නැත්නම් සභාවක් කරගෙන යන්නත් බැහැ. 104 ක් ඉන්න සභාවක රටටම බලපාන ප්‍රශ්නයක් මේ කථා කරන්නේ. ඒ කථා කරන වෙලාවේ අපිම බලන්න ඕනෑ කී දෙනාද සභාවේ ඉන්නේ කියලා. මේ පෙ.ව. 09.00 සිට ප.ව. 01.30 දක්වා ඉන්න බැහැ. මාසයට දවස් දෙකයි තිබෙන්නේ. ඇත්තටම ඒ ගැන කනගාටු වෙනවා. මේ වාගේ වැදගත් දෙයක්, රටටම බලපාන දෙයක් සාකච්ඡා කරන අවස්ථාවක. මීළඟට අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.46]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව පිළිබඳව විවිධ අදහස් වලට සවන් දෙන්න අවස්ථාව ලැබුණා. කෙසේ වෙතත් මම විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීතුමා මේ රටේ මිනිස්සු විඳින අනේක විද දුක් කරදර හිංසාවන් විඳ දරා ගැනීමේ නොහැකියාව තුළ හදවතේ උපන් අනුකම්පාවෙන් සහ කරුණාවෙන් මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කරන්න ඇතියි කියලා. අපි විවිධ දේශපාලන කෝණවලින් බැලුවත් සමස්තයක් වශයෙන් මේ රටේ අවසාන වශයෙන් මේ සිදු වෙලා තිබෙන අනර්ථය නිසා දුක් විඳින්නේ, රටේ අහිංසක ජනතාව. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මිනිස්සුන්ට තීරණය කරන්න සිද්ධ වෙලා තිබෙනවා, අද මේ රට තුළ තවදුරටත් ජීවත් වෙනවාද? හැකියාවක් ඇතොත් වෙනත් රටකට යන්න අවස්ථාව යොදා ගන්නවාද කියන කාරණාව. මා එසේ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ අපට බොහෝ දේ කියා දී තිබෙනවා. අපේ රටේ පාලන බලය අස්ථාවර කරන්න මූලික වශයෙන් ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් 1815 රාජසිංහ රාජ සමය අවසාන කරන්න භාවිතා කළේ මුලින්ම මේ රටේ ජීවත් වුණු ප්‍රභූ පන්තියට අරක්කු බොන්න, දුම්වැටි පානය කරන්න, ඔළුව අවුල් වන මේ වාගේ මත්ද්‍රව්‍ය භාවිතා කරන්න පුරුදු පුහුණු කරපු එකයි. පසුව 1970 දශකයේ මුල් ආරම්භයේ මේ රටේ ඇති වුණු එල්.ටී.ටී.ඊ. සංවිධානය මුලින්ම රට තුළ ක්‍රියාත්මක වුණු ඔවුන්ගේ ප්‍රධාන ජාවාරම වුණේ කුඩු මේ රටට ගෙනැල්ලා, ඒවා බෙදා හැරීමේ ක්‍රියාවලියයි. ඒ වාගේම පසුගිය කාලයේ, අපේ පූංචි කාලයේ, විවිධ අවස්ථාවලදී අපිත් ඇහුවා මේ රටේ මත් ද්‍රව්‍ය භාවිතා කිරීම සහ ඒවා විකිණීම සම්බන්ධව චෝදනාවට ලක් වුණු මිනිසුන් පිළිබඳව. අපි ඒ දවස්වල ඇහුවේ රා, කසිප්පු, ගංජා. මේ තුන් වර්ගය තමයි අපි ඒ දවස්වල ඇහුවේ. ඒවා භාවිතා කිරීම සහ ඒවා වෙළඳාම් කිරීම සම්බන්ධව නීතියේ රැහැනට අහු වුණු මිනිස්සු පිළිබඳව.

1977 ආණ්ඩුව බිහි වෙලා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මේ අලුත් මැතිවරණ රටාව හඳුන්වලා දීලා, මහා ධනස්කන්ධයක් භාවිතා කරලා මැතිවරණ කරන්න පුරුදු වුණාට පස්සේ මේ සියලු ජාවාරම්කරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සපයා දෙමින් මේ රටේ දේශපාලඥයින් මේ විනාශකාරී ක්‍රියාවන්හි යෙදෙන මිනිස්සුන්ගේ මුදල්වලින් දේශපාලනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කළාට පස්සේ තමයි මේක මහා පරිමාණ වශයෙන් පැතිර යන්න පටන් ගත්තේ. අද අපි කථා කරන්නේ මොනවාද? අද අපි කථා කරන්නේ හෙරෝයින් පිළිබඳව. එහෙම නැතිව කොකේන් පිළිබඳව. එහෙම නැත්නම් බාබුල්. හසිස් මේ වාගේ අතිභයානක මත්ද්‍රව්‍ය පිළිබඳව තමයි අද අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. දැන් අපට පැහැදිලිව පේනවා, එදා සුද්දාගෙන් ආරම්භ වුණු මේ ජාතිය විනාශ කිරීමේ ක්‍රියාවලිය ඉතා ඉහළ මට්ටමකට අද ගොඩනැගිලා තිබෙනවා. අද අම්මාව, තාත්තාව අඳුරන්නේ නැති දරුවෝ සමාජය තුළ හැසිරෙනවා. වැඩිහිටියන්ව අඳුරන්නේ නැති දරුවෝ සමාජය තුළ හැසිරෙනවා. තමන්ගේ සහෝදරියව නාඳුනන සහෝදරයන් රට තුළ හැසිරෙනවා. තමන්ගේ සුජාත දියණියව හඳුනන්නේ නැති තාත්තලා රට තුළ හැසිරෙනවා. ඒ සමස්තය මේ රටේ ජාතියේ පිරිහීම බව අපි තර්ක කරන්න ඕනෑ කාරණාවක් නොවෙයි.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි එකිනෙකාට චෝදනා කර ගැනීමෙන් මේ ප්‍රශ්නයට අපට විසඳුමක් තිබෙනවාද කියන කාරණාව තමයි ඊළඟ කාරණාව. අපි කළ යුත්තේ කුමක්ද කියන කාරණාව ඊළඟ

කාරණාව. අපි පැහැදිලිවම දන්නවා. මේ රටේ මේ ජාවාරම්කරුවන්ට තවදුරටත් මේ රට තුළ නිදැල්ලේ හැසිරෙන්න අවස්ථාව ලැබුණොත් සමස්ත ජාතියම විනාශයට පත් වෙනවා කියන කාරණාව. ඒක පැහැදිලිව පේනවා. ඒ වාගේම මේ රටේ ජීවත්වන රටට අත්‍යවශ්‍ය වැදගත් උගත් ජාතිය ගොඩනඟන්න පුළුවන් බුද්ධිමතුන් මේ රට හැර යනවා කියන කාරණාව අපි පැහැදිලිව දන්නවා. අද රටේ ජීවත් වෙන්න සුදුසු වාතාවරණයක් රට තුළ නැහැයි කියලා ඔවුන් බොහෝ දෙනා කථා කරන බව අපි දන්නවා. ඒ නිසා මේ රට තුළ තවදුරටත් රකින්න නම්, මේ රටේ අනාගත දරුපරපුර රකින්න නම් අපි මොකක්ද කළ යුත්තේ? එල්ලුම්ගහ තීරණය කිරීම පිළිබඳව අද යුරෝපා සංගමය දරන මහා දැවැන්ත විරෝධය - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට ජාතිය වසර තිහක් තිස්සේ මහ දැවැන්ත විනාශයකට ලක් කරලා, මහා මෙල්ච්ඡ ත්‍රස්තවාදියෙක් හැටියට ක්‍රියා කරපු ප්‍රභාකරන්ව කොටු වුණු වෙලාවෙත් යුරෝපා සංගමය ලංකාවට ආවා. ඒ ආවේ මේ ජාතියට ආදරේටද? නැහැ. ඒ ත්‍රස්තවාදියාගේ රැකවරණය, ආරක්ෂාව වෙනුවෙන්.

එහෙම එකක් තමයි යුරෝපා සංවිධානය. යුරෝපා සංවිධානය අද මොකක්ද කරන්නේ. ලෝකයේ සමස්ත තුන්වැනි ලෝකයේ රටවල් අමු අමුවේ හූරා කමින්, ඒ රටවල්වල පාලන බලයට ඇඟිලි ගහලා, තමන්ගේ බලය පතුරවමින්, ඒ රටවල්වල ජීවත් වෙන මිනිස්සුන්ට මහ අමානුෂීය වද හිංසා පමුණුනවා. සම්බාධක පමුණුවමින්. ඒ අයගේ නීතියට රීතියට ගරු නොකරන කිසිම රටකට නිදහසේ ජීවත් වෙන්න ඉඩ නොදෙන තත්ත්වයට අද යුරෝපා සංගමය ලෝකයේ ආධිපත්‍යය අතට අරගෙන කරන හිංසාකාරී ක්‍රියා අපි දැඩි ලෙස ප්‍රතික්ෂේප කළ යුතුව තිබෙනවා. අදත් වෙන්නේ එහෙමයි. අද එල්ලුම්ගහ බැරි නම් මොකක් හරි මේ රටේ තිබෙන ප්‍රශ්නවලට මේ රටේ ජනාධිපතිවරයා සහ ජනතා පරමාධිපත්‍යය පිළිබඳ වගකීම දරන අය තීන්දු තීරණ ගන්නවා. අපි එක දෙයක් පිළිගන්නවා. මේ රටේ නීතියේ සාධාරණත්වය, සමානාත්මතාවය හරියාකාරයෙන් ක්‍රියාත්මක වෙනවාද කියන කාරණය පිළිබඳව අපට විශාල ගැටලු තිබෙනවා. ඒ පිළිබඳව ගැටලු තිබෙනවා. මම මේ රටේ අධිකරණ පද්ධතිය විවේචනය කරනවා නොවෙයි. ජනාධිපති නීතිඥයෙක් සාමාන්‍යයෙන් නඩුවකට ඉදිරිපත් කරන්න දවසකට ලක්ෂ ගණනාවක් මුදල් ඕනෑ. දුප්පත් මිනිහෙක් කොපමණ නිරවද්‍ය වුණත් ඔහුට විරුද්ධව තිබෙන චෝදනාවකදී ජනාධිපති නීතිඥවරයෙක් උසාවියේ තමන් වෙනුවෙන් පෙනී සිටින්න අවශ්‍ය කරන මුදල් නැති නිසා සමහරක් විට ඔහු අසාධාරණයට ලක් වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවට පුළුවන්කමක් වෙලා නැහැ, මේ රටේ ජීවත්වන අහිංසක මිනිසුන්ගේ රැකවරණය සම්පාදනය කරලා දෙන්න. ඒ ප්‍රශ්නය අපට තිබෙනවා. අපි දකිනවා, අමු අමුවේ මිනිස්සුන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝණය වන පරිසරයක් මේ තුළ නිර්මාණය වෙලා තිබෙනවා කියන කාරණාව.

නමුත් අද අපට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ, එල්ලුම්ගහ තීරණය කිරීමේදී නියත වශයෙන්ම රටේ සමස්ත ජනතාවට නීතියේ තිබෙන සුරක්ෂිතභාවය, සාධාරණත්වය භුක්ති විඳින්න තිබෙන පරිසරය සම්පාදනය වෙලා තිබෙනවාද කියන කාරණය. ඒ ප්‍රශ්නය අපට තිබෙනවා. එසේ සමස්ත ජනතාව, දුක් විඳින අහිංසක මිනිස්සුන්ට, ආර්ථික වශයෙන් දුර්වල මිනිස්සුන්ටත් මේ රටේ යුක්ති ගරුකව නීතියේ සාධාරණත්වය හරියාකාරයෙන් විඳදරා ගන්න පුළුවන්කමක් තිබෙනවා නම් එල්ලුම්ගහ ක්‍රියාත්මක කිරීමට උචිත පරිසරය ඒ තුළ සම්පාදනය වෙනවා. අද මේ රටේ කුඩු විකුණන ජාවාරම්කරුවන්, පාතාළ ලෝකය මේ රටේ ජීවත් වන මිනිස්සුන්ගේ අයිතිය අමු අමුවේ උල්ලංඝණය කරන කොට ඔවුන් දෙස බලාගෙනම අපි නීතිය ක්‍රියාත්මක කරන්න සැරසෙනවා නම්, අවට පාරිසරික තත්ත්වයන් පිළිබඳව සමූහය හදවතින්ම අමතක කරලා දානවා නම් ඒ තුළ සාධාරණත්වය ඉෂ්ට වෙයි කියලා හිතන්නවත් අපට හැකියාවක් ඇත්තේ නැහැ. කෙසේ වෙතත් මේ රටේ නම් ජීවත් වෙන්න මනුෂ්‍යයෙකුට පුළුවන් පරිසරය අද නැහැ. ඒක නැවත නැවතත් කිව යුතුයි. අපේ රටේ ජීවත්වන අහිංසක මිනිස්සු ගැන හිතන්න අවශ්‍යයි. මොකද ඒ මිනිස්සු තමයි මේ ලොකු ලොකු මිනිස්සු කවුරුත් ජීවත් කරවන්නේ. එතකොට පාලකයා කවුරු වුණත්, ජනාධිපති පුටුවේ වාඩි වෙලා ඉන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හෝ වෙනයම් කෙනෙක් වුණත්, අග්‍රාමාත්‍යවරයාගේ පුටුවේ වාඩි වෙලා ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා හෝ වෙන කෙනෙක් වුණත් මේ කවුරුන් හෝ මේ රටේ ජනතාවගේ ආරක්ෂාව, රැකවරණය සම්පාදනය කරලා දෙන්න බැරි නම් ඒ පුටුවේ වාඩි වෙලා ඉන්න සුදුසුකමක් නැහැ. ඔවුන්ට සුදුසු නැහැ, ඒ පුටුවේ තවදුරටත් අසුන් ගෙන මේ රටේ ජනතාව මෙවැනි පීඩාකාරී තත්ත්වයකට පත් වෙනවා නම්, රැකවරණය සම්පාදනය කරන්න තමන් අපොහොසත් නම් ඒ තුළ තවදුරටත් රැඳී සිටීමේ යුක්ති ගරුක අයිතිවාසිකමක් නැහැ.

[ගරු ජගත් අංගගේ]

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අතිශයින්ම කනගාටු වෙනවා, අද දවසේ මේ සිදු වෙලා තිබෙන තත්ත්වයන් පිළිබඳව. මම හිතන්නේ නැහැ, මේ පවතින තත්ත්වය ඉතාමත් ක්ෂණිකව වෙනස් කරන්න පුළුවන්කමක් අපට තිබෙයි කියලා. විනය ගරුක ජාතියක් හැටියට අපට විශාල වගකීමක් තිබෙනවා. මම කියන්නේ නැහැ, මේ ආගම නිවැරැදියි. මේ ආගම වැරැදියි කියලා කියන්න මට අයිතියක් නැහැ. නමුත් සමස්ත බෞද්ධ ජනතාවක් ජීවත් වන රටක්. බෞද්ධ පරිසරයක් තුළ අවිහිංසාවාදය හිස දරාගෙන තමන්ගේ ජීවන ප්‍රතිපත්ති සකස් කර ගන්නා රටක්. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙන්න පුළුවන්. නබිනායක තුමන් වෙන්න පුළුවන්. මේ කිසිම ආගමක ශාස්තෘවරයෙක් කියලා දුන්නේ නැහැ, හිංසනය තුළ තමන්ගේ ජීවන රටාව ගොඩනගාගන්න. නමුත් අද ඉතාමත්ම අවාසනාවන්තයි. ඉතාමත්ම කළකිරීමෙන් යුතුව පවසන්නේ. උසාවියේ නඩුවක් තිබෙන, නඩුවකට යන මනුෂ්‍යයෙක් හයයි. නීතිඥ මහත්මයාට රුපියල් විසි දාහක්, තිස් දාහක් දීලා දවස ගණනේ ගෙදර එන එක වෙන කතන්දරයක්. නමුත් කල්පනා කළොත් එහෙම අර මනුෂ්‍යයා නීතිඥ මහත්මයාට සල්ලි දෙනවාට වැඩිය ලාභයි රුපියල් ලක්ෂ පහක් දීලා, අරුට කොන්ත්‍රාත් එකක් දීලා මරලා දැම්මාම. හෙට අනිද්දා වන කොට අධිකරණයේ පිහිටට වැඩිය පාතාළ ලෝකයේ පිහිට පතන රටක් තමයි මේ නිර්මාණය වෙන්නේ.

ඒ නිසා අපි කවුරුත් මේ පිළිබඳව ඉතාමත් ගැඹුරින් හිතන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා පිළිබඳව මේ රටේ ජනතාව කෙරෙහි ඇතිවෙලා තිබෙන අවිශ්වාසයෙන් - දැන් මේ කථා කරපු මන්ත්‍රීවරු මේ හැන්සාඩ් එක අරගෙන කියෙව්වොත් එතුමාට තේරෙයි. මේ මන්ත්‍රීවරු වරින් වර උපුටා දක්වන කාරණා ඔබතුමා විසින් කරන ලද කිසිදු ප්‍රකාශයක්, ජාතියට කරන ලද පොරොන්දු මෙතෙක් ඉෂ්ට කිරීමට ඔබතුමා අපොහොසත් වීම නිසා ජනතාවගේ විශ්වාසය යම් දුරට ඔබතුමා තුළින් ගිලිහිලා තිබෙනවා. ඒක පැහැදිලියි. දැන් මේ හැන්සාඩ් වාර්තාව එතුමා පරිශීලනය කළොත් එතුමාට තේරෙයි මොනතරම් තමන්ගේ අතින් අතපසුවීම් වෙලා තිබෙනවාද කියන කාරණාව. මේවා මහහැර යාම තුළ වෙලා තිබෙන ජනතා අප්‍රසාදය අතිමහත්. ඒ නිසා මේ කාරණාව දිහාවත් ඍජුව බලලා, නිර්භීතව, එඩිතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමන්ට ලැබිලා තිබෙන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට කාගෙන්වත් විමසීමක් කරන්න ඕනෑත් නැහැ. යුරෝපා සංගමයට යට විය යුතුත් නැහැයි කියන කාරණාව අපි මේ සභාවේ දී ඉතා පැහැදිලිව කියනවා. යුරෝපා සංගමයට මහින්ද රාජපක්ෂ මහත්මයා යට වුණා නම් අදත් එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් මේ රටේ ජනතාව පීඩාවට පත් වෙනවා. යුරෝපා සංවිධානයේ ප්‍රබල රටවල් එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට කළ බලපෑම්වලට යට වුණා නම් ජනාධිපතිවරයා, අපි තවමත් ප්‍රභාකරන්ගේ යටත් පුරවැසියන්. ඔහු කියන විධියට ජීවත්වෙන්න ඕනෑ මිනිස්සු තවමත්. උතුරු - නැගෙනහිර ප්‍රදේශවල මිනිස්සුන්ට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් පරිසරය අදත් නැහැ. එදා ඒ විධියට අවනත වුණා නම්. ඒ නිසා මේ මොහොත ජාතියේ ඉතාම වැදගත් අවස්ථාවක්. මේ අවස්ථාව ජනාධිපතිවරයා අතේ තිබෙන්නේ. ඔහුට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවශ්‍ය සියලු බලතල සම්පාදනය කර දී තිබෙනවා. ඔහුට තිබෙන්නේ තීරණය ගැනීම පමණයි. ඒක කැබිනට් මණ්ඩලයෙන් අහන්න ඕනෑත් නැහැ. වෙන කෙනෙකුගෙන් අහන්න ඕනෑත් නැහැ. කොන්ද කෙලින් තියෙන, කශේරුකාව කෙලින් තිබෙන නායකයෙක් හැටියට ජාතිය ආපදාවකට ලක් වෙලා තිබෙන මොහොතක ඒ තීන්දු තීරණ ගැනීමේ පූර්ණ වගකීම ඔහු සතුයි කියන කාරණාව සිහිපත් කරමින්, මේ රටේ ජනතාවගේ අනාගත සුභ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීමට ඔහුට ආත්ම ශක්තිය, ධෛර්ය වර්ධනය වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මීළඟට මූලාසනයට ගරු නියෝජ්‍ය සභාපතිතුමා පැමිණෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සුසිල් කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.59]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ යෝජනාව ගැන බොහෝ තර්ක විතර්ක ඉදිරිපත් වුණා. හැබැයි සමහර අදහස්වලින් තේරුණා, මේක නිකන් ජාත්‍යන්තර කුමන්ත්‍රණයක්ද කියලා. ඒ දක්වා මේක මේ දිවෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත් මේකේ වටපිටාව දිහා අපි හැරිලා බැලුවොත් මේ කාරණය ඉතාම සරලයි. මේකේ ඉතාම සංකීර්ණ බවක් නැහැ. ඔය කියනවා වාගේ. හැබැයි මෙතැන අපි හඳුනාගත යුතු ප්‍රශ්න කීපයක් අපේ රටේ තිබෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ දේ තමයි මේ රටේ නීතිය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නීතිය පිළිබඳ තිබෙන ප්‍රශ්නය තමයි ඉස්සෙල්ලා විග්‍රහ කරගන්න ඕනෑ. දැන් හරි සරල උදාහරණයකින් කියනවා නම්, මේ නීතිය හා පවතින බලාධිකාරිය ක්‍රියාකාරීත්වය ගැන පසුගිය කාලයේ බොහෝ අදහස් මතු වුණා. විවේචන ඉදිරිපත් වුණා.

මට මතකයි විජයකලා මහේෂ්වරන් හිටපු ඇමතිවරිය කිව්වා, උතුරට කුඩු අරගෙන යන්නේ දේශපාලඥයෝ කියලා. එතකොට මොකක්ද මේ කියන්නේ? මේ කියන්නේ මේ රටේ නීතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කරන ඒ බලාධිකාරියේ ප්‍රශ්නයක් තිබෙනවා. දැන් අපට මතකයි පසුගිය කාලයේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා විශේෂ කාර්ය බලකායේ පරීක්ෂණ කණ්ඩායමක් ගිහිල්ලා එක්තරා ඇමතිවරයකුගේ නිවස වැටලුවා. වැටලුවාම මොකද වෙන්නේ? රටේ ජනාධිපතිවරයා හෙලිකොප්ටරයෙන් ඔහුගේ ගෙදරට යනවා. යනවා විතරක් නොවෙයි. කරට අත දාගෙන බදාගෙන Sorry මල්ලි කියනවා. දැන් මෙහෙමද රටක නීතිය ක්‍රියාත්මක විය යුත්තේ? චෝදනාවක් එල්ල වුණාම ඒ චෝදනාව පිළිබඳව පරීක්ෂා කරන්න අදාළ ඒ බලාධිකාරියට ඉඩ දෙන්න ඕනෑ. අපේ රටේ එහෙම ඉඩ දෙන්නේ නැහැ. මෙන්න මෙතැන එක ප්‍රශ්නයක්. ඉස්සෙල්ලා අපි මේක බේරගන්න ඕනෑ. එල්ලුම්ගහ නොවෙයි ඉස්සෙල්ලා කථා කරන්න ඕනෑ. මේක බේරාගත්තා නම් අපට මේ යන ගමන ආපසු හරවන්න පුළුවන්. අපට මතකයි, VIP ගාඩ් එක තියාගෙන සමහරු මේ රටේ කුඩු බිස්නස් කළා. අපට මතකයි සිද්දික් කියන කුඩු ජාවාරම්කාරයාට VIP ගාඩ් එක දුන්නා. ආරක්ෂාව දුන්නා. මම කියන්න අවශ්‍ය නැහැ. කවුද ආරක්ෂාව දුන්නේ කියලා හැමෝම දන්නවා. මේ රටේ හිටපු ආරක්ෂක ලේකම්වරයා. හිටපු ආරක්ෂක ලේකම්වරයා දුන්නේ. ඒක නිසා මේක බරපතළයි. දැන් ඊළඟ කාරණය බලන්න කෝ? දැන් අපේ ජනාධිපතිතුමා ගේනවා යෝජනාවක්. මොකක්ද? අපේ ජනාධිපතිතුමාගෙන් තමයි මේක මතු වෙන්නේ. මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න. එල්ලලා මරන්න. මේක හරි සරලව කියනවා නම් එල්ලලා මරන්න. Capital Punishment. නැත්නම් Death penalty. එල්ලා මැරීම. මොකක්ද එල්ලා මැරීම කියනේත්? අපරාධයකට රාජ්‍යය විසින් පවතින නීතිය පාවිච්චි කරලා ඝාතනයට නිල තත්ත්වයක් ලබා ගැනීම. රාජ්‍ය නිල ඝාතනය තමයි එල්ලා මැරීම කියලා කියන්නේ. අපි මෙතැනට යනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. අපට මතකයි, හිටපු අගමැතිතුමාගේ පුතා මැදිහත් වෙලා තාත්තාගේ අත්සන අරන් දෙනවා, කුඩු කිලෝ 360 ක් නිදහස් කරගන්න. මේවා අමතක වෙලා නැහැ. මේවා අපි දන්නවා. හැබැයි අද ඔහු කවුද? ඔහු අද පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයා. කොහේද ඉන්නේ? ජනාධිපතිතුමා ළඟ. මම හිතන්නේ එහෙම දේවල් මේ රටේ සිද්ධ වුණා. හැබැයි, එදා නීතිය ක්‍රියාත්මක කරන්න ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා මෙතැන නීතියේ ප්‍රශ්නයක් තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කරන අයගෙත් ප්‍රශ්නයක් තිබෙනවා.

දැන් අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළා, 54 වගන්තිය ගැන. කුඩු ඇල්ලුවොත් ග්‍රෑම් 05 ට වැඩි නම් අනිවාර්යයෙන්ම පොලීසිය අල්ලපු කුඩු ප්‍රමාණය තීරණය කරන්නේ අත්අඩංගුවට පත් වුණු පුද්ගලයා පොලිසියට ගෙවන ගණන මත. පොලීසියට ගෙවන ගණන වැඩි නම් කුඩු ග්රෑම් 05 අඩු වෙනවා, ග්රෑම් 04 ට. පොලීසියට ගණක් ගෙවන්න බැරි එකෙක් අතේ කුඩු ටික තිබුණොත් එහෙම ඌට 54 ගහනවා. ඒක නිසා තමයි මේ කුඩු ජාවාරම්කාරයා ඇවිල්ලා අපේ මන්ත්‍රීවරුන්ට කියන්නේ, අනේ සර් 54 ගහන්න දෙන්න එපා කියලා. මේක තමයි ඇත්ත. ඒ නිසා මොකක්ද වෙන්නේ? පොලීසිය ඇතුළේ නීතිය කඩා වැටෙනවා. උල්ලංඝණය වෙනවා. ප්‍රශ්නය කාගේද? ප්‍රශ්නය වැරැදිකාරයාගේද? ප්‍රශ්න ය අපරාධකාරයාගේද? නැහැ. ක්‍රියාත්මක කරනන්නගෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා මේක අපි හඳුනාගන්න ඕනෑ. මේ ළඟදී අපේ පොලිස්පතිතුමා මොකක්ද කියන්නේ. පොලිස්පතිතුමා කියනවා, ආසියාවේ අංක එකට අපේ රට ඉන්නවා.

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

මොනවයින්ද? කුඩුවලින්, ස්ත්‍රී දූෂණවලින් සහ මිනීමැරුම්වලින්. කවුද මේ කියන්නේ? මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරියේ නායකයා. ඔහු එහෙම කියමින් පොලීසියේ අයට කියනවා, ඔයගොල්ලෝ සියලුදෙනා උදේට භාවනා කරන්න ඕනෑය කියලා. ඒ නිසා කොතැනද වෙනස් වෙන්න ඕනෑ. නීතිය සහ නීතිය ක්‍රියාත්මක කරන බලාධිකාරිය සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේක වෙනස් වෙන්නේ නැහැ.

අපි පසුගිය කාලයේ දැක්කා. නීතියෙන් වරදකරුවන් වුණු අය නිදහස් වෙනවා. කුඩුකාරයෝ නිදහස් වෙන එක අහන්න දෙයක්ද? අපි දැක්කා, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග නිදහස් වුණු විධිය. අනූෂ පැල්පිටලා නිදහස් වුණු විධිය අපි දැක්කා. අධිකරණ තීන්දු මොකද වෙන්නේ? ආපසු හැරෙනවා. එතකොට අධිකරණය දන්නවා, මේ දේශපාලනය ඉදිරියේ නීතියට තිබෙන්නේ ඉතාම අඩු වටිනාකමක්. නීතියට දෙන්නේ ඉතාම අඩු ලංසුවක්. ඒකෙන් වෙන්නේ අපරාධකාරයෝ නීතියෙන් රිංගලා යනවා. වැරැද්ද කාගේද? ආයි සැරයක් වැරැද්ද එන්නේ රටේ පාලකයන්ගෙන්. පාලකයෝ නොවෙයිද මේකට වග කියන්න ඕනෑ. නීතිය ශක්තිමත් කිරීම පාලකයන් සතු යුතුකමක්, වගකීමක් නොවෙයිද? නීතිය හදන්නේ, මේ රටේ සම්මත කරන්නේ කොහෙන්ද? ඔය පාලකයෝ ඉන්න තැන නොවෙයිද ඒක කෙරෙන්නේ. එහෙමනම් මේ ජනප්‍රිය කථාවලින් මේ අපරාධ රැල්ල වළක්වන්න බැහැයි කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා.

දැන් බලන්න. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට විරුද්ධව අද නඩු අහන්නේ නැහැ. ඇයි? විනිසුරුවරුත් පුටුවෙන් බැහැලා යනවා, නඩු අහන්න බැහැයි කියලා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේ වෙලා තිබෙන්නේ ඔවුන් විසින් අපේ මේ සමාජය මත පතිත කරලා තිබෙන ඒ ප්‍රචණ්ඩත්වයයි. ඒ දේශපාලනයේ වෛරීභාවය බරපතළ විධියට මේ සමාජය වෙලාගෙන යන්න ඔවුන් පසුගිය කාලයේ සැලැස්සුවා. අද bench එකෙන් බැහැලා යන්නේ, පුටුවෙන් බැහැලා යන්නේ ඇයි? හෙට දිනයේ මට මොකක්ද වෙන්නේ කියන භය ඔවුන්ට තිබෙනවා. එහෙමනම් කොතැනද වැරැද්ද? එහෙමනම් මෙතැනයි ජනාධිපතිතුමාට හදන්න තිබෙන්නේ. එහෙම නැතිව එල්ලලා මරනවා, එල්ලුම්ගහ ගේනවයි කියලා නොවෙයි කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා. ඒ නිසා මම කැමැතියි, මේ අපේ රටේ බොහොම කථා බහට ලක් වුණා. විශේෂයෙන් මම කැමැති නැහැ නම් සඳහන් කරන්න. යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන්. කතෝලික සභාවේ ඉහළම නායකයෙක් කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන්. පාප් වහන්සේ කියපු දෙයක් මම කැමැතියි මේ වෙලාවේදී මතක් කරන්න. පාප් වහන්සේ මෙහෙම කියනවා.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කාදිනල්තුමා

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පාප් වහන්සේ මෙහෙම කියනවා. "*නූතන නීතියේ ස්වභාවය අනුවත්, මරණීය දණ්ඩනය අසාර්ථක එකකි. මන්ද, එය යුක්තියේ නාමයෙන් ඝාතනය කිරීමට රාජ්‍යයකට බල කරයි.*" යුක්තියේ නාමයෙන් ඝාතනය කිරීමට රාජ්‍යයකට බල කරනවා මේක. ඒ නිසා සාදාචාරාත්මක සමාජයක් තවදුරටත් මේකට ඉඩ දෙනවාද? අපි දන්නවා, ඝාතනය කියන්නේ ආඥාදායක පාලකයන්ගේ තීරණයක්. අපේ වාගේ රටක මේක කොහොම පාවිච්චි කරන්න පුළුවන්ද? අපි දන්නවා. අහිංසක මිනිහෙක් කුඩු පැකට් එකක් දාලා ඕනෑ තරම් හිරේට යවන සමාජ වටපිටාවක් අපේ රටේ තිබෙන්නේ. එහෙම සාමාජ වටපිටාවක් ඇතුළේ කොහොමද මේක කරන්නේ? මට මතකයි. එක්තරා පුද්ගලයෙක් මට මුණගැසුණා. බොරැල්ල වනාතමුල්ල ප්‍රදේශයේ. ඔහු හිර ගෙදරට ගිහිල්ලා තිබුණේ වැරැද්දක් නොකර. ඔහු කියනවා, මම එක්තරා කාලයක කුඩු වික්කා. ඒ මීට අවුරුදු 20 කට කලින්. නමුත් ඒක දන්න නිලධාරීන් පිරිසක් ඇවිල්ලා මගෙන් රුපියල් ලක්ෂ 05 ක් ඉල්ලුවා. උඹ කුඩු විකුණනවා නේද? රුපියල් ලක්ෂ 05 ක් දියන් කියලා ඉල්ලුවාලු. මේ මනුස්සයා දැන් කුඩු විකුණන්නේ නැහැ. හැබැයි, ඔහු රුපියල් ලක්ෂ 05 ක් දීම ප්‍රතික්ෂේප කළා. Excies Department එකේ නිලධාරීන්. මොකද කළේ? ඔවුන් කුඩු පැකට් එකක් දාලා ඇම්මා ඇතුළට. ග්‍රෑම් 05 ට වැඩියි. මේ වාගේ සිද්ධි ඕනෑ තරම් තිබෙනවා. එකක් නොවෙයි. ඒ නිසා අපේ රටේ මේකට ලෙහෙසියෙන් ඉඩකඩ දීලා ක්‍රියාත්මක කළොත් අහිංසක මිනිස්සු ඕනෑ තරම් හිරේට යන්න ඉඩ තිබෙනවා. අර ඇමරිකාවේ

එක්තරා වාර්තාවක සඳහන් වෙලා තිබෙනවා, 2014 එල්ලා මරන්න තීරණය කරලා තිබුණු අයගෙන් 4.1% ක් අහිංසකයන් කියලා. ඒක ඔවුන් සොයාගෙන තිබෙනවා. නීතිය හරියට ක්‍රියාත්මක වෙනවයි කියන රටක, අධිකරණ පද්ධතිය අතිශය ස්වාධීනයි කියලා හිතන රටක, බන්ධනාගාරය ඉතාමත් විනිවිද පෙනෙන ලෙස කටයුතු කරනවයි කියලා හිතන රටක එහෙම නම් ලංකාවේ තත්ත්වය කොහොම වෙන්න පුළුවන්ද කියලා මම අහනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මේ තීරණය කුරිරුයි. අකාරුණිකයි. පුද්ගලයින්ගේ ආත්ම ගෞරවය කෙළෙසනවා. මානව අභිමානය අහිමි කරනවා. සම්පූර්ණයෙන්ම පවුලේ ආත්ම විශ්වාසය, ගෞරවය නැති කරනවා. මේ මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් සිද්ධ වන සමාජයීය හානිය අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ ගැන අපි හිතන්න ඕනෑ. ඒ නිසා පසුගිය කාලයේ වුණා වාගේ වැරදි නොකර රාජ උදහසට ලක් වුණොත් මොකද වෙන්නේ? එල්ලුම් ගහෙන් තමයි නතර වෙන්නේ. ඒ නිසා අපේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ ඝාතනය නීතිගත කිරීම අතිශය බරපතළ එකක්. මේකට අත උස්සනවා කියන කොට මට නම් බොහොම අලුගෝසු හැඟීමක් එන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒකට එකඟ වෙන්න හරි අමාරුයි. මොකද, මේක ඉතාම මිලේච්ඡයි. ඒ නිසා අවුරුදු 42 කට පස්සේ, අපි අවුරුදු 42 ක් ආපස්සට යනවාද කියලා යළි හිතලා බලන්න ඕනෑ. මරණ දඬුවම ක්‍රියාත්මක වුණොත් සියලුම අපරාධ නතර වෙයි කියලා මොකක්ද අපට තිබෙන සහතිකය. එහෙම සහතිකයක් අපේ සමාජයේ නැහැ. නමුත් මේ එල්ලලා මරන්න -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු මන්ත්‍රීතුමා, දැනට මේක ක්‍රියාත්මකයි. අත්සන් කරන්නේ නැති එකයි තියෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම දන්නවා. ඒක තමයි මම කියන්නේ. ජනාධිපතිතුමා මේ අත්සන ගහනවාද නැද්ද කියන එකයි තිබෙන්නේ. ලෝකයේ රටවල් 2/3 ක මේක ක්‍රියාත්මකයි. හැබැයි එහෙම එල්ලන්නේ නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. අපි ආපස්සට යනවාද කියන ප්‍රශ්නය තිබෙන්නේ. ඕනෑ කෙනෙකුට ඕනෑ අදහසක් තිබෙන්න පුළුවන්. හැබැයි මට මගේ මතය දරන්න නිදහස තිබෙනවා. මම කියන්නේ ජනාධිපතිතුමා මේක ක්‍රියාත්මක කරනවා නම් මම ඒකට විරුද්ධයි. එල්ලලා මරණවාට විරුද්ධයි. එල්ලලා මරන්න අත්සන ගහනවාට මම විරුද්ධයි. මොකද අපට පුද්ගලයෙකුට ජීවත් වෙන්න තිබෙන අයිතිය නැති කරන්න බැහැ. ඒක අනුලංඝණීය අයිතියක්. ඒක ආරක්ෂා කිරීම වෙනුවෙන් සිවිල් ක්‍රියාකාරීකයෙක් හැටියට මම පෙනී සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපරාධකරුවන් බිහි කරන සැබෑ මූලය සොයන්නේ නැතිව මේ යන්න හදන ගමන භයානක එකක්. අපරාධ වැඩිවීම සමාජ ආර්ථික දේශපාලන විකෘතියේ ප්‍රතිඵලයක් කියලයි මම විශ්වාස කරන්නේ. වෙනස් කළ යුත්තේ සමාජ ක්‍රමය මිසක්, වරදට දෙන දඬුවම නොවෙයි. ඒ නිසා මේ අපරාධකරුවන් බිහි වීම ජානමය තත්ත්වයන් නොවෙයි. ජාන නිසා නොවෙයි. තාත්තාගෙන්, අම්මාගෙන් දරුවන්ට එන ජාන නිසා නොවෙයි අපරාධකාරයෝ බිහි වෙන්නේ. මේ සමාජ ක්‍රමයේ වැරැද්ද නිසා. සමාජමය කාරණා නිසා. ඒ නිසා ඒකයි වෙනස් කළ යුත්තේ. අපරාධ වැඩි වෙන්නේ, අපේ සමාජය පුද්ගලයා පුහුණු කරන්නේ ආත්මාර්ථයට. ආත්මාර්ථය පුරුදු කරන සමාජයක අනික් සියල්ල අමතක කරනවා. ඒ අමතක කිරීම නිසා, තමන් ගැන විතරක් සිතීම නිසා තමයි මේ අපරාධ ඉහළ යන්නේ. ඒ නිසා අපට ලොකු සමාජයීය වගකීමක් තිබෙනවා. මේ සමාජය මීට වඩා වෙනස් ක්‍රියා මාර්ග හරහා වෙනස් කරන්න. ඒ නිසා මූලය තේරුම් ගෙන විකෘතියෙන් තොර සමාජයක් බිහි කිරීමට කටයුතු කිරීම තමයි මේ රටේ නායකයෝ, පාලකයෝ කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දඬුවමකින් බලාපොරොත්තු වෙන්නේ ප්‍රතිශෝධනය, විශෝධනය, පුනරුත්ථාපනය මිසක් පළිගැනීම නොවෙයි. මේක පළිගැනීමයි. මේකෙන් පෙන්වන්නේ, මේකෙන් පිළිඹිබු වන්නේ මේ රටේ පාලකයින්ගේ අසාර්ථකත්වයයි. එහෙම නැතිව වෙන කිසිදු දෙයක් නොවෙයි. ඒ නිසා නීතිය, අධිකරණය හා බන්ධනාගාරය නිවැරැදි කළ යුතුයි. නිවැරැදි කරන තැනට මේ පාලකයෝ යොමු විය යුතුයි. එහෙම නැතිව ජීවත්වීමට තිබෙන අයිතිය අහිමි කරලා එල්ලුම් ගස ක්‍රියාත්මක කිරීම අතිශය අමානුෂික සහ කුරිරු එකක් කියලා යළිත් මම අවධාරණය කරනවා.

අවසාන වශයෙන් අපේ ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයක් තිබෙනවා. මම ඒක කියන්න කැමැතියි. එතුමා

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

කිව්වා, එල්ලලා මරලා හරි මරලා එල්ලලා හරි මේක නතර කරන්න කියලා. ඉතාම බරපතළයි. එතුමාගේ හිතේ මෛත්‍රීත් ඉන්නවා. එතුමාගේ හිතේ ගෝඨාත් ඉන්නවා කියලා මට ඒකෙන් තේරුණා. මොකද, අද මෙතුමා එල්ලා මරන්න කථා කරන කොට එතුමාගේ හිතේ මතු වුණා එදා මරලා එල්ලුවා කියලා. අපට මතකයි බන්ධනාගාරයේ හිටපු අය මරලා දාපු විධිය. ඒක වුණු විධිය. ඇයි ඒක කළේ කියලා. ඒ නිසා ඒක කරන්න දෙන්න බැහැ. සල්ලි දෙන්නේ නැත්නම් මරනවා කියලා ඔක්කොම කියපු අපරාධකාරයෝ ටික මැරුවා නම් ඒක ආක්‍රමණය කළේ හිටපු පාලකයෝ කියලා මම යළිත් මතක් කර දෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 01.17]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපේ ගොඩක් මන්ත්‍රීවරු කථා කරපු විධියට අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම පළමුව ස්තුතිවන්ත වෙනවා. මොකද අවුරුදු දෙක තුනක් හරි ගිහිල්ලා තමන්ගේ ආණ්ඩුවේ තත්ත්වය තේරුම් ගැනීම පිළිබඳව. මොකද මේක ඇත්තටම මේක රටේ තිබෙන නීතියක්. මේ නීතිය දැන් ක්‍රියාත්මක කරන්නයි ඕනෑ. මේ නීති ක්‍රියාත්මක වෙන්නේ නැති ප්‍රශ්නය තමයි මේ රටේ තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නීතිය ජනාධිපතිතුමා ඇතුළු ඒ යහපාලන රජය එකතු වෙලා මේක ක්‍රියාත්මක කළා නම් ඉවරයි. මේක මේ ක්‍රියාත්මක කරන්න ගේන යෝජනාවක් නොවෙයි. මම හොඳටම දන්නවා, මේක කවදාවක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ කරන්නේ රටේ තිබෙන ප්‍රශ්න වහගන්න, රටේ තිබෙන ප්‍රශ්න මාධ්‍යවල කථා කරන එක නවත්වන්න ගේන යෝජනාවලින් එකක් විතරයි. මේක කථා කරලා, කථා කරලා තව ටික දවසක් යන කොට තව මාතෘකාවක් ගෙනෙයි. එතකොට රටේ මිනිස්සුන්ගේ තිබෙන ආර්ථික ප්‍රශ්න, මිනිස්සුන්ගේ තිබෙන මේ සියලු ප්‍රශ්න යටපත් වෙලා. මාධ්‍යවල සියල්ල යන්නේ මේක විතරයි. ඒ නිසා අපි පැහැදිලිව මතක් කරන්න ඕනෑ. මේකේදී මේ ප්‍රශ්නවලට මම දකින්නේ ගොඩාක්දුරට, 99% ක්ම මේවාට වගකියන්න ඕනෑ වෙන කවුරුත් නොවෙයි. මේවාට වගකියන්න ඕනෑ දේශපාලනඥයෝ. පාලකයෝ. අද ගොඩක් වෙලාවට අපි දැකලා තිබෙනවා, පොලිසියක ස්ථානාධිපති කෙනෙක් පත් කරනවා නම් අදාළ සංවිධායකගේ ලියුම නැත්නම් පත් වෙන්න බැහැ. පත්වෙන්න එයාට ලියුම ඕනෑ. ඒ ලියුම අරගත්ත ඒ පොලිසියේ OIC, පොලිසියේ ස්ථානාධිපති ලියුම ගත්තාට පස්සේ, අර ලියුම ගත්ත මන්ත්‍රීවරයාට, ඇමතිවරයාට මොනවාද කරන්න ඕනෑ. ඒ ඕනෑම ජරා වැඩකට අනුබල දෙනවා. ඒවාට කටයුතු කරනවා. මේක තමයි රටේ තත්ත්වය. මෙන්න මේවයි නැති වෙන්න ඕනෑ. ස්වාධීන පොලිස් කොමිසමක් තිබෙනවා නම් දේශපාලඥයාගේ, ඒ ප්‍රදේශයේ ඉන්න ඇමතිවරයාගේ, මන්ත්‍රීවරයාගේ ලියුම ඕනෑ නැහැ. ඒකට සුදුසු කෙනා තමයි පත් කරන්න ඕනෑ. හැබැයි අද එහෙම එකක් නැහැ. ඒකට පත් වෙන්න දේශපාලනඥයාගේ ලියුම ඕනෑ. මම කියන්නේ මෙන්න මේවා අපේ නිශාන්ත ගරු මන්ත්‍රීතුමන්ලා වෙනස් කරන්න ඕනෑ. මේ යහපාලන ආණ්ඩුව ආවේ වෙනසක් කරන්න කියලා. වෙනසක් කරන්න ආවා නම්, ස්වාධීන කොමිෂන් පිහිටෙව්වා නම්, ඒවාට ස්වාධීනව යන්න ඉඩ දෙන්න ඕනෑ. ඒවා ස්වාධීන යන්නේ නැහැ. අද ඒ නිසා තමයි මේ විධිය වෙලා තිබෙන්නේ.

දැන් බන්ධනාගාරය ගැන කථා කරනවා. බන්ධනාගාරයේ ඉන්න හොරු ටික ගාව හැන්ඩ් ෆෝන් තිබෙනවාලු. දුරකථන තිබෙනවාලු. එළියේ අයත් එක්ක සම්බන්ධ වෙනවාලු. මේකේ වරද කාගේද? මේකේ වරද ඒ අදාළ නිලධාරීන්ගේ. අදාළ ඇමතිතුමිය කියනවා, මම මේ සම්බන්ධව කනගාටු වෙනවාලු. ඇමැතිතුමිය කනගාටු වෙන්න ඕනෑ නැහැ. මේ වාගේ තත්ත්වයක් තිබෙනවා නම් ඇමතිවරු ඉල්ලා අස් වෙන්න ඕනෑ. එයා ඉල්ලා අස් වෙන්න ඕනෑ. බන්ධනාගාරේ ඇතුළේ ඉඳගෙන ඒ හොරු ටික එළියේ game ගහනවා නම්, කුඩු ටික ප්‍රවාහනය කරනවා නම්, පාතාළය මෙහෙයවනවා නම් මේකට වගකියන්න ඕනෑ කවුද? වග කියන්න ඕනෑ විශේෂයෙන්ම යහපාලන රජය ඇතුළු ඒ අදාළ ඇමතිතුමිය. ඇමතිතුමිය කියනවා, මේ වෙන සිද්ධීන්වලට කනගාටු වෙනවාලු. ඉතින් අපට පුදුම හිතුනා. මේ ඇමතිතුමිය කථා කරනවා. ඇමතිතුමිය කථා කරන්න නොවෙයි. ඉල්ලා අස් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපාතිතුමනි, ඒ නිසා අපි පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අද මම පත්තරේක තිබෙනවා දැක්කා.

පාතාලේ කිහිප දෙනෙක්ම මේ ඇමතිවරයෙක්ගේ යටතේ ඉන්නේ කියලා. හෙට අනිද්දා වෙන කොට ඒ කවුද ඇමතිවරයා කියලා නම එළි කරනවා කියලා පත්තරේ තිබුණා. මම එනකොට දෙරණ නාලිකාවේ උදේ යන පත්තර විස්තරවලට කියනවා. (බාධා කිරීමක්) ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. පත්තරේ තිබුණා. පත්තරේ විස්තරේ කිව්වා. මේ ඇමතිවරු යටතේ ඉන්නේ කියලා. පැහැදිලිවම යහපාලන රජයේ වගකිවයුතු ඇමතිවරු තමයි මේ පාතාල මේවා සියල්ල මෙහෙය වන්නේ. ඒ නිසා තමයි මේ රටට මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒක නිසා අපි පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අද තමුන්නාන්සේලා බලන්න. මේ රටේ කුඩු, මත්ද්‍රව්‍ය මේ සියල්ල ගම්වලටත් ඇවිල්ලා, අද ගම්වල මේවා තිබෙනවා. අද මේ දේශපාලනඥයෝ ගොඩක් අය මේවාට අනුබල දෙනවා. මේවාට අනුබල දීම නිසා තමයි මේ දූෂණ වංචා, ස්ත්‍රී දූෂණ මේ සියල්ලම සිද්ධ වෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ඊයේ පෙරෙයිදා මළ ගෙදරක ගියා. මළ ගෙදරක ගියාම මත්ද්‍රව්‍ය පාවිච්චි කරන සහෝදරයෙක්ව හම්බවුණා. මම කිව්වා, මේක නවත්වන්න කියලා. මම ඇහුවා මොනවද දැන් අලුත්ම ජාති කියලා. අලුත්ම ජාති කිව්වාම රුපියල් 15,000ට ද කොහෙද තිබෙනවාලු සම්බා ඇටයක් වාගේ පොඩි tablet එකක්. මට කිව්වේ, ඒක දිවේ තියාගන්න ඕනෑලු. ඒක දිවේ තියා ගත්තාම මොකද වෙන්නේ කියලා මම ඇහුවා. දිවේ තියාගත්තාම මන්ත්‍රීතුමා දන්නේ නැහැ, මාර ආතල් එකක් කිව්වා තිබෙන්නේ. මම ඇහුවා, මොකක්ද ආතල් එක කියලා. මට කියනවා ඒක බීලා ඒක දිය වුණාට පස්සේ මට හිතුණොත් එහෙම දැන් ඔබතුමා ඔතැන ඉන්න කොට මෙතැන ඉන්නේ මේ මහින්ද රාජපක්ෂ කියලා, මට ඒ මහින්ද රාජපක්ෂ විධියටම ඔයාව මැවෙනවාලු. ඊට පස්සේ මට හිතුනොත් එහෙම මෙතැන ඉන්නේ යකෙක් ඉන්නේ කියලා ඒ විධියටම මැවෙනවලු. මෙන්න මේ විධියට තමයි මේ මත්ද්‍රව්‍යවලින් වන හානිය මත්ද්‍රව්‍ය පාවිච්චි කරන කෙනෙක්ම තමයි කිව්වේ. ඕගොල්ලෝ තමයි මේවා ගෙනාවේ. මේ රටට. යහපාලන රජය යටතේ එදා පවතින කාලයේ මේ තරුණයෙක් කියන කථාව. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ. ඒ tablet එක රුපියල් 15.000 ක් වෙනවාලු. ඒවා ගන්න රුපියල් 15,000 ක් නැති වුණාම මොකද කරන්නේ? චේන් එක කඩනවා. මංකොල්ල කනවා. ඊට පස්සේ සල්ලි නැති වුණාම මංකොල්ල කනවා. අද මේවා විහිළුවට ගණන් ගන්න එපා. නිකන් හිතන්න. මේ කෙනෙකුට කාන්තාවක් ඉස්සරහාට හම්බවුණොත් එහෙම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද හිතෙන්නේ. ඒක නිසා පැහැදිලිව අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අද මේ රටේ මේ විධියට මත්ද්‍රව්‍ය, දූෂණ, වංචා මේ සියල්ලත් එක්ක අද තමුන්නාන්සේලා හිනා වෙන්න නොවෙයි. තමුන්නාන්සේලා මේ රටට කරලා තිබෙන අපරාධයට තමුන්නාන්සේලා ලැජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා රජයත් එක්ක ඉල්ලා අස්වෙන්න ඕනෑ. අද ගමක ජීවත් වෙන්න බැහැ. ගම්වල කුඩු ඇවිල්ලා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒවා නැති කරන්න නේ යහපාලනය ආවේ. අද ඔක්කොම ඇති කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද පාසල්වලට කුඩු ඇවිල්ලා. තමුන්නාන්සේලාට නවත්ත ගන්න බැහැ. අද මේ තැනට ඇවිල්ලා තමුන්නාන්සේලා හිනා වෙන්න නොවෙයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බෑ නේන්නම් දෙයියනේ. අගමැතිතුමා ඇතුළු කැබිනට් එකේ බැරි අය තමයි ඉන්නේ. නොහැකියාව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද තමුන්නාන්සේලා බලන්න. අද තමුන්නාන්සේලා රටම විනාශ කරලා තමුන්නාන්සේලා මෙතැන ඇවිල්ලා හිනා වෙනවා. ඒ නිසා අපි තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්නේ - ඒ නිසා තමයි අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා අනුශාසනා කරන්නේ, හිට්ලර් කෙනෙක් හරි ඇවිල්ලා මේක පාලනය කරන්න කියලා. ඇයි එහෙම කියන්න හේතුව. මේ කොන්දක් නැතිව පාලනය වන කොට, අර පැත්තෙන් කුඩු ජාවාරම් එන කොට, අර පැත්තෙන් පාතාළ කල්ලි එන කොට, අර පැත්තෙන් ආර්ථිකය කඩා වැටිලා මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැති වන කොට, අර පැත්තෙන් එල්.ටී.ටී.ඊ. එක මතු වෙන කොට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එල්.ටී.ටී.ඊ. එක ඕනෑයි කියලා කථා කරන කොට මේ සියල්ලත් එක්ක තමයි රටේ

[ගරු ලලිත් එල්ලාවල]

ඉන්න ගෞරවනීය ස්වාමීන් වහන්සේලා කියන්නේ කොන්දක් ඇති නායකයෙක් මේකට එන්න කියලා. ඒ නිසා තමයි අපිත් කියන්නේ මේකට දැන් කොන්දක් ඇති නායකයෙක් ඕනෑ. ඒ නායකයෙක් ආවොත් විතරයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්න සියල්ලටම විසඳුම. ඒ නිසා මේ ප්‍රශ්නවලට - මේ යහපාලන රජය දැන් අවුරුදු තුනකට වැඩියි. අවුරුදු තුනකට වැඩියි. අවුරුදු තුනක් ගිහිල්ලා රට ප්‍රපාතයට පත් වෙලා. හැම පැත්තෙන්ම රට විනාශ වෙලා. ඒ නිසා මේගොල්ලන්ට මේ අවුරුද්ද තුළත් මේක කරන්න බැහැ. තව තවත් විනාශ වෙන එක විතරයි වෙන්නේ. ඒ නිසා මේ සියල්ල නැති කරන්න පුළුවන් එකම තැනයි තිබෙන්නේ. ඒ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවක් ආවොත් විතරයි නැවත මේවා නවත්වන්න පුළුවන් කියන එක මතක් කරමින් අපි තමුන්නාන්සේලාට පැහැදිලිව කියනවා. තමුන්නාන්සේලා පැහැදිලිව ඡන්දය තියන්න. ඡන්දය තිබ්බාට පස්සේ අපි බලයට ඇවිල්ලා මේවා එක දවසෙන් දෙකෙන් නවත්වලා දෙන්නම් කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.27]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කාලෝචිත යෝජනාව ගැන. ඇත්ත වශයෙන්ම ගොඩක් අදහස්, යෝජනා ඉදිරිපත් කළා. මමත් ඉතාමත් කෙටියෙන් අදහස් ටිකක් ඉදිරිපත් කරනවා. ඉතින් ඇත්තටම අපට මේ රටට තිබෙන ලොකු ප්‍රශ්නයක්. අපි මේ හැම කෙනෙක්ම චෝදනා කර ගන්නවා. ඒ ආණ්ඩුවේ ඉන්න කොට මේ ආණ්ඩුව චෝදනා කරනවා. මේ ආණ්ඩුවේ ඉන්න කොට ඒ ආණ්ඩුවට චෝදනා කර ගන්න එක තමයි අපේ තිබෙන ලොකුම වරද. අපි කාගේද වරද කොතැනද කියලා සොයලා, ඒකට විසඳුමක් දෙන එක තමයි මම හිතන්නේ, දේශපාලන නායකත්වය කියන්නේ. දැන් අපට පේනවා රටේ කුඩු විශාල ප්‍රමාණයක් වැඩි වෙමින් පවතිනවා. මේ කුඩු ගෙන්වන අය ඉන්නවා. අල්ලලා ඉන්නවා. දන්නවා. දැන් 19 දෙනෙකු නියම වෙලා තිබෙනවා. ඒකේ පළමුවැනි තැනට ඉන්නේ කාන්තාවක් කියලා කියනවා. මේ කුඩු ප්‍රවාහනය කරන්නේ වෙන කොටසක්. ගෙන්වන්නේ තව කොටසක්. රටේ මරණ දණ්ඩනය ගේන්න ඕනෑ. හැබැයි, මම පුද්ගලිකව විරුද්ධයි මනුස්සයෙකුව මරණවාට. තමන්ගේ ජීවිතයක් හානි කරන එකට. නමුත් නීතිය මේ රටේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපේ රටේ නීතිය ගැන අපි කාටත් හැම කෙනෙකුටම ප්‍රශ්නයක් තිබෙනවා. නීතිය කියන්නේ, ඇත්ත නොවෙයි. රටක නීතිය කියන්නේ, හැම තැනකම දොරක් වහලා තිබෙන කොට භාගයට ඒක වහලා තිබෙනවා කියන්නත් පුළුවන්. භාගෙට ඒක ඇරලා තිබෙනවා කියන්නත් පුළුවන්. නීතිය කියන්නේ ඒකයි. හැබැයි, මරණ දණ්ඩනය නියම විය යුත්තේ, හරියටම වැරදි කරන පුද්ගලයාට. මොකද, වැරදි කරන පුද්ගලයෝ 100 කට, නිවැරදි එක පුද්ගලයෙකුට ඒක හිමි වුණොත් එහෙම ඒක හරිම අසාධාරණයක්. ඒ නිසා රටේ ඉස්සෙල්ලාම ක්‍රියාත්මක විය යුත්තේ නීතිය. නීතිය ශක්තිමත් වෙන්න ඕනෑ. දුප්පත් මිනිස්සුන්ට එක නීතියක්. පොහොසත් මිනිස්සුන්ට තව නීතියක්. ඒ වාගේ කුඩු ගෙන්වන එක්කෙනාට එක නීතියක්. කුඩු ප්‍රවාහනය කරන කෙනාට තව නීතියක්. මෙන්න මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ රටේ. ඊළඟට අද මේවාට බන්ධනාගාර, විශේෂයෙන්ම නිලධාරීන් - හැම කෙනෙකුම නොවෙයි. දැන් හැම කෙනෙකුටම බන්ධනාගාරය ඇතුළේ සියලු පහසුකම් තිබෙනවා. ටෙලිෆෝන් තිබෙනවා. දැන් මේ කියන විධියට, ටෙලිෆෝන්වලින් මිනී මරන්නේ. ටෙලිෆෝන්වලින් කුඩු ගෙන්වන්නේ. ටෙලිෆෝන්වලින් තමයි කුඩු ප්‍රවාහනය කරන්නේ.

ඉතින් මේවා ක්‍රියාත්මක කරන අයව අල්ලන්න ඕනෑ. ඒකා මොකා වුණත් ඒකාට තමයි දෙනවා නම් මරණ දණ්ඩනය දෙන්න ඕනෑ. නැත්නම් මේකට අද පාවිච්චි කරනවා අපේ කාන්තාවෝ. මොකද, ලංකාවේ ඉතාම දුෂ්කරතාවයෙන් ජීවත් වන කාන්තාවෝ. විශේෂයෙන්ම මහල් නිවාසවල ඉන්න කාන්තාවන්ව, තරුණ දරුවන්ව කුඩු ප්‍රවාහනය කිරීමට පාවිච්චි කරනවා. හැබැයි, අහු වෙන්නේ කුඩු ප්‍රවාහනය කරන කෙනා. එයාට තමයි මරණ දණ්ඩනය අයිති වෙන්නේ. එයාට තමයි මරණය නියම කරන්නේ. හැබැයි, මේවාට යොමු කරන විශේෂයෙන්ම සමහර දේශපාලඥයෝ, හැම කෙනෙකුම නොවෙයි. විශාල මුදලාලිලා, මෙයාලාව කොටු කර ගන්න ඕනෑ. අපේ නීතිය හරියට - මොකද, ලෝකයේ ප්‍රසිද්ධියක් තිබෙනවා අපේ ලංකාවේ පොලීසිය ඉතාම දක්ෂයි කියලා. හැබැයි, එහෙම කිව්වාට නියම කුඩුකාරයෝ ටික අල්ලන්නේ නැහැ.

අල්ලාගෙන නියම දණ්ඩනය දෙන්නේ නැහැ. ඒ හින්දා මුළු රටටම මේක කරදරයක්. අද ගත්තොත් මට මතකයි, එක යුගයක කොළොන්නාවේ කුඩු නැති වුණා. මීට අවුරුදු කිහිපයකට උඩදී දේශපාලඥයන් දෙදෙනෙකුගේ අතර තිබුණු වෛරයකින් කොළොන්නාවේ කුඩු යුගය නැති වුණා. මේකේදී මම දන්නවා. තරුණ ළමයින් වෙව්ල වෙව්ලා පාරවල්වල ගියේ. කුඩු සොයා ගන්න විධියක් නැතිව. කුඩු කොහෙන්ද ගන්නේ කියන එක. ඉතින් අද කුඩු විශේෂයෙන්ම දේශපාලඥයෝ තමයි ප්‍රවාහනයට. ගොඩක් දේශපාලඥයෝ. හැම කෙනෙක්ම නොවෙයි. මොකද, මේගොල්ලන්ව බලන්නේ නැහැ නේ? දේශපාලන නායකයෙක් හින්දා check කරන්නේ නැහැ. කටුනායක සිට ප්‍රවාහනයට ගොඩක් දේශපාලඥයෝ මේවාට සම්බන්ධ වෙනවා. ඒ හින්දා මේ නීතිය. කුඩුවලට වාගේම විශේෂයෙන්ම අපි කියනවා, ස්ත්‍රී දූෂණවලටත් මෙය රැගෙන ආ යුතුයි. මේකත් රටේ තිබෙන ලොකුම ප්‍රශ්නයක්. ඒ අවශ්‍යතාවය ඉෂ්ට කර ගන්න වෙන ක්‍රම තිබෙනවා. දූෂණය කරලා නොවෙයි. ඉතින් ඒ හින්දා ගිය අවුරුද්දේ 15,000 කට අධික ප්‍රමාණයක් කාන්තාවෝ, දරුවෝ දූෂණයට, අතවරයට ලක් වෙලා තිබෙනවා. ඒ අතරින් දරුවන් අට දෙනෙක් අමානුෂික විධියට දූෂණය කරලා මරලා දාලා තිබෙනවා. හැබැයි, අදටත් ඒ දූෂකයන්ව හරියට අල්ලලා මොනවාද කරන්නේ කියන එක ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ.

ඒ කාලේ සේයා දරුවා ගැන විශේෂ කථා බහකට ලක් වුණා. නමුත් ඒක එහෙමම යට ගියා. ඒ දූෂකයෝ අහු වුණාද නැද්ද කියලා - අද අපේ රටේ ක්‍රමයක් තිබෙනවා, මොකක් හරි දේකට සැක කරපු ගමන් සැක කරන කෙනාව අල්ලනවා. අල්ලාගෙන ගහනවා. සමහර විට ඒ මනුස්සයා නොවෙයි වෙන්න පුළුවන්. අපට අපේ රටේ එහෙම ගොඩක් අත්දැකීම් තිබෙනවා. ඔය වාගේ අත්දැකීම්. ඒ හින්දා අපට මරණ දණ්ඩනය කියන එක අලුතෙන් ගේන්න දෙයක් නැහැ, මේ රටේ. එදා සිටම තිබුණු දෙයක් ඒක. මේ අවුරුදු 40 ක් තිස්සේ ක්‍රියාත්මක කෙරුණේ නැති වුණාට නීතිය මේ රටේ තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න විතරයි තිබෙන්නේ. මරණ දණ්ඩනය දැනටත් නියම වෙනවා නේ? මරන්නේ නැති එක විතරයි තිබෙන්නේ. ඉතින් ඒ හින්දා හරි වැරදිකරුවන්ට - මොකද, බොරු වැරදිකරුවන්ට විතරක් නොවෙයි. ප්‍රවාහකයන්ට විතරක් නොවෙයි. නියමුවන්ට. මේකේ ප්‍රධානීන්ව අල්ලලා, ඒ වාගේම නියම දූෂකයන්ව අල්ලලා වැරදි කරපු - නිවැරදි එක මනුස්සයෙකුටවත් මේක ලැබුණොත් එහෙම විශාල පාපයක් වෙනවා. ඒ හින්දා වැරදිකරුවන් කවුද කියන එක හරියටම හඳුනා ගන්න රජය ශක්තිමත් වෙන්න ඕනෑ. ඒ වාගේම සියලු දේශපාලඥයෝ ඒකට උදව් කරන්න ඕනෑ. නමුත්, දේශපාලඥයෝ ගොඩක් අය අනික් පැත්තට ඉන්න හින්දා ඒක කරන්න හරි අමාරුයි. ඒ කෙසේ වෙතත් කොහොම හරි රටේ හැම කෙනාටම අවශ්‍ය වෙලා තිබෙන්නේ නීතිය ක්‍රියාත්මක කරන්නයි. හැම කෙනෙක්ම ඉල්ලන්නේ නීතිය ක්‍රියාත්මක කරන්න. නීතිය ශක්තිමත් කරන්න. ඊට පස්සේ රටේ ප්‍රශ්න ගොඩක් විසඳෙනවා. ඒ නිසා ඇත්තටම අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ බන්ධනාගාර නිලධාරීන්ට තිබෙන වාහන දැක්කාම පුදුම හිතෙනවා. ඒ ගෙවල්වලට ගියාම පුදුම හිතෙනවා. පඩියේ හැටියට ඒ දේවල් කොහොමද කරන්නේ කියලා. එතකොට ඔක්කොම බඩු ටික ඒගොල්ලන්නේ ගෙනියන්නේ. ඒ නිසා මේවා සොයා බලන්න ඕනෑ. සාමාන්‍යයෙන් මනුස්සයෙකුගේ ජීවිත කාලයේ පඩියෙන් මොනවාද කරන්න පුළුවන්. ඒ මනුස්සයා මෙපමණ බිල්ඩින් ගහන්නේ කොහොමද? අනික් දේවල් ගැන සොයා බලනවා වාගේ, බදු ෆයිල් අරිනවා වාගේ ඒවා ගැනත් සොයලා බලන්න ඕනෑ. ඒවා කොහොමද වෙන්නේ කියලා.

ඒ හින්දා අපි රජයෙන් ඉල්ලා සිටින්නේ නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. නීතිය කියන්නේ සත්‍ය නොවෙයි. හැබැයි, නීතිය සත්‍ය කරන්න පුළුවන්. අද ඕනෑම නඩුකාරයෙකුට, ඕනෑම ලෝයර් කෙනෙකුට ඉදිරිපත් වෙන්න පුළුවන්. හොරෙකුගේ පැත්තටත් ඉදිරිපත් වෙනවා. කුඩුකාරයෙකුගේ එකටත් ඉදිරිපත් වෙනවා. ඒගොල්ලන්ම තමයි නිදහස් කර ගන්න විවිධ දේවල් කරන්නේ. සල්ලි තිබෙන මිනිහා මොන විධියකින් හරි ඇප අර ගන්නවා. නැති මිනිහා පුංචි දේටත් - අපට මතකයිනේ? පොල් ගෙඩි ගණනට හිරේ ගිය දරුවෙක් අපේ රටේ හිටියා. ඒ වාගේම මේ මෑතකත් ඒ වාගේ සිද්ධියක් වුණා. ඒ නිසා සල්ලි තිබෙන මිනිහා මොන දේකින් හරි නීතියේ රැහැනින් නිදහස් වෙනවා. ඒ නිසා හරියටම වැරදිකරුවන්ට දඬුවම් දෙන්න පුළුවන් නම් ඒක තමයි හරිම දේ කියන එක. ඒ වාගේම කාලෝචිත මේ රටටම අවශ්‍ය වෙලා තිබෙන මේ කුඩු ව්‍යසනය, ඒ වාගේම ස්ත්‍රී දූෂණය. මේකටත් විරුද්ධව අනිවාර්යයෙන්ම දඬුවම් කළ යුතුයි. මේවාට නීතිය හරියටම ක්‍රියාත්මක කරන ඉල්ලීම ඉල්ලනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින්

[ගරු නිරෝෂා අතුකෝරල]

ස්තුතිවන්ත වෙනවා, අදට ඔබින මාතෘකාවක් ගෙන ඒම ගැන. ඒ වාගේම කනගාටු වෙනවා. එතුමා කිව්වා වාගේ අත්‍යවශ්‍ය මාතෘකාවක් ගෙනාපු වෙලාවකටවත් සභා ගැබේ අපේ මන්ත්‍රීතුමන්ලා නැති වීම ගැන ඉතාමත් කනගාටුව පළ කරනවා.

[අ.භා. 01.35]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීතියක් හැටියට තිබෙන මරණ දඬුවම නැවත ක්‍රියාවට නංවන්නය කියලා නිශාන්ත ශ්‍රී වර්ණසිංග ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව මම නම් විශ්වාස කරන්නේ, විවාදාත්මක යෝජනාවක් හැටියටයි. මොකද, මේ මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම බොහෝ මන්ත්‍රීවරු කිව්වා, ජනාධිපතිතුමාගේ අත්සනින් පමණක් මේක ප්‍රමාණවත් වෙනවාය කියලා. කෙනෙකුට මරණය ලබා දීමේ තිබෙන බරපතළකම නිසාම මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේ නීතියත් යම් ප්‍රමාණයකට නීතියෙන්ම යම් ආරක්ෂණ පියවරයන්වලට යොමු කරලයි තිබෙන්නේ, ඒක ක්‍රියාත්මක කරවන්න. මරණ දඬුවමක් ක්‍රියාත්මක කරන්නේ, නඩුකාරවරයෙක් නඩු තීන්දුවක් දුන්නාට පස්සේ. ඒක ක්‍රියාත්මක කරන්න නම් නඩුකාරයා නැවත වතාවක් පුද්ගලිකවම දෙන්න ඕනෑ තවත් වාර්තාවක්. තවත් තීන්දුවක් ලබා දෙන්න ඕනෑ. මේ නඩුව පිළිබඳව මම පුද්ගලිකවම සෑහීමට පත් වෙනවාය. මේ තීන්දුව ගැනීමේදී මම නීතිය පිළිබඳ කරුණු විතරක් නොවෙයි. මේ නඩු තීන්දුව ගැනීමේදී මට සම්පූර්ණ විශ්වාසයක් තිබෙනවාය. මේ පුද්ගලයා මේ වැරැද්ද කළාය කියලා එතුමන් වෙනම වාර්තාවක් ලබා දෙන්න සිද්ධ වෙනවා. ඒ වාර්තාවත් ලබා දුන්නාට පස්සේ නීතිපතිවරයා තවදුරටත් නැවත වතාවක් කියන්න ඕනෑ. මේ නඩුවේ සියලු කාරණා එතුමා සැලකිල්ලට අරගෙන එතුමාත් ඒ විධියටම එකඟ වෙනවාය කියලා මේ පුද්ගලයා මරණයට පත් කරන්න. දෙදෙනාගේම වාර්තා සියල්ල අධිකරණ ඇමතිවරයා වෙත ගිහිල්ලා අධිකරණ ඇමතිවරයාත් එකඟ වෙන්න ඕනෑ, මේ සියලු කාරණාත් එක්ක මම මේ මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න එකඟ වෙනවාය කියලා. ඒ අතරේදී ඒ පුද්ගලයාට ඒ මරණ දඬුවම හිමි වන පුද්ගලයාට නැවතත් අවස්ථාවක් ලබා දෙනවා, මරණ දඬුවමට විරුද්ධව ජනාධිපතිතුමාට අභියාචනයක් කරන්නත්. ඒ සියලු කාරණාවලදී පැහැදිලි වෙනවා, සියලු දෙනාගේ එකඟත්වය ඇති වෙනවා නම් තමයි මරණ දඬුවම අපේ රටේ ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ. මේ මරණ දඬුවම ජනාධිපතිතුමාගේ අත්සනින් විතරක් නිකම්ම ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනවාය කියලා කිව්වාට, මේකට විවිධාකාරයෙන් තිබෙන ඉඩකඩ හසුරුවලා තිබෙන්නේ, අඩු කරලා තිබෙන්නේ, මේ දෙන මරණ දඬුවම ඉතාමත්ම සාධාරණ වෙනවාද කියන කාරණාව පිළිබඳව සැකයක් පවතින නිසයි. ඒක නිශ්චිතවම කෙනෙකුව ඒ වෙනුවෙන්ම තෝරා ගන්න ඕනෑ නිසයි අපි විශ්වාස කරන්නේ, මේ විධියට නීතියේ ආරක්ෂණයත්, මේ තුළට ඇති කරලා තිබෙන කාරණාව උඩ කියලා.

විශේෂයෙන්ම අනික් කාරණාව වෙන්නේ, අද ජනාධිපතිතුමා විශේෂයෙන් කියලා තිබෙන්නේ කුඩු ජාවාරමට සම්බන්ධ වුණු උදවියට මරණ දඬුවම ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. දැන් වාර්තා වන විධියට අද වන කොට 19 දෙනෙකුගේ නම් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ 19 දෙනා අතරේවත් මේ රටේ ප්‍රබලම මත් ව්‍යාපාරිකයන්ගේ නම් ඒ 19 දෙනාගේ නම් තුළට ඇතුළත් වෙලා නැහැ. කාන්තාවක් මුලින්ම ඉන්නවා. විදේශිකයින් හතර දෙනෙකු ඉන්නවා. තවත් පිරිසක් ඉන්නවා. නමුත් බරපතළ විශාලම මත් ද්‍රව්‍යවලට අහු වුණු උදවියගේ නම් මේ ගොඩෙන් ඇත් වෙලයි තිබෙන්නේ. ඉතින් මේකේදී අපට නැවත කල්පනා කරන්න වෙනවා, මේවා හරියටම සිද්ධ වෙනවාද කියන එක. අපේ රටේ මෙවැනි දඬුවමක් ක්‍රියාත්මක කරන්න යන කොට ඒකට හරියටම ඒ නිශ්චිත පුද්ගලයාද? නිවැරදි තීන්දුවක් ලබා දෙන්න, නිවැරදි දඬුවමක් ලබා දෙන්න අපේ රටේ කටයුතු සිද්ධ වෙනවාද කියන කාරණාව අපි කල්පනා කරන්න වෙනවා. ඒ වාගේම මත්කුඩු වැනි දේක. මිනී මැරුමකදී නම් මරපු මිනිහා කවුද කියලා දැනගන්න පුළුවන්කම තිබෙනවා. කවුද පුද්ගලයෙක් මරණවා. පුද්ගලයාව අපට දැන ගන්න පුළුවන් වෙනවා. ස්ත්‍රී දූෂණයක් කරන කොට පුද්ගලයාව හඳුනා ගන්න පුළුවන් වෙනවා. ළමා දූෂණයක් කළොත් ඒ පුද්ගලයාව හඳුනා ගන්න පුළුවන් වෙනවා. නමුත් මත් කුඩු ව්‍යාපාරයේදී දඬුවම් ලබන පුද්ගලයාම නොවෙයි ව්‍යාපාරය තුළ බලවත් පුද්ගලයා බවට පත් වෙන්නේ. ඒ වෙනුවෙන් ක්‍රියා කරන පිටිපස්සේ ඉන්න තවත් විශාල කොටසක් සහ ඒකේ වෙනත් බලවතුන්, නායකයින් ඉන්නවා. ඒ නිසා බොහෝ වෙලාවට දඬුවම ලැබෙන්නේ දඬුවම ලැබිය යුතු තැනැත්තාට නොවෙයි කියන එකයි

මේකේදී පැහැදිලි වෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා. මේකේදී නැවත ඒ දඬුවම නියම පුද්ගලයාට ලබා දෙන්න මේ මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පුළුවන් වෙනවාද කියන සැකය අපට පවතිනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදීත් සඳහන් කළා. හිට්ලර් කෙනෙක් වාගේ පාලකයෙක් ඇවිල්ලා හරි අපේ රටේ මේවා නතර කරන්න කටයුතු කරන්න ඕනෑය කියලා. මම හිතනවා, හිට්ලර් කොහොමද කටයුතු කළේ කියන එක ගැන ලොකු දැනුමක් ඇතිව එහෙම කිව්වා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. හිට්ලර් බලයට ආවේ, චාන්සලර් පදවියට පත් වුණේ ඡන්දයෙන්. ඡන්දයෙන් පත් වුණු ඔහු මුලින්ම ක්‍රියා කළේ, ඔහු මරා දැමුවේ ඔහුට විරුද්ධව හිටපු කොමියුනිස්ට්වාදීන්ව මුලින්ම මරලා දැම්මේ. ඔහුත් එක්ක තරඟයට හිටපු, ඔහුට අභියෝගයක් වුණු අයව ඔහු මරලා දැම්මේ. ඊළඟට ඔහු මරලා දාන්න කටයුතු කළේ ඔහුගේම දේශපාලනයේ ඉන්න, ඔහුත් එක්ක එකට වැඩ කරන, ඔහුට අභියෝගයක් වන උදවියව තමයි දෙවනුව මරලා දාන්න කටයුතු කළේ. තුන්වැනිව ඔහු මරලා දැම්මේ රටේ ඉන්න ආබාධිතයින්. ඒ වාගේම අඩු තත්ත්වයේ ඉන්න උදවියව, ආබාධිත වාගේ උදවිය, මානසික ලෙඩ්ඩු ඒ වාගේ උදවිය තමයි දෙවනුව හෝ මරලා දාන්න කටයුතු කළේ. ඊට පස්සේ තමයි යුදෙව්වන් මරන්න ඕනෑ කියලා එයා තීන්දු කළේ. ඊට පස්සේ දස ලක්ෂ ගණනක යුදෙව්වන් මරලා ලෝක යුද්ධයක් කරා ලෝකය ගෙනිහිල්ලා විශාල විනාශයක් කරා ගෙනියන්න කටයුතු කළා. ඒක නිසා අපේ රටේ හාමුදුරුවරු මේක තේරුම් ගන්නේ නැතුව මෙහෙම අයට බලය දෙන්න ඕනෑ කියනවා විතරක් නොවෙයි. හමුදා පාලනයක් හරි ගේන්න ඕනෑයි කියලයි කිව්වේ. හමුදා පාලනයක් අපේ රටේ ව්‍යවස්ථාව තුළ ගේන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. හමුදා පාලනයක් ගෙන එන්න නම් මිලිටරි බලය අතට ගන්න තැනකට යන්න ඕනෑ. ඉතින් එවැනි උපදෙස් මම හිතන්නේ නැහැ අපේ රටට කවදාවත් ගැළපෙනවා ඇතියි කියලා. හාමුදුරුවරු තියා කවුරු කිව්වත් ඒක ගැළපෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

ඒ වාගේම මේ කුඩු පිළිබඳ ප්‍රශ්නය. විශාල වශයෙන් චෝදනා කළේ යහපාලන ආණ්ඩුව ඇවිල්ලා තියෙනවා. දැන් මෙන්න කුඩු වැඩි වෙලා තිබෙනවා කියලා. අපි දන්නවා පසුගිය කාලයේ මේ රටේ කුඩු ව්‍යාපාරය සිද්ධ වුණේ නැද්ද? මට පේන විධියට අද වෙලා තිබෙන්නේ කුඩු ගේන අයව අල්ලන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. කුඩු අද හෙළිදරව් වෙලා තිබෙනවා. කුඩු ව්‍යාපාරයේ යෙදෙන අයව වැඩිපුර අත්අඩංගුවට ගන්න, අල්ලගන්න පුළුවන්කම ඇති වෙලා තිබෙනවා. එදා එහෙම වුණේ නැහැ. එදා වුණේ මොකක්ද? කුඩු ගන්න අය හිටියා නම් අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගිහිල්ලා බඳාගෙන මුහුණත් ඉඹලා එනවා. ඒක තමයි එදා සිද්ධ වුණේ. එහෙම නැත්නම් කුඩු ව්‍යාපාරයට සම්බන්ධ වුණු උදවියට මේ රටේ ආරක්ෂක අමාත්‍යාංශයේ, මේවාට විරුද්ධව ක්‍රියා කරන්න තිබෙන අමාත්‍යාංශයේ උපදේශක අධීක්ෂණ මන්ත්‍රී ධුර දීලා ඒ අයව ආරක්ෂා කිරීම තමයි එදා සිද්ධ වුණේ.

ඒක නිසා මම හිතනවා අද යහපාලන ආණ්ඩුව එහෙම දෙයක් කරලා නැහැ. කාවත් ආරක්ෂා කරන්න ගිහිල්ලා බැහැ. විවෘතව ඉඩ දීලා තිබෙනවා කුඩු මෙහෙට ගේනවා නම්, ඒක අල්ලන්න. ඒක නිසා තමයි විශාල වශයෙන් කුඩු ගෙන්වන උදවියව අද අත්අඩංගුවට ගන්න පුළුවන්කම ඇති වෙලා තිබෙනවා. යහපාලන ආණ්ඩුවට විතරක් මේකේ වැරැද්ද, යහපාලනය නිසා මේක වුණාය, අලුත් ආණ්ඩුව නිසා මේක වුණාය කියලා කියනවා නම් එහෙම, ඒ අයට පොඩ්ඩක්වත් අතීතය ගැන මතකයක් තිබිලා නැතුව ඇති කියන කාරණාව තමයි අපට පේන්න තිබෙන්නේ කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම කුඩු පිළිබඳව කියන්නේ, හිරගේ ඇතුළේ ඉඳගෙන ව්‍යාපාරයක් කරනවා කියලයි. ඒ ව්‍යාපාරය පවත්වාගෙන යනවා. හිරගේ ඇතුළේ මේ ව්‍යාපාරය පවත්වාගෙන යනවා නම් අවශ්‍ය වෙන්නේ හිරගේ ඇතුළේ නිසි පාලනයක් ඇති කිරීමයි. ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. රටේ පරිපාලනය ශක්තිමත් කරන්න ඕනෑ. පරිපාලනය ශක්තිමත් කරන්න බැරුව ඒ නීතිය ඒ විධියට ක්‍රියාත්මක කරන්න බැරුව ඒකට ජනප්‍රිය මාතෘකාවක් හැටියට ඔවුන්ට අපි මරණීය දණ්ඩනය ගේනවා කියලා කියන එක විතරක් මම හිතන්නේ නැහැ ප්‍රශ්නයට කවදාවත් විසඳුමක් ඇති වෙනවා කියන එක. ඒක විශ්වාස කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ වාගේම අපි ලෝකයත් එක්ක එකට කටයුතු කරන රටක්. අපට අද යුරෝපීය කොමිසම වෙන්න පුළුවන්, බටහිර රටවල් වෙන්න පුළුවන් ඒ අය කියනවා නම් මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කරන්න එපැයි කියලා. අපි මේක අපට කරන බටහිර බලපෑමක් විධියට විතරක් සලකන්න නරකයි. අපි ලෝකයත් එක්ක එකට කටයුතු කරන රටක්. ලෝකයත් එක්ක එකට ගනුදෙනු කරන්න ඕනෑ රටක්.

[ගරු කීර්ති කාරියවසම්]

ලෝකයේ ආධාර ලබා ගන්න ඕනෑ රටක්. අලුත් වෙළඳ පොළ ඒ රටවලින් හොයා ගන්න ඕනෑ රටක්. අපි එහෙම නම් ඒ අයත් එක්ක සංවාදශීලී විධියට කටයුතු කරන කොට ලෝකයේ පැවැත්ම පිළිබඳවත්, අනෙක් රටවල් කටයුතු කරන ආකාරය පිළිබඳවත් අපි තේරුම් අරගෙන කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. ඒක බටහිරට යට වීමක් විධියට විතරක් සලකන්න පුළුවන් වෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ කියන කාරණාව ප්‍රකාශ කරනවා. ඒ නිසා මේකේදී අවශ්‍ය වෙන්නේ බටහිරට හෝ කාටවත් දැනීම විතරක් නොවෙයි. මේ පිළිබඳව අපේ රටේ තිබෙන නීතිය ආණ්ඩුවේ තිබෙන පරිපාලනය වඩාත් ශක්තිමත් කරලා මෙවැනි දේ වළක්වා ගන්න කටයුතු කිරීම සහ ඒ නීතිය තුළ මේවාට තිබෙන වැඩ සටහන් වඩාත් ශක්තිමත් කිරීමයි අවශ්‍ය වෙන්නේ. මරණීය දණ්ඩය ක්‍රියාත්මක වන ලෝකයේ අනෙකුත් රටවල් සියල්ලේ අපරාධ නැති වෙලා නැහැ. ඇමරිකාවේ බොහෝ ප්‍රාන්තවල, ප්‍රාන්ත ගණනාවක මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒ රටවල්වල අපරාධ නතර වෙලා නැහැ. කුඩු ව්‍යාපාරයත් යනවා. ස්ත්‍රී දූෂණත් සිද්ධ වෙනවා. මිනීමැරුම් සියල්ල සිද්ධ වෙනවා. ඒ මරණීය දණ්ඩනය තිබුණා කියලා අපරාධ සියල්ල නතර වෙන්න ලෝකයේ පුරා අනෙක් රටවල් දිහා බලනකොට අපි එහෙම වෙලා නැහැයි කියන කාරණාව සඳහන් කරනවා.

ඒ නිසා අපට අයිතියක් ඇත්තේ නැහැ තවත් කෙනකුගේ ජීවිතය රජයට ලබා ගැනීමට. ජීවිතයක් එහෙම අයිති කර ගන්න අයිතියක් නැහැ. මම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා හෙළ උරුමයේ නියෝජිතයෙක් හැටියට හෙළ උරුමයේ පදනම බවට පත් වෙලා තිබෙනවා බෞද්ධ දර්ශනය. බෞද්ධ දර්ශනය පදනම් කරගත්තු පක්ෂයක්. බෞද්ධ දර්ශනය පදනම් කරගත්තු පක්ෂයේ දර්ශනය වෙන්නේ ජීවිතයක් බිලි ගැනීම නොවෙයි. වඩාත් මෛත්‍රී සහගතව බැලීමයි කියන එකයි අපි කල්පනා කරන්නේ. එවැනි පක්ෂයක නියෝජිතයෙක්ගෙන් බෞද්ධ පදනමට විරුද්ධව යන යෝජනාවක් ආවේ කොහොමද කියන කාරණාව නැවත එතුමා කල්පනා කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව අපට නම් එකඟ වෙන්න බැහැයි කියන කාරණය සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 01.49]

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මගේ ගෞරවය පුද කරනවා, මේ රටේ වර්තමානයේ ඇති වෙලා තිබෙන කථාව පිළිබඳව. මරණ දඬුවම නැවත මේ රට තුළට ගෙන ඒම පිළිබඳව අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ හිටපු ගරු සෞඛ්‍ය ඇමැතිතුමා, අපේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම ගැන සතුටු වෙනවා. මේ සියලු දෙනාම කථා කරනවා මම අහගෙන හිටියා. මගේ කථාව ඊට වෙනස් කථාවක්. මොකද, මම මේ පළාත් සභාව තුළ ලෙහෙසියෙන් කථා කරන්නේ නැහැ. මොකද, මම කාලයක් කථා කළා. කාලයක් සෑම මාතෘකාවකටම කථා කළා. නමුත් යම්කිසි කාලසීමාවක සිට මම මේ කථා කරන එක නරත කරලා තිබෙනවා. ඒකට හේතුව මේක නිකන් ඇත්තටම තේරුමක් නැති ක්‍රියාවක් විධියට තමයි මගේ මේ පළාත් සභා වාර දෙක තුළ මා ලත් ඇත්දැකීම වන්නේ. මගේ ඇත්දැකීම තුළ මම දකින්නේ මේ කථා කරන ඒවා, පළාත් සභාව තුළ අපි කථා කරන දේවල් ක්‍රියාත්මක වීමේ ප්‍රවණතාවය ඉතාමත්ම අල්පයි. ඒක අපට දැනෙනවා. ඒක නිසා තමයි මම අදහස් ප්‍රකාශ කරන එකෙන් ගොඩක් වෙලාවට වැළකී සිටින්නේ.

නමුත් මම අද කල්පනා කළා මරණ දඬුවම සම්බන්ධයෙන් අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අපි බෞද්ධයෝ විධියටත්, විශේෂයෙන්ම මම යුද්ධ හමුදාවේ හිටපු නිලධාරියෙකු විධියටත් - මම මතක් කරන්න ඕනෑ. මම අවුරුදු 18 න් යුද්ධ හමුදාවට ගිහිල්ලා මිනිස්සු මැරෙන හැටි තමයි දැක්කේ. අපි මරණ හැටි තමයි ඉගෙන ගත්තේ. මිනිස්සු මරණ විධිය තමයි අපි අධ්‍යාපනය ලද්දේ. මිනිස්සු මරන්නා වූ ක්‍රමවේද පිළිබඳව. සමාජය විනාශ කරන්නා වූ ක්‍රමවේද පිළිබඳව තමයි අපි ලද අත්දැකීම්. ඉතින් ඒ නිසා එවන් වූ වකවානුවක් තුළ අද - ඉතිහාසය පිළිබඳව මම සොයා බලනකොට 1977 වාගේ කාල වකවානුවේ තමයි අවසානයේ එල්ලලා මරලා තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

1976.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

1976. 1976 තමයි අවසාන කාල වකවානුවේ එල්ලලා මරලා තිබෙන්නේ. එතකොට 1976 කාල වකවානුවේ එල්ලා මරණ නීතිය තිබෙන කොට, ඉතිහාසය සොයා බලනකොට ඉතාමත්ම සුළු සංඛ්‍යාවක් තමයි මේ මරණ දණ්ඩනයට සුදුසු තත්ත්වයට ඒ අදාළ වැරැදිවලට යොමු වෙලා නීතිය මගින් දඬුවම් ලබලා තිබෙන්නේ. අද 76 ඉඳලා පල්ලෙහාට බලන කොට එදත් එක්ක අද සංසන්දනය කරන කොට මම හිතනවා මේ මරණ දණ්ඩනය කියන එක මම බෞද්ධයෙක් හැටියට - මම නම් මෙතුමා කිව්වා වාගේ අනුන්ගේ පණ ලබා ගන්න අයිතියක් කොහේ හරි මේ ජීවියෙකුට සම්මත කර ගත්තු නීති රාමු පද්ධතියක් තුළ ඉඳගෙන කවුරු හරි කෙනෙකුට අයිතියක් තිබෙනවා නම් මම හිතනවා ඒක මහ පුදුමාකාර බලයක්. මේ මහ පොළොව තුළ තිබෙන බලයක් විධියටයි මම දකින්නේ.

ඒ නිසා මම කරුණාවෙන් මතක් කරලා දෙනවා. මම යුද්ධ හමුදාව පැත්තෙන් මම මේ කියන්නේ. 1949 අංක 17 දරන යුද්ධ හමුදා පනත තිබෙනවා. කරුණාකරලා ඒක කියවන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ පනතේ ඉතාමත්ම පැහැදිලිව නීති තිබෙනවා. රටේ පරිපාලනය සම්බන්ධයෙන්, යුද්ධ හමුදාවේ පැවැත්ම සම්බන්ධයෙන් සහ රටේ විනය සම්බන්ධයෙන්. මම මතක් කරලා දෙනවා. ඒ යටතේ පාලනය වෙනවා අතිගරු ජනාධිපතිතුමාගේ ගම පොළොන්නරුව. ඊට හැතැප්ම හතරක් පහක් එහායින් සෝමාවතී චෛත්‍යය. එතැනින් එහාට තිබෙනවා කන්දකාඩු එළිමහන් සිරකඳවුර. ඒක පරිපාලනය කරන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. එහි රාජකාරිය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම. එතකොට එතැන අර මම කියපු යුද්ධ හමුදා පනතට අනුව 90% ක් රටේ යහපත සිද්ධ වෙනවා. නීතිය ක්‍රියාත්මක වෙනවා. මම කියන්නේ නැහැ සියයට සියයක් කියලා. ඒ අදාළ නිලධාරීන්, පරිපාලන නිලධාරීන සමග කටයුතු වෙනකොට ඒ ඒ සිද්ධි වෙන්න පුළුවන්. නමුත් 90% ක්, මේක මම පැහැදිලිව දැකලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කොහේවත් signal නැහැ. ඒ areas වල telephone වැඩ කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමරිකාව යටතේ පාලනය වෙනවා Guantemala සිරකඳවුර. එතකොට ලෝකයේ ඉන්න දරුණුම අපරාධකාරයෝ මේවායේ ඉන්නේ. ඔවුන්ව සමාජයෙන් වෙන් කරලා, සමාජයෙන් තනි කරලා, සමාජ සහසම්බන්ධකම් නැති කරලා තමයි ඔවුන්ට තැනකට ගාල් කරලා, කොටු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ වාගේ ක්‍රමවේදවලට අපට යන්නට පුළුවන්. මේ මරණ දඬුවම දුන්නා කියලා - මෙතුමා ප්‍රකාශ කළා වාගේ, ඇමරිකාවේ දියුණු ප්‍රාන්තවල මරණ දඬුවම දුන්නා කියලා කවදාත් සමාජ විරෝධී ක්‍රියාවන් නතර වෙලා නැහැ. ඒ නිසා ඒකත් එකක්. ඊළඟට අපේ මිනිසුන් තුළ පුරුෂාභිමානය කියලා එකක් තිබෙනවා. ලංකවේ බැලුවොත් මත්ද්‍රව්‍ය 95% ක් වැරැදිවලට සහ පරිහරණය පිළිබඳ ප්‍රශ්නවලදී ඒවාට සම්බන්ධ වෙලා ඉන්නේ පුරුෂයෝ. කාන්තාවන් නොවෙයි. පුරුෂයෝ. එහෙම නම් පුරුෂාභිමානය පිළිබඳ ප්‍රශ්නයක් මේ රටේ තිබෙනවා. සමාජයේ තිබෙනවා. පුරුෂාභිමානය පිළිබඳ ප්‍රශ්නයේදී මත්ද්‍රව්‍ය තුළින් එන උද්දීපනය. ඒ තුළ තිබෙන මානසිකත්වය. මේ පිළිබඳව අපි ඉතාමත් දීර්ඝ ලෙස සාකච්ඡා කරන්න ඕනෑ. රටක් විධියට කරීකා කරන්න ඕනෑ. ඒ තුළින් තමයි මේ ප්‍රශ්නය විසඳගන්න පුළුවන් ක්‍රමවේදවලට අපට යන්නට පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම පාසල.

විශේෂයෙන්ම අපේ ආගමික ශාස්තෘවරු. විශේෂයෙන්ම අපේ හාමුදුරුවන් වහන්සේලා. අපේ පල්ලිවල ඉන්න ස්වාමිලා. වැඩිහිටි සමාජය මේ ප්‍රශ්නයෙන් මිදෙන බවක් පේනවා. අපි ඉතිහාසයේ ඉඳලා බලනකොට උදාහරණයකට නෙදර්ලන්තය ගනිමු. නෙදර්ලන්තය කියන්නේ ලෝකයේ රටවල්වලින් මත්ද්‍රව්‍ය ඉතාමත්ම අවම ලෙස භාවිතා වන රටක්. මත්ද්‍රව්‍ය අවම කර ගැනීමට ඔවුන් භාවිතා කරන ක්‍රමවේද මොනවාද? ඔවුන් තමන්ගේ ස්වදේශීය මත්ද්‍රව්‍ය වර්ග - උදාහරණයක් විධියට අපි සිංහල බෞද්ධයෝ. අපට විශාල සංස්කෘතියක් තිබෙනවා. අපි ආයුර්වේදයෙන් පෝෂණය වුණු මිනිස්සු. අපේ ආයුර්වේදය තුළ තිබෙනවා කංසා වගාව. ගංජා වගාව. එදා ඉතිහාසයේ මහ වැව් බැන්දේ, මහ ඉදි කිරීම් කළේ, අපේ මිනිස්සු උත්තේජනය ලබා ගත්තේ මම මේ මේකට එකඟතාවය පළ කරනවා නොවෙයි. කථා කරන්න ඕනෑ දේ කථා කරන්නට ඕනෑ. මේක විහිළුවක් නොවෙයි. එදා මම මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදිලා ඉන්න කොට මට හම්බ වුණා අවුරුදු 85 ක පිරිමියෙක්. විවාහ වෙලා ඉන්නේ අවුරුදු 37 ක කාන්තාවක් එක්ක. මම ඔහුව දැක්කාම නිකන් හොල්මන් වුණා. මම එතුමාගෙන් ඇහුවාම ඒ එතුමාගේ අටවැනි භාර්යාව. ඒ විතරක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඔව්. ඔහුගේ ප්‍රදේශය

[ගරු ප්‍රදීප් පෙරේරා]

බැලුවාම කුඹුරු යායක්. කුඹුරු යායම වගා කරලා තිබෙනවා. මහ ශක්තිවන්ත පුද්ගලයෙක්. මම මේ ගංජා කියන මත්ද්‍රව්‍ය නීතිගත කරන්නට උත්සාහ කරනවා නොවෙයි. නමුත් මේක ආයුර්වේදමය වශයෙන්, උත්තේජනමය වශයෙන් ඉතාමත් වටිනා දෙයක්. මම කියාගෙන ආවේ නෙදර්ලන්තය ගැන. නෙදර්ලන්තයේ හැම Coffee Shop එකකටම ගිහිල්ලා බැලුවොත් එහෙම ඕනෑම කෙනෙකුට ගංජා ග්‍රෑම් 50 ක් තමන් අත ඇති මුදලට මිලදී ගැනීමට පුළුවන් හැකියාව තිබෙනවා. රටේ නීතිය එතැනට ගෙනැල්ලා තිබෙනවා. කොකේන්, හෙරොයින් ඒ ආදී වශයෙන් තිබෙන මත්ද්‍රව්‍ය භාවිතාය ඉතාමත් අවම වෙලා තමන්ට අවශ්‍ය ඒ මානසික උත්තේජනය ලබා ගැනීමට අවශ්‍ය නම් ප්‍රසිද්ධියේ විකුණන්න තිබෙනවා. ඒ නිසා මේ වාගේ ක්‍රමවේදවලට අපි යන්නට ඕනෑ. මේ වාගේ මානසිකව අපි සූදානම් වෙන්නට ඕනෑ. මේවා කරගෙන යන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කරන්නට කටයුතු කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි රාත්‍රී සමාජ ශාලාවලට යනවා. එහෙම යන්නේ මේ ආතල් ගන්න, අපේ තිබෙන මදාවිකම්වලට නොවෙයි. මේ සමාජයේ මොකක්ද වෙන්නේ කියන එක නිරීක්ෂණය කරන්න, බලන්න කියන්න අපි යනවා. අපි ගිහිල්ලා බැලුවොත් මේ රටේ ඉන්න ප්‍රබලම දේශපාලඥයන්ගේ පුත්තු, ප්‍රබලම ව්‍යාපාරිකයන්ගේ පුත්තු, ප්‍රබලම ආරක්ෂක සංවිධානවල ජ්‍යෙෂ්ඨ නිලධාරීවරුන්ගේ දරුවෝ තමයි මේවායේ රෑ එළිවෙනකල් මත්ද්‍රව්‍යයත් එක්ක තමන්ගේ ජීවන කාර්ය පරිහරණය කර ගන්නේ. ඒ නිසා මේවා පිටිපස්සේ ඉන්නේ වෙන කවුරුවත් නොවෙයි, දැන් මම අහගෙන හිටියා. මම ඒ කථාව පිළිගන්නවා. මම ආරක්ෂක ලේකම්තුමාගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කරපු කෙනා. මම දන්නවා. ඇත්තටම පාර්ලිමේන්තුවේ ආරක්ෂක උපදේශක කාරක සභාවේ උපදේශක කාරක සභිකයෙක් විධියට පත් කළා ඔය කියන පුද්ගලයාව. ඇත්ත. ඒ නිසා අපි පක්ෂ පාට භේදයකින් තොරව -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ඇයි දුමින්ද සිල්වා හිටපු මන්ත්‍රීතුමා. ආරක්ෂක අධීක්ෂණ මන්ත්‍රීවරයා වශයෙන් පත් කළා. ඒක පිළිගන්න. ඒක රටම දන්න දෙයක්. මේ පළාත් සභාව තුළ ඉන්නවා කුඩුකාරයෝ. මේ පළාත් සභාව තුළ ඉන්නවා කුඩු ව්‍යාපාරිකයෝ. මේ පළාත් සභාව තුළ ඉන්නවා කුඩු බිස්නස්වලට අනුබල දෙන මිනිස්සු.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නිලධාරීන්ද?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

නිලධාරීන් නොවෙයි. දේශපාලඥයෝ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නම් කියන්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

නම් කියන්න මට උවමනාවක් නැහැ. තමන්ගේ හදවතට තට්ටු කරලා බලන්න. මිනිස්සු දන්නවා කවුද කියලා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

දන්නවා නම් රජයට කියන්න කෝ?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ඔව්. අපට කියන්න පුළුවන්. මට තමුන්නාන්සේලා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා මේ පළාත් සභාවේ ඔක්කෝම කිව්වාම අපිත් අයිති වෙනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

නැහැ, නැහැ. තමුන්නාන්සේලා නොවෙයි. පළාත් සභාවේ බහුතරයක් ඉන්නවා. ගොඩක් ඉන්නවා. පළාත් සභාවේ ගොඩක් ඉන්නවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කරුණාකරලා නම් කියන්න.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

ගොඩක් ඉන්නවා. කුඩුවලට සම්බන්ධ මිනිස්සු පළාත් සභාවේ ගොඩක් ඉන්නවා. අපි බය නැහැ කථා කරන්න. ඒ නිසා මම මතක් කරලා දෙනවා. අද ශ්‍රම බලකාය -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද හේතුව එතුමා සද්භාවයෙන් ඒ ප්‍රකාශ කරන්නේ. නමුත් හෙට Media වල මේක ප්‍රමුඛ පණිවිඩයක් බවට පත් වෙනවා. අපි අපහසුතාවයකට පත් වෙනවා.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මම මේ ප්‍රකාශය කළේ, මේ බස්නාහිර පළාත් සභාව පමණක් නොවෙයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා මේ කරපු ප්‍රකාශය ගැන ප්‍රශ්න කරනවා. දැන් කැබිනට් මණ්ඩලය තුළ තමයි මේ කුඩුකාරයෝ ඉන්නේ. පාර්ලිමේන්තුවේ තමයි කුඩුකාරයෝ ඉන්නේ කියනකොට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ සම්බන්ධයෙන් කවුරුත් වරප්‍රසාද ප්‍රශ්න මතු කරන්නේ නැහැ. එතකොට ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක වෙනම එකක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මේ කථා කරන්නේ පළාත් සභාවේ වරප්‍රසාදයක් මතු කරන්න පුළුවන් අපේ වරප්‍රසාද සම්බන්ධයෙන් විතරයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද මතු කරන්නේ නැහැ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. තමන්ගේ වරප්‍රසාද සම්බන්ධයෙන් විතරයි කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක මාධ්‍යයේ වුණත් නිවැරදි වෙන්න පුළුවන්. මේ පළාත් සභාවේ කවුරු හරි ඉන්නවා කියලා දැනගෙන කිව්ව බවක් නොවෙයි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මම දන්නේ නැහැ. මගේ පෞද්ගලික මතය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා සැකයට හිතලා -

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

මම දන්න දේ මම කිව්වේ. මම දන්නේ නැහැ ඔබතුමන්ලා මොනවා කරනවාද කියන එක මට අදාළ නැහැ. මම නිර්භවය ප්‍රකාශ කරනවා සමස්ත රටේ තිබෙන - බස්නාහිර පළාත් සභාව ගැන නොවෙයි මම කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආ ... බස්නාහිර පළාත් සභාව ගැන නොවෙයි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

සමස්ත පළාත් සභාවල. සමස්ත පළාත් සභාවල ඉන්න මන්ත්‍රීවරු මේකට තමන්ගේ නිල බලය, තමන්ගේ දේශපාලන බලය භාවිතා කරනවා කියන එකයි මම මේ කියන්න උත්සාහ කළේ. ඉතින් ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පළාත් සභා විතරමද?

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

පළාත් සභා විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේත් එහෙමයි. මම කිව්වේ රටේ ඉන්න ඉහළ දේශපාලනය, රටේ ඉහළ පරිපාලනය, ප්‍රාදේශීය සභා, නගර සභා සියලු දෙනා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රටේ දේශපාලන පද්ධතිය කිව්වාම හරි.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

දේශපාලන පද්ධතිය තුළ. ඒ නිසා මට කියන්න තිබෙන්නේ මෙපමණයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මරණ දණ්ඩනය කියන එක මම හිතන්නේ නැහැ අතිගරු ජනාධිපතිතුමා හෝ වෙනත් බලවේගයකට හෝ කාටවත් මේක අයිති කරගන්න පුළුවන්කමක් තිබෙනවා කියලා. මිනිහෙක් මරන්න තිබෙන අයිතිය. ඒ නිසා මේවා නොවෙන්නට, මේ සමාජයේ මේ තත්ත්වය ඇති නොවෙන්නට, මේ රටේ පවතින ඕනෑම ආණ්ඩුවක් අද සිට ක්‍රියාත්මක වෙනවා නම් ඉදිරියට යම්කිසි කාල වකවානුවකට ජාතික ප්‍රතිපත්තියක් විධියට, මේක වළක්වා ගන්නා වූ ක්‍රමවේදය පිළිබඳව, එහෙම නැත්නම් මිනීමැරුම් අවම කර ගන්නා වූ ක්‍රමවේදය පිළිබඳ කටයුතු කරන්නට සමාජ මානසික මට්ටම වෙනස් කර ගන්නට පුළුවන් ක්‍රමවේදයන් සකස් කර ගන්නවා නම් වඩා උචිතයි කියලා යෝජනා කරනවා. විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ මගේ පෞද්ගලික මතයි මම ප්‍රකාශ කළේ. මගේ පෞද්ගලික මතයේදී මට පුද්ගලයෝ අදාළ නැහැ. පක්ෂ පාට අදාළත් නැහැ. මම ස්වාධීන කෙනෙක්. මම ජනතාව නියෝජනය කරන දේශපාලඥයෙක්. ඒ නිසා එය මගේ පෞද්ගලික මතයක් කියලා ප්‍රකාශ කරමින් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 02.03]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම රීති අත්හිටුවමින් මෙවැනි යෝජනාවක් ගෙන එන්න මම අදහස් කළේ කාලීන වශයෙන් පැන නඟී තිබෙන මේ මාතෘකාව පිළිබඳව විවෘත සාකච්ඡාවක්, සංවාදයක් ඇති කර ගැනීමත්, ඒ වාගේම අද අපි මුහුණ දීලා තිබෙන මත් උවදුරේ පරිමාව සහ මෙයින් ඇති කරලා තිබෙන සමාජ ව්‍යසනයේ තරම මම හිතන්නේ අපි තේරුම් ගැනීමක් අවශ්‍යයි. ඒ පිළිබඳව මේ සභාව තුළ ඉතාම වැදගත් අදහස්, යෝජනා සහ මේ තත්ත්වයේ තිබෙන පැති මානයන් පිළිබඳව සැලකිය යුතු කැරුණු ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. මගේ මූලික තර්කය මම ඉදිරිපත් කළේ රටේ ව්‍යවස්ථාපිත බලය අනුව ජනාධිපතිවරයාට පැවරී තිබෙන ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ තිබෙන අයිතිය. මේක මේ අමුතුවෙන් මම මරණීය දණ්ඩනය ඉල්ලන එකක් නොවෙයි. ඒක නිසයි මම කිව්වේ මේකෙන් අදහස් කරන්න පුළුවන් මේ අමානුෂික යෝජනාවක් ගෙන්න හදනවා. අපි නිකන් මහා මුග්ධ, ඒ වාගේම දුෂ්ට ඒ වාගේම කිසිම ආකාරයක මෛත්‍රීයක්, කරුණාවක්, දයාවක් නැති අලුගෝසුවෝ පිරිසක් විධියට හංවඩු ගහන්න උත්සාහ කරන්න පුළුවන් මෙවැනි යෝජනාවක් තුළින්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අලුගෝසුවෙක් හොයාගන්න බැරුව ඉන්න වෙලාවක්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් මේ තිබෙන ප්‍රශ්නයේ පරිමාව දෙස බැලුවාම මම දැක්කා ඊයේ දිනයේ ස්වෙච්ඡාවෙන්ම විශාල පිරිසක් ඉදිරිපත් වෙමින් ඉන්නවා මේ කාර්ය කරන්න. කාන්තාවකුත් ඉදිරිපත් වෙලා තිබෙනවා. කාන්තාවෝ සහ දරුවෝ තමයි වැඩියෙන්ම මේකෙන් බැට කාලා තිබෙන්නේ. තමන්ගේ පිරිමි, එහෙම නැත්නම් ස්වාමි පුරුෂයා, එහෙම නැත්නම් තමන්ගේ තරුණ දරුවෝ මේ ඛේදවාචකයට ලක් වෙලා ඔවුන්ගේ ජීවිත විනාශ වන ආකාරය දැකලා හැඬූ කඳුලින් ඉන්න දෙමාපියෝ අද ඉදිරිපත් වෙනවා මේක ක්‍රියාත්මක කිරීම සඳහා ස්වෙච්ඡාවෙන් අපි එන්නම් කියලා. මම මේ තර්කය ගොඩ

නඟන්නේ රටේ ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට හිමි වෙලා තිබෙන නීතියක් පිළිබඳවයි. රටේ දණ්ඩ නීති සංග්‍රහයේ තිබෙන එකක්. දැන් අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා නම් නිතරම කියනවා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිපූර්ණ වශයෙන් බලාත්මක කරන්න ව්‍යවස්ථාවේ තිබෙන විධියට කියලා. ඒක ක්‍රියාත්මක කරන්න කියලා එතුමා නිතර හඬ නඟනවා. හැබැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම රටේ ජනාධිපතිවරයාට විධායක බලතල යටතේ පැවරී තිබෙන එකත් ක්‍රියාත්මක කරන්න ගියාම ඒක අමානුෂිකයි. ඒක අශීලාචාරයි. ඒක අශෝභනයි. අවලස්සනයි. හැබැයි අගමැතිතුමාගේ අතේ ඔය බලය තිබුණා නම් ඔය කවුරුවත් කථා කරන්න එන එකක් නැහැ. මොකද, අගමැතිතුමා ඔය වාගේ ඒවා බොහෝ වෙලාවට කරන්න කැමැති නැහැ.

හැබැයි ප්‍රශ්නය මේ සම්මුති ලෝකයයි, පරමාර්ථ ලෝකයයි එහෙම නැත්නම් සම්මුති සත්‍යයි, පරමාර්ථ සත්‍යයි පටලවාගෙන තිබෙනවා. අපි මේ ජීවත් වෙන්නේ සම්මුති ලෝකය ඇතුළේ. සම්මුති ලෝකය ඇතුළේ අපි හදා ගත්තු නීතිරීති තිබෙනවා. ඒ නීතිරීති අනුව තමයි අපි කටයුතු කරන්න ඕනෑ. බුදු හාමුදුරුවෝත් කොතැනකවත් රාජ නීතිය අභියෝගයට ලක් කරලා නැහැ, බුද්ධ නීතියෙන්. රාජ නීතියත් යටත් වුණා බුද්ධ නීතියට. මම හිතන්නේ අනෙක් පැත්තට කියවෙන්න ඕනෑ නේද? බුද්ධ නීතියත් යටත් වුණා රාජ නීතියට. බුදු හාමුදුරුවෝ කොතැනකවත් කිව්වේ නැහැ ඒක අභියෝග කරන්න කියලා. ඒ නිසා පැහැදිලිවම මම කියන්න ඕනෑ. මේ අපි කථා කරන සම්මුති ලෝකය හදා ගත්තු, මේ සභාව ඇතුළේ හදාගත්තු නීතිරීති ටිකක් තිබෙනවා. මෙතැන ඉන්න සභාපතිවරයාට බලයක් පවරලා තිබෙනවා. ඇමැතිවරුන්ට බලතල පවරා තිබෙනවා. සභානායක, අනෙකුත් සංවිධායකවරු හැම කෙනාටම යම් බලයක් පවරා තිබෙනවා. ඇයි එලෙස බලයක් පවරා තිබෙන්නේ. ඒවා ක්‍රියාත්මක කරන්න. සමහර අයට නිශේධ බලය ලැබිලා තිබෙනවා. එහෙම නම් රටක් පාලනය කරගෙන යැමේදී මෙන්න මේ කියන සම්මුතික ලෝකය ඇතුළේ, සම්මුතික සත්‍ය ඇතුළේ අපට වැඩ කරන්න සිද්ධ වෙනවා. ඒකට තමයි මානව ඉතිහාසය පුරාම දණ්ඩනය කියන එක - හිරගෙවල් හැදුණේ මොකටද? නීතිය හැදුණේ මොකටද? පොලීසිය හැදුණේ මොකටද? කස පහර දෙන්නේ මොකටද? අපේ රාජාණ්ඩු ක්‍රමය ඇතුළේ බෙල්ල කපලා මරලා තිබෙනවා. දියේ ගිල්වලා තිබෙනවා. දඬු කඳේ ගහලා තිබෙනවා. ඉතින් මේවා ඔක්කෝම ගත්තාම ශීලාචාර නැහැ නේ? වංගෙඩියේ දාලා කොටන එකත් හොඳ නැහැ. ඒ වාගේම පුවක් ගහේ කකුල් දෙක බැඳලා ඉරන එකක් හොඳ නැහැ. කියතෙන් ඉරන එකත් හොඳ නැහැ. වැඩවසම් යුගයේ ඒවා නැති වුණාට දැන් එහෙම නම් ඊට වඩා ශීලාචාර ක්‍රමයක් ඇතුළේ තමයි, මිනිස්සුන්ට පේන්න නොවෙයි නේ මේ මරන්නේ. අන්න ඒවා අරාබිය ඇතුළු ලෝකයේ සමහර රටවල කරනවා. ප්‍රසිද්ධියේ එල්ලලා මරනවා. කස පහර ගහනවා. ගල් ගහනවා. ඒවාත් දණ්ඩන ක්‍රම තමයි. රටක් ශීලාචාර කරගන්න, රටක නීතිය පවත්වා ගන්න, ඒ වාගේම ඒ රටේ තිබෙන සාදාචාර විරෝධී ක්‍රියා පාලනය කරන්න, අපරාධකරුවන්ට, ස්ත්‍රී දූෂකයන්ට, මිනීමරුවන්ට ගල් ගහලා මරනවා.

ඇයි මේවා කරන්නේ? ලෝකයේ හදාගත්තු නීති. ඒ නිසා ලෝකයට එක නීතියක්, එක සම්මුතියක් තිබෙනවා කියලා යන්නේ නැහැ. යුරෝපයට එකක් තිබෙන්න පුළුවන්. ආරාබියේ තව එකක් තිබෙන්න පුළුවන්. අප්‍රිකාවේ තව එකක් තිබෙන්න පුළුවන්. ඒ රටවල්වලට ආවේණික නීති පද්ධති හදාගෙන තිබෙනවා. අපි ඔය විධියට කථා කරනවා නම්, ඒක හොඳ නැත්නම් අපට ඊළඟට යෝජනා කරන්න පුළුවන් එහෙම නම් විදුලි පුටුව. මේක මේ බෙල්ලට දාලා එල්ලුම් ගහේ එල්ලන එක සුදුසු නැත්නම් විදුලි පුටුව හදන්න පුළුවන් නේ? මේක ඊට වඩා සුමට කරන්න. ඒ නිසා මේ ගැන තර්ක විතර්කවලට ගියොත් මේවායේ පදනමක් නැහැයි කියන එක පේනවා.

ඒක නිසා පළමුවෙන්ම මගේ තර්කය මම කිව්වේ මේ රටේ තිබෙන නීතියක් බලාත්මක කරන්න. ක්‍රියාත්මක කරන්න. ඒකයි මේ කියන්නේ. ඒක අභියෝගයට ලක් කරනවා නම් අපි ජාත්‍යන්තර සම්මුතිවලට අත්සන් කරලා තිබෙනවා. යුරෝපා සංගමයෙන් අපට ඇවිල්ලා කියනවා නම් මේක කරන්න එපා කියලා, අපේ රටේ දේශපාලන ස්වෛරීත්වයටයි මේ අභියෝග කරන්නේ. ජනාධිපතිවරයාගේ අයිතියත්, කැබිනට් මණ්ඩලයත් එක්ක එකතු වෙලා ගත්තු තීරණයක් මේ අභියෝගයට ලක් කරන්නේ. එහෙම කරන්න පුළුවන්ද? රටේ මුදල් ඇමැතිවරයාට වෙන්න පුළුවන්. මානව හිමිකම් කොමිෂන් සභාවේ - ඒ අයට තමන්ගේ අදහස් යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි තීරණයක් ඒ විධියට අභියෝග කරන්න පුළුවන්කමක් නැහැ, යුරෝපා සංගමයට. යුරෝපා කොමිසමට. ජිනීවා මානව හිමිකම් කොමිසමට එහෙම

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

කරන්න අයිතියක් නැහැ. ඒකෙන් අභියෝගයට ලක් කරන්නේ අපේ රටේ නීතියේ ස්වෛරීත්වයයි. අපේ රටේ දේශපාලන ස්වෛරීත්වයයි මේ අභියෝගයට ලක් කරන්නේ.

ඊළඟට අපට පෙන්වනවා වෙන විධියට බලපෑම්. GSP Plus සහනය කපනවා. ඊළඟට අපට වෙන වෙන ආකාරයෙන් තිබෙන සහන කපනවා කියලා බලපෑම් කරනවා. මේක තුළ යම්කිසි ආකාරයක පීඩනයක් ඇති කරනවා. බලපෑමක් ඇති කරනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි මේ යෝජනාව පිටුපස්සේ පැහැදිලිව මම කියන්න ඕනෑ ජාතික හෙළ උරුමය විධියට මේ අපේ අදහස්. මම හොඳ බෞද්ධයෙක්. බෞද්ධ දර්ශනය, බෞද්ධ වත්පිළිවෙත් පිළිබඳව අපට අදහස් තිබෙනවා. කරුණාව, මෛත්‍රිය මොකක්ද කියන එක අපි දන්නවා. හැබැයි ඒ වාගේම අපි කියන්න ඕනෑ. එකක් තමයි බක ජාතකය කියවලා ඇති. බක ජාතකයේ මාලුවෝ ටික ඔක්කෝම අරගෙන යනකොට ඇවිල්ලා කොකා - අහගන්න යන්නේ නැතුවා. කොකා ඇවිල්ලා විලේ ඉන්න මාලුවෝ එක එකා, එක එකා අරගෙන යනකොට අන්තිම කුකුළුවා ඇවිල්ලා කොකාගේ බෙල්ල කඩනවා. එතකොට බෝධිසත්වයෝ මොකද කරන්නේ? සාධුකාර දෙනවා. සාධුකාර දීලා කියනවා අර කොකාගේ බෙල්ල කඩපු, ඒ කකුළුවා වෙනුවෙන් සාධුකාර දෙනවා. ඒකයි, මේ රටේ බහුතරයක් ජනතාව වෙනුවෙන් ගත යුතු තීරණය ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි සාධුකාර දෙන්න ඕනෑ. මේ රටේ දෙකෝටි විසි ලක්ෂයක් ජනතාව ගැන හිතන්න ඕනෑ. සිරිකරුවන්ගේ අයිතිවාසිකම්වලට වඩා වැඩියෙන්. මමත් හරි කැමැතිය බන්ධනාගාර පරිපාලනය හරියට සිද්ධ වෙනවා නම්. ඒක තමයි කරන්න ඕනෑ. ඒක හරියට සිදු නොවීමේ තිබෙන ගැටළුව. ඒ නිසා අවසාන වශයෙන් අපේ ප්‍රදීප් පෙරේරා ගරු මන්ත්‍රීතුමා නෙදර්ලන්තයේ Amesterdam ගැන කිව්වා. නෙදර්ලන්තයේ Amesterdam වල ගොඩක් දේවල් Legalise කරලා තිබෙන්නේ. කොකේනුත් Legalise කරලා තිබෙනවා. හෙරොයිනුත් Legalise කරලා තිබෙනවා. ගංජාත් Legalize කරලා තිබෙනවා. මරිජුවානාත් Legalise කරලා තිබෙනවා. ඔය ඕන එකක් ගන්න පුළුවන්.

**ගරු ප්‍රදීප් පෙරේරා**
Hon. Pradeep Perera

භාවිතය අඩුයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හැබැයි ඉතින් මුළු යුරෝපයේම කට්ටිය හවසට එතැනිට ඇදිලා එනවා. මුළු යුරෝපයම එතැනට එනවා ඒවා බොන්න. තව තව දේවල් නීත්‍යානුකූල කරලා තිබෙන්නේ. ගණිකා වෘත්තියත් නීතිගත කරලා තිබෙන්නේ. Red White Sprite තිබෙනවා. ඉතින් ඔබතුමා ගිහිල්ලා තිබෙනවාද මම දන්නේ නැහැ. ඉතින් -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒකට කැමැතියිලු.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒකයි මේකයි දෙකක්. ඒකයි මේ කථා කරන මත්කුඩු ජාවාරමයි, අපරාධයි මේ දෙකක්. ඒවා Legalise කරනවාද නැද්ද කියන එක ගැන වෙනම සාකච්ඡාවක්, සංවාදයක් ඇති කරමු. අපි කියන්නේ මේ අපරාධ මැඩ පවත්වන්න ඕනෑ. මහ පරිමාණයෙන් මත්කුඩු එනවා. ඒ නිසා මම කියන්න කැමැතිය පසුගිය අවුරුදු කිහිපය ඇතුළත මේ රටේ අපරාධවල අඩුවීමක් තිබෙනවා. 2013 මේ රටේ අපරාධ සංඛ්‍යාව ගණනය කරලා බැලුවාම 55,267 ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ සංඛ්‍යාව 2017 අරගෙන බැලුවා 33,236 ට බැහැලා තිබෙනවා. එහෙම නම් මේකේ පැහැදිලි අඩුවීමක් තිබෙනවා. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ මාධ්‍ය පුළුල් වෙලා තිබෙනවා. මාධ්‍ය ලෝකය පුළුල් වෙලා තිබෙනවා. මාධ්‍ය ලෝකය පුළුවල් වීම නිසා මාධ්‍ය තුළින් මේ ප්‍රවෘත්ති වාර්තා කිරීම පුළුල් වෙලා තිබෙනවා. වැඩි වැඩියෙන් නැවත නැවත මේ ප්‍රවෘත්තිය වාර්තා වීම තුළ අනේ මේ රට ඇතුළේ විශාල වශයෙන් අපරාධ වැඩි වෙලා කියලා පේන්න පටන් අරගෙන තිබෙනවා. නමුත් අද මත්ද්‍රව්‍ය අල්ලන ප්‍රමාණය වැඩියි. ඒකට දේශපාලන බලපෑම් නැහැ. දේශපාලන අතපෙවීම් නැහැ. දේශපාලන අනුග්‍රහයක් නැහැ. ඔවුන් ආරක්ෂා කරන්න යන්නේ නැහැ. ඒකයි තිබෙන වෙනස. පසුගිය කාලයේ හිටපු පාලනය යටතේ ගිහිල්ලා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මුදල් ඇමැතිතුමාගේ ලේකම්වරයෙක් අහු වුණේ කොහොමද?

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගත්තා. ඒකයි ඒකේ වෙනස.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මේ මත්කුඩු මේ රටට එන ඒවා අල්ලන්න අපේ ආරක්ෂක හමුදාවලට, මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශවලට ඒ වාගේම අනෙක් පැත්තෙන් තිබෙන විශේෂ කාර්ය බලකායට අද ඒ නිදහස ලැබිලා තිබෙනවා. ඒකයි මේකේ තිබෙන වෙනස. ඒ නිසා අද අපි කියන්නේ මේ නීතිය ක්‍රියාත්මක වන මොහොතක -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මහින්ද රාජපක්ෂ පාලන කාලයේ කුඩු පැකට් එක රුපියල් 3000 ට ගියා බඩු නැතුව. අද රුපියල් 1000 ටත් තිබෙනවා. ඒක තමයි වෙනස. සැපයි. සතුටුයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

බලපෑමකට යට විය යුතු නැහැ. ඒ සම්බන්ධයෙන් නීති -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ යහපාලනයේ බඩු ලාභ කරලා තිබෙනවා. එදා කුඩු පැකට් එක රුපියල් 3000 යි. අද රුපියල් 1000 ටත් පල්ලෙහා බැහැලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ සාකච්ඡාවට, සංවාදයට, මේ යෝජනාවට එකතු වුණු සියලු දෙනාටම මගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ ආණ්ඩුවෙන් ලාභ වෙලා තිබෙන්නේ කුඩු විතරයි. යහපාලනයෙන්. දෙයියන්ගේ පිහිටයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව සම්බන්ධයෙන් එකඟයි.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

නැහැ. විරුද්ධයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විරුද්ධයි.

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.16 ට, 2018 අගෝස්තු මස 07 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.07 p.m till 9.30 a.m. on 07.08.2018*